
# රණවිරුවා

2023 නොවැම්බර් • 260 කලාපය



## දෙස සුරැකි
## දිරිය දියණිවරු නමට
## අභිමානයේ ස්ථම්භයක්

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ





# ලෝක පොපි දිනය සමරා දිවිපිදු විරුවන් සිහි කෙරේ

යුද සංග්‍රාමවලින් දිවිපිදූ රණවිරුවන්ගේ සැමරුම් දිනය හෙවත් ලෝක පොපි දිනය සෑම වසරකම නොවැම්බර් මස 11 දිනට යෙදී ඇත. ඊට සමගාමීව ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය විසින් සංවිධානය කරන ලද සැමරුම් උත්සවයක් සන්නද්ධ හමුදා සේනාධිනායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය නොවැම්බර් මස 11 වන දින කොළඹ විහාර මහා දේවි උද්‍යානයේ රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණි.





එහිදී, රණවිරුවන් වෙත ගෞරවාචාර පුදකිරීම සඳහා පූජ්‍ය පක්ෂය, දිවිපිදූ රණවිරුවන්ගේ කාලත්‍රයන් සහ ඥාතීන්, අමාත්‍යවරු, අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට්, මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝස්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන්, ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.

පළමු ලෝක යුද්ධය අවසන් වීමෙන් පසු සියලුම පොදුරාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් යුද්ධයේදී දිවිපිදූ ත්‍රිවිධ හමුදාවේ වීරෝදාර රණවිරුවන් හට ගෞරව දැක්වීම සඳහා සෑම වසරකම මෙම පොපි දිනය සමරනු ලබයි.

# ජාතික ආරක්ෂක විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය



ජාතික ආරක්ෂක විද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ දෙවන ශිෂ්‍ය නිලධාරී කණ්ඩායමේ උපාධි ප්‍රධානෝත්සවය පසුගිය නොවැම්බර් මස 21 වන දින අත්තිඩිය, 'Eagle Lakeside' උත්සව ශාලාවේදී ජනාධිපති සහ සන්නද්ධ හමුදා සේනාධිනායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, එහිදී එම ශිෂ්‍ය නිලධාරීන් වෙත "එන්ඩීසී" උපාධිය ප්‍රදානය කරනු ලැබීය.

මෙම උත්සව අවස්ථාව සඳහා ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක සහ ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු, පොලිස්පති ඇතුළු ජ්‍යේෂ්ඨ නිලධාරීන් මෙන්ම තවත් සම්භාවනීය අමුත්තන් රැසක් ද එක්ව සිටියහ.

මෙම උත්සවය අතරතුරදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යේෂ්ඨ නිලධාරීවරු 15 දෙනෙක්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ කොමඩෝරු නිලයේ ජ්‍යේෂ්ඨ නිලධාරීවරු 08 දෙනෙක්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එයාර් කොමඩෝරු නිලයේ ජ්‍යේෂ්ඨ නිලධාරීවරු 07 දෙනෙක් සහ ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරීවරු 06 දෙනෙක්ගෙන් සමන්විත ශිෂ්‍ය නිලධාරීවරු 36 දෙනෙක් සඳහා "ජාතික ආරක්ෂාව සහ උපායමාර්ගික අධ්‍යයනය" (NS&SS) පිළිබඳ "එන්ඩීසී" පශ්චාත් උපාධිය පිරිනමනු ලැබුහ.





ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා (විශ්‍රාමික) විසින් උපාධිධාරීන්ගේ ලියාපදිංචි කිරීමේ පොත අනුමත කරන ලද අතර, ඉන් අනතුරුව 'NDC Year Book' ග්‍රන්ථය එළිදැක්වීම ද සිදුකෙරිණි.

උත්සව අවස්ථාවේදී, අතිගරු ජනාධිපතිතුමන් විසින් රැස්ව සිටි පිරිස අාමන්ත්‍රණය කරමින් උපාධිධාරීන් වෙනුවෙන් සිය සුබපැතුම් පිරිනැමීය. උත්සවය සමාප්තියේදී, ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායකගේ සුරතින් ජනාධිපතිතුමන් වෙත විශේෂ සමරු තිළිණයක් ද ප්‍රදානය කරනු ලැබීය.

නිලධාරීන් සතු බුද්ධිමය දැනුම වැඩිදියුණු කිරීම සහ උපායමාර්ගික මට්ටමේ නායකයින් ලෙස ඵලදායී තීරණ ගැනීමේ හැකියාව සඳහා දැනුම ලබාදීම මඟින් නව ආරක්ෂක අභියෝගවලට මුහුණ දෙමින් ජාතික ආරක්ෂාව සඳහා අන්තර් ආයතනික සහ සිවිල් - හමුදා සහයෝගීතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම උපාධි පාඨමාලාව පැවැත්විණ.






# ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙලේ සමස්ත ශූරතාවය යුද්ධ හමුදාවට

ආරක්ෂක සේවා ක්‍රීඩා උත්සවයේ ශූරතා ප්‍රදානය කිරීම සහ එහි 12 වන සංස්කරණයේ සමාප්ති උත්සවය ඉකුත් නොවැම්බර් 24 වන දින සුගතදාස ක්‍රීඩාංගණයේදී ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු ප්‍රමුඛ ගෞරවණීය ආරාධිතයින් රැසක් සහභාගී වූහ.

2022 හා 2023 වසර සඳහා වන 12 වන ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙලේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ රන් පදක්කම් 147 ක්, රිදී පදක්කම් 144 ක් සහ ලෝකඩ පදක්කම් 112 ක් දිනාගැනීමට සමත්වූහ. ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙලේ අනුශූරතාවය ශ්‍රී ලංකා ගුවන් හමුදාවටත් දෙවන අනුශූරතාවය ශ්‍රී ලංකා නාවික හමුදාවටත් හිමිවිය.













# ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන් කාන්තා බලකායේ හා ආසේමු (බටහිර) හටපිරිස් අමතයි

ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන් ඉකුත් නොවැම්බර් මස 27 වන දින බොරැල්ලෙහි ස්ථාපිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී කාන්තා සෙබළියන් හමුවී සුහද පිළිසඳරක නිරත වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී සහ එම බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ජේකේආර් ජයකොඩි ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි අමාත්‍යතුමන් වෙත කාන්තා සෙබළියෝ හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය පුද කරනු ලැබූහ.

එහිදී, අමාත්‍යතුමන් හටපිරිස් ආමන්ත්‍රණය කරමින් රට වෙනුවෙන් දිවිපිදූ සියලුම යුද්ධ හමුදා සාමාජිකාවන් පිළිබඳ සිහිපත් කළේය. එමෙන්ම, වර්ෂ 2009 මැයි මාසයට ප්‍රථම සේවයට බැඳුනු කාන්තා නිලධාරිනියන් විශ්‍රාම ගන්වන වයස අවුරුදු 55 දක්වා දීර්ඝ කිරීම සහ ඒ අනුව යුද්ධ හමුදා නිලධාරීන්ට සමානව උසස්වීම් ලබාදීම ඇතුළු තවත් වැදගත් කරුණු කිහිපයක් පිළිබඳ සඳහන් කළේය. එසේම, කාන්තා සෙබළියන් වෙනුවෙන් වෘත්තීය පුහුණු අවස්ථා ලබාදීම මෙන්ම විශ්‍රාම ගන්වන වයස් සීමාව වසර 22 ක් දක්වා දීර්ඝ කරන බව ද එතුමන් වැඩිදුරටත් පැවසීය. යුද්ධ හමුදා කාන්තා බලකායේ සාමාජිකාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා මෙම අවස්ථාව ලබාදීම වෙනුවෙන් අමාත්‍යතුමන් යුද්ධ හමුදාධිපති වෙත ද සිය කෘතඥතාව පුද කළේය.

තවද, ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන් එදිනම පනාගොඩ ස්ථාපිත ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ සේවයේ නියුතු නිලධාරීන් ද හමුවූහ. එම මූලස්ථාන පරිශ්‍රය වෙත සපැමිණි අමාත්‍යතුමන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබූ අතර, එහිදී ද එතුමන් වෙත හටපිරිස් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය ද පුද කරනු ලැබූහ. සිය සංචාරයේදී හටපිරිස් අමතමින් සේවයේ නියුතු රණවිරුවන්ගේ කාර්යභාරය ඇගයීමට ලක්කළ අමාත්‍යතුමන් රජයේ මැදිහත්වීමෙන් යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සුබසාධන පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව ද ප්‍රකාශ කළේය.







# 33 වසක අභිමානය සමරන

## ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ 33 වන සංවත්සරය ඉකුත් නොවැම්බර් 01 වන දිනට යෙදී තිබුණි. කුරුණෑගල, හෙරලියාවල පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු පරිශ්‍රයේදී අභිමානවත්ව පැවති එම සංවත්සර උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.



හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය ලැබූ හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපතිව මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ජී කීර්තිරත්න ආර්එස්පී කේඑස්පී පීඑස්සී විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය.

එහිදී, එම රෙජිමේන්තු පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ නව සරඹ භූමිය යුද්ධ හමුදාධිපති ගේ සුරතින් නිරාවරණය කෙරුණු අතර, ඉන් අනතුරුව එතුමන් වෙත හමුදා සම්ප්‍රදායානුකූල සම්මාන පෙළපාළියේ ගෞරවාචාරයද පුදකරනු ලැබීය.



එසේම, කඳවුරු පරිශ්‍රයෙහි අභිනවයෙන් ඉදිකරන ලද ක්‍රීඩා සංකීර්ණය හටපිරිස් වෙත පවරාදුන් යුද්ධ හමුදාධිපති පසුව එය නිරීක්ෂණය කිරීමටද එක්විය. එහිදී, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ක්‍රීඩකයෝ කරාතේ සහ ජූඩෝ සංදර්ශනයක් ඉදිරිපත් කිරීමටද කටයුතු කළහ.

එම අවස්ථාව සඳහා යුද්ධ හමුදා විධායක ජෙනරාල්, යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික, යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් ද සහභාගී වූහ.



**30** වසරක් පුරා පැවති ඊලාම් ත්‍රස්තවාදයේ ආරම්භක අවධිය වූ 1980 දශකය තුළදී තර්ජිත මායිම් ගම්මානවල වෙසෙන සිවිල් ජනතාවගේ ආරක්‍ෂාව සඳහා සහ ආර්ථික මර්මස්ථාන මෙන්ම ප්‍රභූ ආරක්‍ෂක රාජකාරීන් සැපයීමේ අවශ්‍යතාවය තදින් මතුවිය. එය මුල්කර ගනිමින්, එවකට ප්‍රභූ ආරක්‍ෂක මුර රාජකාරීන් සඳහා යොදවා සිටි, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායට අයත් නිලධාරීන් 110 ක් හා සෙසුනිලයින් 3640 ක් ඒකරාශී කොට 1989 වර්ෂයේ නොවැම්බර් මස 01 වන දින පළමු මුර බළඇණිය නමින් නව ඒකකයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව යටතේ කොළඹ මැලේවිදිය යන ස්ථානයේදී ආරම්භ කරන ලදී. තර්ජිත මායිම් ගම්මානවල ආරක්‍ෂාව සඳහා එම ප්‍රදේශයන්හි සිටින තරුණයින් වැඩි පිරිසක් යුද්ධ හමුදාවට බඳවාගෙන, යුද සෙබළුන් වශයෙන් මූලික පුහුණුව ලබාදීමෙන් පසු, පළමු මුර බළඇණියට අමතරව 2, 3, 4 සහ 5 වශයෙන් තවත් මුර බළඇණි 04 ක් එක් කරමින් 1990 වර්ෂයේ නොවැම්බර් මස 01 වන දින සිට මුර බළඇණිය යන නාමය ව්‍යවහාරයෙන් ඉවත් කොට "ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව" වශයෙන් නව රෙජිමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලදී.

එතැන් පටන් එකී මහගු මෙහෙවර සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටුකරන ලද, ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව, අද වනවිට "ස්වාර්ථයට පෙර දේශය" යන අද්විතීය උදාත්ත පාඨයෙහි අර්ථයෙන්ම දැක්වෙන පරිදි දේශය පෙරමුණෙහි ලා සේවයට කැපවූ අභිමානවත් ගමනක යෙදෙමින් සිය 33 වන සංවත්සරය සමරන්නේ රෙජිමේන්තු ඉතිහාසය තුළ ප්‍රථම වතාවට යුද්ධ හමුදාධිපතිවරයකු තම රෙජිමේන්තු අධිපති ලෙස පත්වීමේ අභිමානය ද සහිතවය.

එසේ ආරම්භ කරන ලද ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව වර්තමානය වනවිට කුරුණෑගල වැහැරවත්ත ප්‍රදේශයේ ස්ථාපිතව ඇත. එහි ප්‍රථම රෙජිමේන්තු අධිපති ලෙස 1991 නොවැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකා යුද හමුදා පාබල රෙජිමේන්තුවට අයත් බ්‍රිගේඩියර් එස්පීබී ද සිල්වා කේඑස්වී යන නිලධාරී කටයුතු කරනු ලැබීය.

රුදුරු බෙදුම්වාදී ත්‍රස්තවාදී ග්‍රහණයෙන් ශ්‍රී ලංකාද්වීපය මුදවා ගැනීමේ උදාර අරමුණ පෙරදැරිව,

> 2009 මැයි මස 18 වන දින ත්‍රස්තවාදය පරාජයට පත්කරන අවස්ථාව වනවිට බළඇණි 37 ක් සහ මූලස්ථාන බළඇණි 02 ක් ද සහිතව ඒකක 39 කින් යුක්ත වූ ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව එතෙක් මෙතෙක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ බිහිවූ විශාලතම රෙජිමේන්තුව ලෙස ඉතිහාසයට එක්ව තිබේ. විශේෂයෙන්ම මෙම රෙජිමේන්තුව එදා මෙද තුර අත්පත් කරගත් ක්‍රියාන්විත ජයග්‍රහණ පිළිබඳව සැලකීමේදී, 1995 ජූලි මස 28 වන දින වැලිඔය ප්‍රදේශයේදී ත්‍රස්තවාදීන් 500 කට ආසන්න පිරිසක් විනාශ කරමින් ලැබූ යුද ජයග්‍රහණය නොමැකෙන සන්ධිස්ථානයක් ලෙස සඳහන් කළ හැකිය.

ආරම්භ කරන ලද මෙම රෙජිමේන්තුව 2009 මැයි මස 18 වන දින ත්‍රස්තවාදී අරගලය පරාජයට පත්කරන අවස්ථාව වනවිට දී බළඇණි 37 කින් සහ මූලස්ථාන බළඇණි 02 ක් ද සහිතව ඒකක 39 කින් යුක්ත වූ අතර, එය එතෙක් මෙතෙක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ බිහිවූ විශාලතම රෙජිමේන්තුව ලෙස ඉතිහාසයට එක්වී තිබිණ.

මෙම රෙජිමේන්තුවේ ඉතිහාසය තුළ අත්පත් කරගත් සුවිශේෂී ක්‍රියාන්විත ජයග්‍රහණ පිළිබඳව සැලකීමේදී, වැලිඔය ප්‍රදේශයේදී 1995 ජූලි මස 28 වන දින ලැබූ යුද ජයග්‍රහණය සුවිශේෂී සන්ධිස්ථානයකි. එවකට මේජර් ජෙනරාල් ජානක පෙරේරා අණදුන් 6 වන බලසේනාව යටතේ ස්ථාපිතව තිබූ 16 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ භටපිරිස් එම විශිෂ්ට ජයග්‍රහණයට දායක වූහ. එහිදී, එම ප්‍රදේශයට ත්‍රස්තවාදීන් 1000 කට අධික පිරිසක් එල්ල කළ දැවැන්ත ප්‍රහාරයක් මැඩපවත්වා ඔවුන් 500 කට ආසන්න සංඛ්‍යාවක් මරාදමා තවත් ත්‍රස්තවාදීන් 300 කට අධික පිරිසකට තුවාල සිදුකර අත්පත් කරගත් දැවැන්ත ජයග්‍රහණය සඳහන් කළ හැක. තවද, 1999.12.14 වන දින වාකරේ කජුවත්ත ප්‍රදේශයේදී එල්ලවූ ත්‍රස්තවාදී ප්‍රහාරයක් සාර්ථකව මැඩපැවැත්වූ 14 වන බළඇණියේ සෙබළුන් විසින් ත්‍රස්තවාදීන් විශාල පිරිසක් විනාශ කරමින් ඔවුන්ගේ අවිආයුධ ද අත්පත් කරගනිමින් එම කඳවුර ආරක්‍ෂා කරගැනීමට සමත්වීම කැපීපෙනේ.



මෙම අභිමානවත් රෙජිමේන්තුවේ සාමාජිකයින් දක්‍ෂතා දක්වා ඇත්තේ ක්‍රියාන්විත රාජකාරීන්හිදී පමණක් නොවේ. එනම්, යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සරඹ තරගාවලියේ ශූරතාවය 2023 වර්ෂයද ඇතුළුව 05 වතාවක් ද, අනු ශූරතාවය 04 වතාවක් ද, තුන්වන ස්ථානය 03 වතාවක් ද, ජයග්‍රහණය කර ඇත. එමෙන්ම, පියවර කොඳු තරගාවලියේ ශූරතාවය 05 වතාවක් ක් ද, ජයග්‍රණය කරමින් යුද්ධ හමුදා සරඹ ක්‍ෂේත්‍රය තුළ ප්‍රවීණයින් බව සනාථ කොට ඇත. තවද, යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු ජූඩෝ තරගාවලියේ ශූරතාවය 2023 වර්ෂයද ඇතුළුව අඛණ්ඩව වසර 20 ක් ද, අන්තර් රෙජිමේන්තු කරාතේ ශූරතාවය වසර 12 ක් ද, දිනාඇති ඔවුන් වෙනත් ජවන හා පිටිය කණ්ඩායම් ක්‍රීඩා ඉසව්වලින් ද දෙස් විදෙස් තරග බිමේ ලත් ජයග්‍රහණ අතිමහත්ය.

එමෙන්ම, රෙජිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට රෙජිමේන්තු අධිපතිවරයකු ලෙස යුද්ධ හමුදාධිපතිවරයකු පත්වීම, රෙජිමේන්තුව ලබා ඇති ස්වර්ණමය අවස්ථාවක් වන අතර, එහි සාමාජිකයන් ලද මහගු වරප්‍රසාදයක් මෙන්ම දුර්ලභ භාග්‍යයකි. වත්මන් යුද්ධ හමුදාධිපති මෙන්ම ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ අභිමානවත් නිවැරදි නායකත්වය සහ ආශිර්වාදය ලබමින් මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ජ් කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ, ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ අන් රෙජිමේන්තු හා කරට කර ගැටෙමින්, සියලුම ක්‍ෂේත්‍රයන්හි නන් අයුරින් සමත්කම් දක්වමින් සිටී.

# ජාතික ආරක්ෂක විද්‍යාලයේ ආරාධිත දේශනයකට යුද්ධ හමුදාධිපති එක්වේ







ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ නිලධාරීන් වෙනුවෙන් කොළඹ 3, ජාතික ආරක්ෂක විද්‍යාලය මඟින් පවත්වනු ලබන ජාතික ආරක්ෂාව සහ උපාය මාර්ගික අධ්‍යයන පාඨමාලා අංක - 02 සඳහා සාම්ප්‍රදායිකව සිදුකරන "යුද්ධ හමුදාධිපති ගේ දේශනය" යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු විසින් පසුගිය ඔක්තෝබර් මස 06 වන දින සිදුකරනු ලැබීය.

'Sri Lanka Army Concerns on National Security and Transformation to Meet New Challenges' යන තේමාව යටතේ සිදුකළ මෙම දේශනයට නිදහසින් පසු මෙරට යුද්ධ හමුදාවට එල්ල වන තර්ජන, ආරක්ෂක ගැටලු සහ විවිධ අභියෝග, ප්‍රතිව්‍යුහගතකරණය යන කරුණු ඇතුළත් විය. එහිදී, යුද්ධ හමුදාවේ සුබසාධනය, මානව සම්පත් කළමනාකරණය, යාවත්කාලීනකරණය කිරීම පිළිබඳව ශිෂ්‍ය නිලධාරීන්ට යුද්ධ හමුදාධිපති සමඟ ප්‍රශ්නෝත්තර සැසියක් පැවැත්වීමටද අවස්ථාව ලැබිණි.

ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු එම විද්‍යාලයේ ලේකම් මේජර් ජෙනරාල් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් එහිදී යුද්ධ හමුදාධිපතිතුමන් පිළිගනු ලැබූහ.

ජාතික ආරක්ෂාව සහ උපායමාර්ගික අධ්‍යයන පාඨමාලා අංක - 02 සඳහා යුද්ධ හමුදාවේ නිලධාරීන් 15 ක්, නාවික හමුදාවේ නිලධාරීන් 08 ක් ගුවන් හමුදාවේ නිලධාරීන් 07 ක් සහ පොලිසියේ නිලධාරීන් 06 ක් ඇතුළත්ය. ජාතික ආරක්ෂක විද්‍යාලය ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ රාජ්‍ය සේවයේ නියතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් නිවැරදි උපායමාර්ගික තීරණ ගැනීම සංවර්ධනය කිරීමේ අරමුණින් පරිපූර්ණ දැනුමක් ලබාදීම සඳහා මෙරට ස්ථාපනය කරන ලද ප්‍රමුඛතම ආයතනයකි. එමගින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක අවශ්‍යතා, ජාතික සංවර්ධනය සහතික කිරීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සහ රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමටද දායකත්වය ලබාදෙයි.





# අභීත සෙබළියන් සමරමින් ස්මාරකයක්



රට වෙනුවෙන් දිවිපිදූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ වීරෝදාර සෙබළියන් සිහිකරමින් බොරැල්ලේ පිහිටි එම බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී අභිනවයෙන් ඉදිකරන ලද රණවිරු ස්මාරකය ඉකුත් නොවැම්බර් 10 වන දින විවෘත කෙරිණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ එම උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී විය.

සම්ප්‍රාදායානුකූල රණබෙර වාදනයෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදූ කාන්තා බලකායේ වීරෝධාර සෙබළියන් 25 දෙනකු සිහිපත් කිරීම වෙනුවෙන් ඉදිකළ ස්මාරකයේ සමරු ඵලකය යුද්ධ හමුදාධිපතිගේ සුරතින් නිරාවරණය කෙරිණ. දිවිපිදූ කාන්තා සෙබළියන් 25 දෙනාගේ ළඟම ඥාතීන් ද එම හැඟීම්බර ඓතිහාසික අවස්ථාවට එක්ව තිබීම විශේෂත්වයකි. එම උත්සව අවස්ථාවට යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක් ද කාන්තා බලකායට අයත් රණවිරු සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.














# කෙඩෙට් නිලධාරීහු පිරිසක් යුද්ධ හමුදාධිපති හමුවෙති

දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයෙහි පුහුණුව ලබමින් සිටින සෙනගාල් ජාතික කෙඩෙට් නිලධාරියකු ඇතුළුව බඳවා ගැනීමේ පාඨමාලා 92, 92 (බී) සහ කෙටි කාලීන පාඨමාලා අංක 20 යන පාඨමාලාවන්හි කෙඩෙට් නිලධාරීන් කණ්ඩායමක් ඉකුත් නොවැම්බර් 20 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ.

අධිකාරියට පත්වීමට නියමිත එම කෙඩෙට් නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ අවසන් පැවරුම් අභ්‍යාසයක් වශයෙන් *Enhancing United Nation Peacekeeping Capabilities of the Sri Lanka Army* යන තේමාව යටතේ යුද්ධ හමුදාධිපති සමඟින් වූ මෙම හමුව සිදුවිය. එහිදී එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා වැඩි වශයෙන් මෙරට හමුදාව සහභාගී කරවීම සහ එහි කාන්තා සහභාගීත්වය පිළිබඳවද කෙඩෙට් නිලධාරීන් පිරිස වෙත යුද්ධ හමුදාධිපති අදහස් දැක්වීය. යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවති මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීඅයි මහලේකම් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී, එහි ප්‍රධාන උපදේශක කර්නල් එල්පී අතුකෝරල ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ ජ්‍යෙෂ්ඨ උපදේශක මේජර් එන්එස්පී ද සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු පාඨමාලා භාර නිලධාරීන් කිහිපදෙනෙක්ද එක්ව සිටියහ.

# "දෙපෙරමුණක සටන්" යුද්ධ හමුදාධිපති වෙත පිරිනැමේ





මේජර් ජෙනරාල් ධම්මි හේවගේ (විශ්‍රාමික) විසින් රචිත "දෙපෙරමුණක සටන්" කෘතියේ පිටපතක් ඉකුත් නොවැම්බර් 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ වෙත පිරිනමනු ලැබීය.

දශක තුනහමාරක් ඉක්ම වූ සිය දීර්ඝ හමුදා දිවිය තුළ මෙන්ම විශේෂයෙන්ම මානුෂීය මෙහෙයුමේ උච්චතම අවධියේදී ඔහු ලද අත්දැකීම් අන්තර්ගත කරමින් මෙම කෘතිය රචනා කර ඇත. රණවිරුවන්ගේ නිර්භීතකම සහ එල්ටීටීඊ ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මාතෘභූමිය මුදාගැනීම සඳහා ඔවුන් දැක්වූ අසමසම දායකත්වයට උපහාර පුදකිරීම ද මෙම ග්‍රන්ථය තුළින් සිදුකෙරේ. යුද්ධ හමුදාධිපති විසින් එහි කතුවරයා වන මේජර් ජෙනරාල් ධම්මි හේවගේ (විශ්‍රාමික) ගේ මෙම නව කෘතිය ඇගයීමට ලක්කරමින් එතුමන් වෙත සිය සුබපැතුම් එක්කළේය.

# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආතනයේ ආගමික වැඩසටහනකට යුද්ධ හමුදාධිපති එක්වෙයි





බොල්ලෑගල, මානෙල්වත්ත, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන පරිශ්‍රයේදී ඉකුත් නොවැම්බර් 18 වන දින පැවැත්වූ ආගමික උත්සවයට එම ආයතනයේ උපකුලපති සහ නායිවානයේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නායක හිමියන් විසින් සිදුකරනු ලැබූ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු සහභාගී විය. එහිදී දිවයිනේ විවිධ ප්‍රදේශවල සිට වැඩමවා වදාළ භික්ෂූනීන් වහන්සේලා 5000 ක් වෙත පිරිකර සහ දානය පිරිනැමීම සිදුවිය.

එම උත්සව කටයුතු ආරම්භ කිරීමට පෙර ආචාර්ය බෝදාගම චන්දිම නායක ස්වාමීන් වහන්සේ සහ උඩුවේ ධම්මාලෝක හිමියන් ගේ ඇරයුමෙන් එම පරිශ්‍රයේ නේවාසික ශිෂ්‍යන් වහන්සේලා සඳහා නවතමයෙන් ඉදිකරන ලද සිව්මහල් නවාතැන් ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවටද යුද්ධ හමුදාධිපති එක්විය. යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත යුද්ධ හමුදා 7 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ භටපිරිස් එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සිය ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික දැනුම සපයනු ලැබූහ.

# හදිසි සේවා සඳහා යෙදවූ භටපිරිස් හමුවෙයි





යුද්ධ හමුදාධිපති ඉකුත් නොවැම්බර් 22 වන දින කොට්ටාව, ඊ-1 දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිවිසුම් සහ පිටවීමේ හුවමාරුවේ හදිසි සේවා සඳහා යෙදවූ යුද්ධ හමුදා භටපිරිස් හමුවී එම කටයුතුවල නිරතවන ආකාරය නිරීක්ෂණය කළේය. අධිවේගී මාර්ගවල ප්‍රවේශපත් නිකුත් කරන්නන් ඉකුත් නොවැම්බර් 22 වන දින ක්‍රියාත්මක කළ වැඩවර්ජනය හේතුවෙන් අධිවේගී මාර්ග භාවිතා කරන ජනතාවට සිදුවන අපහසුතාවයන් වැළැක්වීම සඳහා රජය විසින් සිදුකරනු ලැබූ ඉල්ලීමකට අනුව යුද්ධ හමුදා භටපිරිස් ඒ සඳහා යොදවන ලදී. එහිදී කොට්ටාව සිට මාගම්පුර දක්වා වූ ඊ-1 අධිවේගී මාර්ගයේ ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම ඇතුළු කටයුතු සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ සේවයේ නියුතු නිලධාරීන් 31 දෙනෙක් සහ සෙසුනිලයෝ 233 දෙනෙක් යොදවනු ලැබූහ.

දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිහිටි පිවිසුම්/පිටවීමේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 22 ක් තුළින් ප්‍රවේශවන සහ පිටවන රථවාහන රියදුරන් සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමත් එම අන්තර් හුවමාරු මධ්‍යස්ථාන වෙත ආරක්ෂාව සැපයීමත් එහිදී යුද්ධ හමුදා භටපිරිස් විසින් සිදුකරන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති ඇතුළු නිලධාරීහු කිහිපදෙනෙක්ද එක්ව සිටියහ.




# පල්ලේකැලේට ජන අවන්හලක් සහ රූපලාවණ්‍යාගාරයක්









යුද්ධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සුභසාධනය ඉහළ නැංවීමේ අරමුණින් මහනුවර - පල්ලේකැලේ ඉදිකෙරුණු *MEALS BY ARMY SEVA VANITHA UNIT* ජන අවන්හල සහ රූපලාවණ්‍යාගාරය යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සුරතින් ඉකුත් නොවැම්බර් 26 වන දිනට යෙදුණු සුබ මොහොතින් විවෘත කෙරිණ.

මෙම ජන අවන්හලට නවීන අංගෝපාංගවලින් සමන්විත බේකරියක් හා ක්ෂණික ආහාර හා පළතුරු බීම අලෙවිසැලක් ද ඇතුළත්ය. තවද, එය නවීන පන්නයේ කාන්තා කොණ්ඩා සැකසුම්/රූපලාවණ්‍යාගාරයකින්ද සමන්විත වේ.

එහිදී, යුද්ධ හමුදාධිපති සේවා වනිතා සභාපතිනිය හා එක්ව *MEALS BY ARMY SEVA VANITHA UNIT* ජන අවන්හල සහ රූපලාවණ්‍යාගාරයේ නිරීක්ෂණ චාරිකාවකටද එක්වූ අතර, එම අංශයන්හි රාජකාරි කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින් සමඟින් සුහද පිළිසඳරක යෙදෙමින් මෙම ජන අවන්හල හා රූපලාවණ්‍යාගාරය උසස් මට්ටමකින් පවත්වාගෙන යාම සැමගේ වගකීමක් බැව් පෙන්වා දුන්හ. එමෙන්ම, මෙම ජන අවන්හල සහ රූපලාවණ්‍යාගාරයේ ඉදිකිරීම් සිදුකරන ලද ඉංජිනේරු හටපිරිස්හි සේවය අගයමින් ඔවුන් සමගද සුහද පිළිසඳරක නිරත වූහ.

මෙම අවස්ථාවට 11 වන පාබල සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති, 111 හා 112 වන පාබල බලසේනා මූලස්ථානයන්හි බලසේනාධිපතිවරු ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.






# යුද්ධ හමුදාධිපති ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) හටපිරිස් අමතයි

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් නොවැම්බර් 22 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) නිල සංචාරයක නිරතවෙමින් එම මූලස්ථානය යටතේ සේවයේ නියුතු හටපිරිස් ආමන්ත්‍රණය කළේය.

ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සහ 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ජේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ විසින් කඳවුරු පරිශ්‍රය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ.





මෙම සංචාරයේදී යුද්ධ හමුදාධිපති විසින් හටපිරිස් ආමන්ත්‍රණය කරමින් යුද්ධ හමුදාවේ වත්මන් සුබසාධන ව්‍යාපෘති, දැනට ක්‍රියාත්මක යුද්ධ හමුදා ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන, යුද්ධ හමුදා ශක්තීන් කළමනාකරණ පද්ධතිය සහ වත්කම් කළමනාකරණ පද්ධතිය මෙන්ම සියලු නිලයන්ගේ විනය ඉහළ මට්ටමින් පවත්වාගැනීමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කරන ලදී.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ සේවයේ නියුතු සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් ඇතුලු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.



# යුද්ධ හමුදා සරඹ සහ පියවර කෝදු තරඟාවලිය

"යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සරඹ හා පියවර කෝදු තරඟාවලිය - 2023" හි ජයග්‍රාහී කණ්ඩායම් සඳහා සම්මාන ප්‍රධානෝත්සවය යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පනාගොඩ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු සරඹ භූමියේදී පසුගිය නොවැම්බර් මස 30 වන දින පවත්වනු ලැබීය.

ප්‍රේක්ෂකයන් සහ සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම උත්සවයේදී යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් සහභාගී වූ එම කණ්ඩායම් ඉදිරිපත් කරනු ලැබූ සරඹ සහ තූර්ය වාදක අංගයන් මගින් උත්සවයට අලංකාරවත් බවක් සහ අභිමානයක් එක්කළේය. තරඟාවලිය 2023 ඔක්තෝබර් මස 12 සිට 23 දින දක්වා ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන සරඹ භූමිවලදී පැවැත්විණ.

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ විනය සහ පැවැත්ම උසස් මට්ටමින් පවත්වාගෙන යාමේ තරඟ ඉසව්වක් ලෙස යුද්ධ හමුදාව තුළ අන්තර් රෙජිමේන්තු සරඹ, තූර්ය වාදක සහ පියවර කෝදු තරඟාවලිය පවත්වනු ලැබේ. යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහ පිරිස් පාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේජ්‍යූ කොඩිතුවක්කු ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ උපදෙස් මත මෙම තරඟාවලිය සංවිධානය කෙරිණි.



යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් සහභාගී වූ සරඹ සහ තූර්ය වාදක කණ්ඩායම් විසින් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ අත්පොළසන් නාද මධ්‍යයේ සිය දක්ෂතා ප්‍රදර්ශනය කරන ලද අතර, යුද්ධ හමුදාවේ ආරාධනයෙන් එම අවස්ථාවට සහභාගී වූ දිවයින පුරා පිහිටි පාසල් 41 ක සිසු සිසුවියන් විශාල පිරිසක් ද ඉතා උද්යෝගයෙන් යුතුව මෙම තරඟාවලිය නැරඹූහ.









| තරඟාවලියේ දක්ෂතා දැක්වූ කණ්ඩායම් සහ තරඟකරුවන් පහතින් දැක්වේ | |
|---|---|
| දක්ෂතම සරඹ කණ්ඩායම - පිරිමි | ප්‍රථම ස්ථානය - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව |
| | දෙවන ස්ථානය - ශ්‍රී ලංකා පාබල හමුදාව |
| | තෙවන ස්ථානය - ගැමුණු හේවා රෙජිමේන්තුව |
| දක්ෂතම සරඹ කණ්ඩායම - කාන්තා | ප්‍රථම ස්ථානය - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය |
| | දෙවන ස්ථානය - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය |
| දක්ෂතම කණ්ඩායම් අණදෙන නිලධාරි | ප්‍රථම ස්ථානය - ශ්‍රී ලංකා පාබල හමුදාවේ කපිතාන් ආර්වී කුලරත්න |
| දක්ෂතම කණ්ඩායම් අණදෙන නිලධාරිනී | ප්‍රථම ස්ථානය - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ලුතිනන් ඩීඑඩීඑන් දිරසිංහ |
| දක්ෂතම පියවර කෝදු කණ්ඩායම | ප්‍රථම ස්ථානය - ශ්‍රී ලංකා පාබල හමුදාව |
| | දෙවන ස්ථානය - ගැමුණු හේවා බලකාය |
| | තෙවන ස්ථානය - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව |
| දක්ෂතම සරඹ උපදේශක | ප්‍රථම ස්ථානය - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ බලලත් නිලධාරී II ප්‍රේමජන්තු කේ |





# සුහද හමුවක මතක සටහන්





හවායි, ෆෝට් ෂෙල්ටර්හි පිහිටි එක්සත් ජනපද යුද්ධ හමුදා පැසිෆික් විධානයේ උපාය මාර්ග සහ සැලසුම් අංශයේ නියෝජ්‍ය අණදෙන නිලධාරි මේජර් ජෙනරාල් ක්‍රිස් ස්මිත් (*Major General Chris Smith*), කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් ඇන්තනි සී. නෙල්සන් (*Lieutenant Colonel Anthony C' Nelson*), මේජර් බෙන්ජමින් ෆ්ලෝරස් (*Major Benjamin Flores*), මේජර් ඕමාර් කැවලියර් (*Major Omar Cavalier*) සහ කපිතාන් කෙට්ලින් පෙනිකුක් (*Captain Caitlin Pennicooke*) ඉකුත් නොවැම්බර් මස 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු හමුවූහ.

මෙම සුහද හමුවේදී, ආසියානු පැසිෆික් කලාපයේ වත්මන් ආරක්ෂක තත්ත්වය, ද්විපාර්ශ්වික පුහුණු අවස්ථා පුළුල් කිරීම සහ දෙරටෙහිම යුද්ධ හමුදාවන්ට වැදගත් වන තවත් කරුණු කිහිපයක් පිළිබඳ අදහස් හුවමාරු කරගත්හ.

එක්සත් ජනපද පැසිපික් විශේෂ මෙහෙයුම් විධානයේ අණදෙන නිලධාරී රියර් අද්මිරාල් ජෙරොම් බී විලියම්ස් (Rear Admiral Jeromy B' Williams) ගේ ප්‍රධානත්වයෙන් යුත් ඇමරිකා එක්සත් ජනපද නියෝජිත කණ්ඩායමක් ඉකුත් නොවැම්බර් 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති හමුවී යුද්ධ හමුදා පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිදුකරනු ලැබූහ.





ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කපිතාන් එම් ආනන්ද් *(Captain M Anand)* ඉකුත් නොවැම්බර් 20 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූයේය. මෙම හමුවේදී දෙරටේ සන්නද්ධ හමුදා අතර පවතින සුහදතාවය, සහයෝගීතාව සහ අවබෝධය පිළිබඳවත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් ලබාදීම වැඩිකිරීම මගින් ද්විපාර්ශ්වික සබඳතාවයන් වැඩිදියුණු කිරීමේ වැදගත්කම පිළිබඳවත් අදහස් හුවමාරු කෙරිණ.

ධුරයෙන් නික්ම යන ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් පුනීත් සුෂිල් (Lieutenant Colonel Puneet Sushil) ඉකුත් නොවැම්බර් මස 30 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය. මෙම සුහද හමුවේදී, ද්විපාර්ශවීය කරුණු සහ දෙරටෙහි හමුදාවන් අතර පවතින සබඳතා පිළිබඳව ද අදහස් හුවමාරු කරගැනිණ. එහිදී, ධුරයෙන් නික්ම යන ලුතිනන් කර්නල් පුනීත් සුෂිල් ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු කාලසීමාව තුළදී ලබාදුන් සහයෝගය වෙනුවෙන් යුද්ධ හමුදාධිපති වෙත සිය කෘතඥතාව පුදකළ අතර, මෙරට යුද්ධ හමුදාවේ ඉදිරි කටයුතු සඳහා සිය සුබ පැතුම් ද එක් කළේය.



ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධුරයේ රාජකාරී භාරගැනීමට නියමිත ක්ෂේනුකා සෙනෙවිරත්න මහත්මිය ඉකුත් නොවැම්බර් 15 වන දින යුද්ධ හමුදාධිපති හමුවූවාය. මෙම හමුවේදී, යුද්ධ හමුදාධිපති විසින් එතුමිය වෙත සිය සුබපැතුම් පළකරමින් දෙපාර්ශ්වය අතර පවතින ද්විපාර්ශ්වික පුහුණු ක්‍රමවේද මෙන්ම වැඩසටහන් පිළිබඳව ද අදහස් බෙදාගනු ලැබීය. එමෙන්ම, සුහදත්වය සහ සහයෝගීතාවයේ මිත්‍රශීලී බැඳීම් තවදුරටත් වැඩිදියුණු කිරීමේ වැදගත්කම පිළිබඳව ද මෙහිදී යුද්ධ හමුදාධිපති අවධාරණය කළේය.



# අභාවප්‍රාප්ත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙපලකට ගෞරවය පුදකරයි



කුඩාඔය කමාන්ඩෝ පුහුණු පාසලේ සේවයේ නිරතව සිටියදී අභාවප්‍රාප්ත වූ ගැමුණු හේවා බලකායේ බ්‍රිගේඩියර් ජීජීඑස්එම් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී ගේ දේහයට යුද්ධ හමුදාධිපති සිය අවසන් ගෞරව දැක්වීය. එහිදී අභාවප්‍රාප්ත එම නිලධාරීගේ භාර්යාව, දරු දෙදෙනා ඇතුළු පවුලේ සාමාජිකයන් වෙත යුද්ධ හමුදාධිපති සිය බලවත් ශෝකය ප්‍රකාශ කළ අතර, යුද සමයේ මෙවිබිම ආරක්‍ෂා කිරීම වෙනුවෙන් ඔහු සිදුකළ කැපවීම පිළිබඳව ද සිහිපත් කළේය. එම නිලධාරී ජීවිතක්‍ෂයට පත්වන විට 53 වන වියේ පසුවිය.



ඉකුත් නොවැම්බර් 16 වන දින සන්ධ්‍යාවේ බොරැල්ල ඒ.එෆ්. රේමන්ඩ් මල්ශාලාවේදී තැන්පත් කොට තිබූ අභාවප්‍රාප්ත ශ්‍රී ලංකා පාබල හමුදාවේ කර්නල් ඩබ්ලිව්එම්ආර් විජේසුන්දර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී (විශ්‍රාමික) ගේ දේහයට අවසන් ගෞරව දැක්වීම සඳහාද යුද්ධ හමුදාධිපති එක්වීය. එහිදී, අභාවප්‍රාප්ත එම නිලධාරීගේ පවුලේ සාමාජිකයන් වෙත සිය ශෝකය පළකරමින් එතුමන් විශ්‍රාම යාමට ප්‍රථම යුද්ධ හමුදාව වෙනුවෙන් සිදුකළ කැපවීම සහ වර්ෂ 2009 මැයි මාසයට ප්‍රථම පැවති මානුෂීය මෙහෙයුම සාර්ථක කරගැනීම වෙනුවෙන් අභිනව කටයුතු කළ ආකාරය පිළිබඳවද සිහිපත් කළේය.

# හමුදාධිපතිගේ සුරතින් නිල ලාංඡන පළඳවයි



උසස්වීම් ලැබූ අධ්‍යක්ෂ ජෙනරාල් ක්‍රීඩා මේජර් ජෙනරාල් පීජීඑම් පීරිස් යුඑස්පී පීඑස්සී සහ ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස - උතුර මේජර් ජෙනරාල් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී වෙත යුද්ධ හමුදාධිපති ගේ සුරතින් ඉකුත් නොවැම්බර් මස 07 වන දින නිල ලාංඡන සහ සංකේතාත්මක අසිපත් පිරිනමනු ලැබීය.

# සංචාරයක මතක සටහන්



බංගලාදේශ, බෙල්ජියම, යුරෝපා සංගමය, කියුබාව, ඊජිප්තුව, අරාබිය, ඉතාලිය, නේපාලය, පාකිස්ථානය, උතුරු අයර්ලන්තය, එක්සත් රාජධානිය, සිංගප්පූරුව සහ ඉන්දියාව යන රටවල්වලින් මෙරට දූත මණ්ඩල ප්‍රධානීන් ලෙස නවතමයෙන් පත්වීම් ලැබූ තානාපතිවරු සහ මහ කොමසාරිස්වරු දසදෙනකු නිල සංචාරයක් අතරතුර ඉකුත් නොවැම්බර් 05 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සංචාරයක නිරත වූහ.

එහි ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් කඳවුරු පරිශ්‍රය වෙත සපැමිණි තානාපතිවරු සහ මහ කොමසාරිස්වරු උණුසුම් ලෙස පිළිගන්නා ලදී. අනතුරුව දූත මණ්ඩල ප්‍රධානීන් උතුර ප්‍රදේශයේ ත්‍රිවිධ හමුදා ආඥාපතිවරු සමග සාකච්ඡාවකද නිරතවූ අතර, එහිදී උතුරු ප්‍රදේශයේ ආරක්‍ෂක තත්ත්ව, සිවිල් - හමුදා සහයෝගීතාවය, සමාජ සුබසාධන ව්‍යාපෘති සහ සංවර්ධන ආධාර මෙන්ම ප්‍රතිසන්ධාන ව්‍යාපෘතීන් පිළිබඳව අදහස් හුවමාරු කරගත්හ.





# පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්





553 වන පාබල බලසේනාවේ භටපිරිස් එක්ව ධර්මපුරම් ප්‍රදේශයේ පාසල් ළමුන් සඳහා පාසල් උපකරණ බෙදාදීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 23 වන දින ධර්මපුරම් නො. 1 රජයේ දෙමළ මිශ්‍ර පාසල් පරිශ්‍රයේදී පවත්වනු ලැබූහ. එම උත්සව අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහ ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් ආර් කේතීස්වරන් මහත්මිය සහභාගී වූවාය.

උත්සවයේදී සිසුන් 200 දෙනකු වෙත රු. 3200.00 ක වටිනාකමකින් යුත් පාසල් උපකරණ බෙදා දෙනු ලැබිය. කණ්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් ටී පිරුන්තකරන් මහතාගේ ඉල්ලීමකට අනුව පරිත්‍යාගශීලීන් පිරිසක් විසින් මෙම පරිත්‍යාග සිදුකරන ලදී. උත්සවයට සමගාමීව පාසල් ළමුන් අතර උද්‍යාන වගාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සෑම සිසුවකු වෙතම පොල් සංවර්ධන අධිකාරිය මගින් පොල් පැළයක් ද සිංහ සමාජය මගින් පොහොර ඇතුළු පාර්සලයක් සහ පැළ වර්ග ද බෙදා දෙන ලදී.

# වන්නි ආරක්ෂක සේනා ආඥාපතිගේ සංචාරයක්

වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒඩීඩබ්ලිව් නානායක්කාර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ඉකුත් නොවැම්බර් මස 29 වන දින පෙළම්කුලම, 3 ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ හා 3 ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ සංචාරයක නිරත විය.

එහිදී, ප්‍රථමයෙන් 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත පැමිණි ආඥාපති ඒකක අණදෙන නිලධාරිනී මේජර් එස්එම්එස් මධුභාෂිණී විසින් උණුසුම්ව පිළිගැනීමෙන් අනතුරුව එම ඒකකයේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳව දැනුවත් කරමින් ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශය තුළ වෛද්‍ය මධ්‍යස්ථාන හා වෛද්‍ය වෘත්තිකයන් යෙදවීම සහ 3 ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය මගින් පවත්වනු ලබන පාඨමාලා පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක් ඉදිරිපත් කරන ලදී. තවද, බලප්‍රදේශයේ භටපිරිස් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම පිළිබඳව ද ආඥාපති සමග සාකච්ඡාවකද නිරත විය.





සිය සංචාරයේදී හමුදා හෙද පුහුණු පාසලට වෙන්කර ඇති ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදුන් ආඥාපති, සෙසුනිල භටනිවාස පරිශ්‍රයේ සුබසාධන පහසුකම් ද නිරීක්‍ෂණය කළේය. එම අවස්ථාවට 2 ඉංජිනේරු සේවා බලකායේ අණදෙන නිලධාරීද එක්විය.

එම සංචාරය අතරතුර එතුමන් අනුරාධපුර ශික්ෂණ රෝහලේ ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව අනුස්මරණ හමුදා වාට්ටුව වෙත ගොස් එහි ප්‍රතිකාර ලබන හමුදා රෝගීන් සමගද සුහදව අදහස් හුවමාරු කර ගැනීමට අමතක නොකළේය. එම අවස්ථාවට අනුරාධපුර ශික්‍ෂණ රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂවරයාද සහභාගී විය.

වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති සිය සංචාරය තුළ 3 ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ ද සංචාරය කළේය. එහිදී, එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එන්වීඒඑම් විතානගේ ආර්එස්පී පීඑස්සී විසින් ඒකකයේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳව දැනුවත් කරන ලදී. අනතුරුව, එහි ඉදිකරමින් පවතින බලලත් නිලධාරීන් සහ සැරයන් නිවස්න ගොඩනැගිල්ල සහ සන්නාහ සන්නද්ධ රථ අංගනය නිරීක්ෂණය කිරීමටද ආඥාපති එක්විය.



# බළඇණි පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන්





නිලධාරීන් 9 දෙනකු හා සෙසුනිලයින් 286 දෙනකු සහභාගී වූ 4 ගැමුණු හේවා බළඇණියේ බළඇණි පුහුණු පාඨමාලාව පුනානි බළඇණි පුහුණු පාසලේදී පසුගිය නොවැම්බර් 06 වන දින ඉතා සාර්ථකව අවසන් විය.

නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී පාඨමාලාවේ සමාප්ති අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වෙමින් දක්ෂතා දැක්වූවන් සඳහා ත්‍යාග ප්‍රදානය සිදුකළේය. එම අවස්ථාවට නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික, 232 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් රැසක් ද සහභාගී වූහ.

එහිදී, පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස සැරයන් කැලුම් චන්දන එම්ආර් ද, දක්ෂතම වෙඩික්කරු ලෙස කෝප්‍රල් වීරක්කොඩි පීඑම් ද, දක්ෂතම ශාරීරික යෝග්‍යතා සෙබලා ලෙස ලාන්ස් කෝප්‍රල් දිසානායක ඩීඑම්එම් ද කුසලාන හිමිකර ගත්හ. හොඳම සාමූහික කණ්ඩායමට හිමි කුසලානය "ඊ" කණ්ඩායම විසින් දිනාගන්නා ලදී.

# නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානය සිය 20 වන සංවත්සරය සමරයි

නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ 20 වන සංවත්සරය ඉකුත් ඔක්තෝබර් 31 වන දින එහි ආඥාපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් එහි සියලු නිලයින්ගේ සාමූහික සහභාගීත්වයෙන් සමරනු ලැබූහ. සංවත්සර දිනයට සමගාමීව පැවැත්වූ ආගමික වැඩසටහන, සුහද අත්පන්දු තරගාවලිය, ආඥාපති වෙනුවෙන් පැවැත්වූ සම්මාන මුරය සහ සම්මාන ආචාර පෙළපාළිය, රුක් රෝපණය, සියලු නිල තේ පැන් සංග්‍රහය, භටපිරිස් ඇමතීම සහ සංගීත රාත්‍රිය සංවත්සර වැඩසටහන් අතරට ඇතුළත්ව තිබිණ.





# උදාරයි ඔබ රණවිරු ක්‍රියාන්විතය







රණවිරු සුබසාධනය ජාතිකත්වය මෙන්ම මාතෘ භූමියේ ඒකීයභාවය ආරක්‍ෂා කරගැනීම පෙරදැරිව සමාජීය, සංස්කෘතික, ආගමික හෙළ උරුමයන් සහ විවිධ සමාජ විචලනයන් මනෝවිද්‍යාත්මක විශ්ලේෂණයන් තුළින් අධ්‍යයන කරමින් ඒව ප්‍රායෝගිකව ක්‍රියාත්මකවීම මෙන්ම ඒ සඳහා අවැසි ප්‍රබුද්ධ සමාජ සංවාදයන් ගොඩනැගීම අරමුණු කරගනිමින් "උදාරයි ඔබ" රණවිරු ක්‍රියාන්විතය ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) හිදී පවත්වන ලදී.

ආර්ය පදනමේ මේජර් ජෙනරාල් උපාලි රාජපක්‍ෂ (විශ්‍රාමික), සාහිත්‍යවේදී චරිත් කිරිඇල්ල, ජ්‍යේෂ්ඨ නීතිඥ සංජය රණතුංග, ප්‍රවීණ සමාජ විශ්ලේෂිකා පුෂ්පා රම්‍යාණි ද සොයිසා, ප්‍රවීණ සිනමා රංගධර බන්දු සමරසිංහ, ප්‍රවීණ ගායන ශිල්පී ඉන්ද්‍රජිත් දොලමුල්ල, රංගන ශිල්පී සේනක විජේසිංහ සහ ප්‍රවීණ ගායන ශිල්පී රණවිරු සම්පත් චූලරත්න යන මහත්ම මහත්මීන් එහිදී ඉතා හරවත් දේශන සහ ගායන ඉදිරිපත් කරනු ලැබූහ.

මෙම අවස්ථාවට ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ, 59 සහ 64 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් 800 කට ආසන්න පිරිසක් සහභාගී වූහ.

# කෙඩෙට් නිලධාරීන්ගේ පර්යේෂණ අධ්‍යයන ඉදිරිපත් කිරීම සඳහා පවතින සූදානම සොයාබැලේ



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ඉකුත් නොවැම්බර් 21 වන දින පනාගොඩ බටහිර ආරක්ෂක සේනා මූලස්ථානයේදී කෙඩෙට් නිලධාරීන් සමග සම්මුඛ සාකච්ඡාවක නිරතවිය. යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පාඨමාලා හදාරා නුදුරේදී විසිරයාමට නියමිත කෙඩෙට් නිලධාරී පාඨමාලා අංක 92, 92 බී, එස්සී 20 පාඨමාලාවන්හි කෙඩෙට් නිලධාරීන්ගේ අවසන් පර්යේෂණ අධ්‍යයන ඉදිරිපත් කිරීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ අධ්‍යයනයන් පිළිබඳ සාකච්ඡා කර ඔවුන් සතු දැනුම වැඩිදියුණු කිරීම එහි අරමුණයි.

2023 දෙසැම්බර් මස අධිකාරියට පත්කිරීමට නියමිත මෙම කෙඩෙට් නිලධාරීන් විසින් එක්සත් ජාතීන්ගේ සාමය සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම තේමාව ඔස්සේ සිදුකිරීමට නියමිත අවසන් පර්යේෂණ අධ්‍යයන සඳහා ප්‍රථමයෙන් දත්ත සහ තොරතුරු රැස්කරදීමේ අරමුණින් මෙම සාකච්ඡාව පැවැත්විණ. මෙම අවස්ථාවට බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් කේටීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී එන්ඩියූ, බ්‍රිගේඩියර් පාලන හා හටකාර්ය සම්පාදන බ්‍රිගේඩියර් ඒඑම්ආර් අබේසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ ජ්‍යේෂ්ඨ උපදේශක සහ පාඨමාලා නිලධාරියකු සහභාගී වූහ.

# බටහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ 11 වැනි සංවත්සරය අභිමානවත්ව



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සිය 11 වන සංවත්සරය ඉකුත් නොවැම්බර් 15 වන දින අභිමානවත්ව සමරන ලදී. එහිදී සංවත්සරයට සමගාමීව එම මූලස්ථානයේ රාජකාරියේ නියුතු සියලු සාමාජිකයින්ට හා ඔවුන්ගේ පවුල්වල සැමට ආශිර්වාද පතා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එච්කේඑස් පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ සහභාගිත්වයෙන් පනාගොඩ බෝධිරාජාරාම විහාරස්ථානයේදී පැවති බෝධිපූජා පිංකම ප්‍රධාන විය.



6 වන ගජබා රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ආඥාපති වෙත ගෞරව සම්මාන පුදකිරීමද, එහිදී ආඥාපති හටපිරිස් ඇමතීමද සංවත්සර දින වැඩසටහන් අතර වූ සෙසු ප්‍රධාන කටයුතු විය. එසේම, ආරක්ෂක සේනා මූලස්ථානයේ සේවයේ නියුතු සිවිල් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ජීවන තත්වය නගාසිටුවීම සඳහා වියළි සලාක ඇසුරුම් 40 ක් පරිත්‍යාග කිරීමද එහිදී සිදුවිය.

61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ජේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී, ආරක්ෂක සේනා මූලස්ථාන (බටහිර) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් කේටීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී එන්ඩියූ, මධ්‍යස්ථාන සේනාවිධායකවරු, අණදෙන නිලධාරීන් ඇතුලු නිලධාරීන්, සෙබලුන් විශාල පිරිසක් මෙම සංවත්සර උත්සවය සඳහා සහභාගී වූහ.

# ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) වෙතින් අකුරු කරන්නට දිරියක්



ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ උපදෙස් මත එම මූලස්ථාන හටපිරිස් හි සම්බන්ධීකරණයෙන් *'Anchor Fontera Pvt Ltd'* හි මූල්‍ය අනුග්‍රාහකත්වය ඇතිව කදුරුගමුව, මිහිඳු විද්‍යාලයේ පරිගණකය සහ ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා 40,000/- ක මුදලක් ඉකුත් නොවැම්බර් මස 08 දින පරිත්‍යාග කරනු ලැබීය.

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වයිඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී වෙත පාසලේ එම අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීමෙන් අනතුරුව එහි විදුහල්පති වෙත අදාල  මුදල් පරිත්‍යාගය සිදුකරනු ලැබීය.

# සිවිල් සේවක මහතුන් හට වියලි සලාක පරිත්‍යාගයක්





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් 10 දෙනකු වෙත රුපියල් 6000.00 ක වටිනාකමකින් යුත් වියළි සලාක පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් මස 08 වන දින සිදුකෙරිණ. මේ සඳහා එම මූලස්ථානයේ නිලධාරීන් සහ සෙසුනිලයින් මූල්‍ය දායකත්වය දැක්වූහ. එහි ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් මෙම වියළි සලාක පාර්සල් බෙදාදීම සිදුකරනු ලැබීය.

# ප්‍රජාසත්කාරක වැඩසටහනක්





ගණේමුල්ල, වැලිපිල්ලෑව ප්‍රදේශයේ පිහිටා ඇති ජපන් පන්සල වෙතින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී විමලවංශ ළමා නිවාසයෙහි දූ දරුවන් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක්, පිරිනැමීමටද පාසල් උපකරණ සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය බෙදාදීමටද පසුගියදා කටයුතු කෙරිණ. 4 කමාන්ඩෝ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් පීඑච්එස් නවරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 74 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව මෙම සත්කාරය සිදුකෙරිණ.

# දිරිය මිනිසුන්ට සරණක්



542 වන පාබල බලසේනාධිපතිගේ මගපෙන්වීම මත මනුසත් දෙරණ ආයතනය සමග එක්ව සංවිධානය කරනු ලැබූ වෛද්‍ය සායනයක් සහ ආධාර බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 28 වන දින මන්නාරම මුරුංකන් මහා විද්‍යාලයේදී පැවැත්විණ. මේ සඳහා මන්නාරම දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරකට අයත් සිවිල් වැසියන් 623 දෙනක් සහභාගී වූහ. තවද, දිළිඳු පවුල් දෙකක් සඳහා සූර්ය පැනල දෙකක්ද, මුරුංකන් මහා විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා ජල පිරිපහදු යන්ත්‍රයක්ද මනුසත් දෙරණ ආයතනයේ අනුග්‍රාහක දායකත්වයෙන් එහිදී පරිත්‍යාග කෙරිණ.

# යුද සාහිත්‍යය සහ සෙබළ අභිප්‍රේරණය පිළිබඳ දේශනයක්





ආරක්ෂක සේනා මූලස්ථාන (බටහිර) රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් හට බඳාදා පුහුණු දිනයට සමගාමීව "යුද සාහිත්‍යය" සහ "සෙබළ අභිප්‍රේරණය" පිළිබඳ අගනා දේශන දෙකක් ඉකුත් නොවැම්බර් 08 වන දින 4 වන කාලතුවක්කු රෙජිමේන්තු සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබීය. ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති ගේ උපදෙස් මත එම ආරක්ෂක සේනා මූලස්ථානය බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් කේටීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී එන්ඩියු ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සංවිධානය කෙරුණු මෙම වැඩසටහනට නිලධාරීන් 18 දෙනකු සහ සෙසුනිලයින් 90 දෙනකු සහභාගී වූහ.

මෙම දේශනයේ පළමු අදියර මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ මේජර් සුජිත් බණ්ඩාර එල්එස්සී විසින් පවත්වනු ලැබූ අතර, එමගින් යුද්ධ හමුදාවට නොපැමිණෙන අය, මුදල් විශුද්ධිකරණය, මංකොල්ලකෑම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ SWOT විශ්ලේෂණය වැනි වැදගත් කරුණු රැසක් පිළිබඳ සාකච්ඡා කෙරිණ. දේශනයේ දෙවන අදියර ලුතිනන් කර්නල් සුජීත් චමින්ද එදිරිසිංහ විසින් පැවැත්වූ අතර, එමගින් යුදබිම පිළිබඳ වේගයෙන් වියැකී යන මිලකළ නොහැකි මතක සහ ඔවුන්ගේ අමිල පරිත්‍යාගයන් පිළිබඳවද යුද සමයේදී මාතෘ භූමියේ සැබෑ පුතුන්ගේ අසමසම සහ අනේකවිධ කැපකිරීම් පිළිබඳවද ඔහු ගෙනහැර දැක්විය.

# නිවේදන හා ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළුවක්





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපතිගේ උපදෙස් පරිදි එම මූලස්ථානයේ සහ ඒ යටතේ පාලනය වන පාබල සේනාංක පාබල බලසේනා සහ ඒකකයන්හි රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් සඳහා නිවේදන හා ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළුවක් ඉකුත් නොවැම්බර් 13 වන දින සිට නොවැම්බර් 16 වන දින දක්වා පැවැත්විණ. යුද්ධ හමුදා ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරී නියුතු බලලත් නිලධාරී 1 ඒඑන්පී අමරසිංහ විසින් මෙහෙයවූ මෙම වැඩමුළුව සඳහා 40 දෙනකු සහභාගී වූහ. එහි ආරම්භක දේශනය සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) සහකාර කර්නල් සම්බන්ධීකරණ (සෙව්) ලුතිනන් කර්නල් පීබීජී විතානගේ සහභාගී වූ අතර, අවසන් දේශනය සඳහා එම මූලස්ථානයේම කර්නල් ප්‍රධාන මාණ්ඩලික කර්නල් ඩබ්ලිව්ජේ හේමචන්ද්‍ර ආර්එස්පී පීඑස්සී සහභාගී විය.

# Body Scientific Adaptation to Exercise
# වැඩමුළුව



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපතිගේ අදහසකට අනුව ශාරීරික යෝග්‍යතාවය, ක්‍රීඩා සහ ව්‍යායාම සම්බන්ධව දැනුවත් කිරීමේ අරමුණින් Body Scientific Adaptation to Exercise යන තේමාව යටතේ අධ්‍යාපනික වැඩමුළුවක් ඉකුත් නොවැම්බර් 10 වන දින සිට 12 වන දින දක්වා යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේදී පවත්වන ලදී.

මෙම වැඩමුළුව ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් කේජේඑන්එම්පීකේ නවරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී මේජර් අයිඑම්ජීඑන් ජයතිලක, කපිතාන් ආර්ටීඩබ්ලිව්එල් දයාරත්න, ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා උපදේශක කෝප්‍රල් දිසානායක අයියූඩබ්ලිව් සහ කෝප්‍රල් රණසිංහ ටීජීඑස් ඇතුළු උපදේශක මණ්ඩලයක් විසින් මෙහෙයවන ලදී. මේ සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් 54 දෙනක් සහභාගී වූහ.



## ප්‍රතිත්‍රස්ත යුද උපක්‍රම හා කැළෑබද සටන් පුහුණු පාඨමාලාව අංක 33 - නිලධාරී





යුද්ධ හමුදා පුහුණු පාසල මාදුරුඔය වෙතින් පවත්වනු ලැබූ ප්‍රතිත්‍රස්ත යුද උපක්‍රම හා කැළෑබද සටන් පුහුණු පාඨමාලා අංක 33 - නිලධාරී පාඨමාලාව සහ  සෙසුනිල පාඨමාලාව ඉකුත් නොවැම්බර් 16 වන දින එම පුහුණු පාසල් පරිශ්‍රයේදී නිමාවට පත්විය. මේ සඳහා යුද්ධ හමුදා නිලධාරීන් 28 ක් නාවික හමුදාවේ නිලධාරීන් දෙදෙනෙක් හා බංගලාදේශ නිලධාරියෙක් සමඟ සෙසුනිලයෝ 59 දෙනක් සහභාගී වූහ.

එම පාඨමාලා ද්විත්වයෙහි අවසන් විසිරයාමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් එල්ජීජේඑන් ආරියතිලක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය. පාඨමාලාවෙහි දක්ෂතම නිලධාරියා සහ සෙබළා ලෙස 4 වන විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් නි/71840 කපිතාන් එම් ගුණවර්ධන සහ සෙ/383590 කෝප්‍රල් අමරසූරිය ඒජීසීඑන් සමරු තිළිණ හිමිකරගත්හ.

# ජල යන්ත්‍ර පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක්





22 වන පාබල සේනාංක බලප්‍රදේශය තුළ සිදුකෙරෙන සෙවීම් හා මුදවාගැනීමේ මෙහෙයුම් සඳහා සහභාගී වන සෙනින් හට පිටත සවිකරන ලද ජල යන්ත්‍ර පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් ඉකුත් ඔක්තෝම්බර් 23 සිට 31 දක්වා පැවැත්විණ. 7 වන ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ උපදේශක සහයද ඇතිව පවත්වන ලද මෙම පුහුණු පාඨමාලාව සඳහා බලප්‍රදේශය තුළ රාජකාරී සිදුකරන සෙසුනිලයින් 30 දෙනකු සහභාගී වූහ. මෙම පුහුණුව තුළින් බෝට්ටු එන්ජින් හඳුන්වාදීම, පණගැන්වීම, ක්‍රියාවිරහිත කිරීම දෝෂ හඳුනාගැනීම, දෝෂ මගහරවා ගැනීම, අලුත්වැඩියා කිරීම මෙන්ම ගංගාවක, මහමුහුදෙහි, සැඩ පහරක සහ ගංවතුර අපදා තත්ත්වයකදී බෝට්ටු හැසිරවීම පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබාදෙන ලදී.

මෙම පාඨමාලාවේ අවසන් දේශනය සඳහා 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහභාගී වූ අතර, මෙම පාඨමාලාවේ සිසුන් 30 දෙනා අතරින් ප්‍රථම ස්ථානය සෙ/334971 පාසෙ පුෂ්පකුමාර ආර්එම්එස් 15 ශ්‍රිලපාහ හිමිකර ගත්තේය.

# කණිෂ්ඨ උපදේශක පාඨමාලාව - අංක 102


සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් පවත්වන ලද කණිෂ්ඨ උපදේශක පාඨමාලා - අංක 102 ඉකුත් ඔක්තෝබර් 27 වන දින සමාප්ත විය.

එම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තු මධ්‍යස්ථාන යටතේ ඇති නිත්‍ය හා ස්වේච්ඡා ඒකක වෙතින් සහ පුහුණු පාසල් වෙතින් සිසු සිසුවියන් 57 දෙනකු සහභාගී වූහ. එම පාඨමාලාවේ සමාප්ති දින විසිරයාමේ පෙළපාලියේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් එම පුහුණු පාසලෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී වූ අතර, එහිදී විශිෂ්ට සාමාර්ථ ලබා පාඨමාලාවේ ප්‍රථම ස්ථානය 22 වන ගජබා රෙජිමේන්තුවට අයත් සෙ/484090 ලා/කෝ දිසානායක එස්එම්එස් යන කොනොනි විසින් හිමිකරගන්නා ලදී.









# ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සංස්කරණ පාඨමාලාව



ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර්වීඑම්එන්ඩීකේබී නියංගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ අදහසකට අනුව එම මූලස්ථානය සහ ඒ යටතේ පාලනය වන පාබල සේනාංකයන්හි කාන්තා සෙබළියන් සඳහා දින 14 ක සංස්කරණ පුහුණු පාඨමාලාවක් ඉකුත් නොවැම්බර් 13 වන දින සිට නොවැම්බර් 25 වන දින දක්වා බළඇණි පුහුණු පාසල දියතලාවේදී පැවැත්විණ. මේ සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) කාන්තා අනුබණ්ඩයෙහි නිලධාරීන් දෙදෙනක්ද සෙබළියන් 39 දෙනක්ද 12 වන පාබල සේනාංකය වෙතින් සෙබළියන් 04 දෙනක් සහ 11 වන පාබල සේනාංකය වෙතින් සෙබළියන් 05 දෙනක් සහභාගී වූහ.

මූලික යුද්ධ හමුදා පුහුණුවීම් තුළින් අනාගත යුද්ධ හමුදා අවශ්‍යතාව සඳහා කාන්තා අනුබණ්ඩයක් පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණයි. යුද්ධ හමුදා පිළිවෙත් රෙගුලාසි, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, සමාජ මාධ්‍ය භාවිතය, නායකත්වය හා ආකල්ප සංවර්ධනය, පුද්ගලික සනීපාරක්ෂාව සහ ප්‍රථමාධාර, අවි පුහුණුව සහ ජීව වෙඩිතැබීම පුහුණුවීම යනාදිය මෙහි විෂය නිර්දේශය වේ. මෙහි සමාරම්භක දේශනය සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) කර්නල් ප්‍රධාන මාණ්ඩලික කර්නල් ඩබ්ලිව්ජේ හේමචන්ද්‍ර ආර්එස්පී සහභාගී වූ අතර ඉකුත් නොවැම්බර් 25 වන දින පැවති අවසන් දේශනය සඳහා බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් ඒඑම්ජී අබේසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහභාගී විය.



# අභිමානවත් 33 වන සංවත්සරය සමරමින්



2 වන බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ 33 වන සංවත්සරය ඉකුත් නොවැම්බර් 01 වන දිනට යෙදී තිබුණි. එයට සමගාමීව එම ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් සංවිධානය කොට තිබුණේ සියලු නිලයින්ගේ සාමූහික සහභාගීත්වයෙනි.

# ලොව දකින්නට වරම් දී





232 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ එම බලප්‍රදේශයේ ඇස් පෙනීමේ දුර්වලතාවය ඇති අයවලුන්ගේ ඇස් පරීක්ෂා කර ඔවුන් හට ඇස් කණ්නාඩි ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 28 වන දින 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. තොප්පිගල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 12 ක ජීවත්වන සිවිල් වැසියන් අතුරින් ඇස් පෙනීමේ දුර්වලතා ඇති අයවලුන් 150 දෙනකු සඳහා පුලිපංචිකල් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල පරිශ්‍රය තුළ මෙම වැඩසටහ පැවැත්වූ අතර, ඒ සඳහා 12 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සහ ජෝර්ජ් ගුණරත්න සමාගම විසින් දායකත්වය ලබාදෙන ලදී.

# විදේශීය පිරිසක් මුලතිව් ප්‍රදේශයේ සංචාරයක





ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා හදාරනු ලබන විදේශීය ශිෂ්‍ය නිලධාරීන් 10 දෙනක් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් පිරිසක් ඉකුත් නොවැම්බර් 07 වන දින 68 වන පාබල සේනාංක බලප්‍රදේශයේ සංචාරයක නිරතවූහ. ඔවුන් ප්‍රථමයෙන් මුලතිව් හි ස්ථාපිත විජයග්‍රාහී රණවිරු ස්මාරකය නැරඹූ අතර, 68 වන පාබල සේනාංකයේදී ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති වෙනුවෙන් එම පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩියූ විසින් පිළිගෙන ඔවුන් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් ද පිළිගන්වන ලදී. මෙම සංචාරය සඳහා ඉන්දියාව, බංගලාදේශය, පාකිස්ථානය, නේපාලය, සෙනගාලය සහ සැම්බියාව යන රටවල් නියෝජනය කරමින් ශිෂ්‍ය නිලධාරීන් හා ඔවුන්ගේ ඥාතීහු සහභාගී වූහ.

# පළමු සංවත්සර සැමරුම අභිමානවත්ව





24 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 10 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ලෙස ස්ථාපිත කිරීමෙන් පසු එහි පළමු සංවත්සරය ඉකුත් නොවැම්බර් 23 වන දින සමරනු ලැබීය. එහිදී, අණදෙන නිලධාරී හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාළියක් පිරිනැමීමෙන් ඇරඹි සංවත්සර වැඩසටහන් අතරට අත්පන්දු තරඟාවලියක්, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් ද ඇතුළත් විය.

# වික්ටරී රෝහල අභිමානවත් 26 වන සංවත්සරය සමරයි





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් රෝහල් අතුරින් දෙවන විශාලතම රෝහල වන "වික්ටරිය"නම් ලද අනුරාධපුර යුද්ධ හමුදා රෝහල සිය 26 වන සංවත්සරය එම රෝහල් අණදෙන නිලධාරිනී මේජර් ඩීඒඑම්එන් ද සිල්වා යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සමරනු ලැබීය. එහිදී, අණදෙන නිලධාරිනිය වෙනුවෙන් පැවැත්වූ සම්මාන මුරයද, ඉකුත් ඔක්තෝබර් 14 වන දින අශෝක බාලක ළමා නිවාසයට දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමීමද, රෝහල් බෝධිය අභියස දී මියගිය රණවිරුවන්ට පිං අනුමෝදන් කරමින් හා රාජකාරි කරනු ලබන සියලුම රණවිරුවන්ට සෙත්පැතීම උදෙසා පැවති බෝධිපූජා පිංකමද සංවත්සර කටයුතු අතර ප්‍රධාන විය. තවද, රෝහල් කාර්ය මණ්ඩලයේ සුහදතාවය වර්ධනය කිරීම වෙනුවෙන් ක්‍රිකට් තරඟ මාලාවක් ද පවත්වන ලදී.

# අවශ්‍ය මොහොතේ සරණක් වෙමින්





53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ එම සේනාංක බලප්‍රදේශයට අයත් දඹුල්ල, සීගිරිය, ඉනාමලුව, දිගම්පතාන, පොල්ලත්තාව, වරාහේන, නාගලවැව, සියඹලාවැව, කිඹිස්ස, පහලවැව, වැලිහේන, කලෝගහඇළ, රොටව්ගම, හේනේවැලයාගම, පැල්වෙහෙර සහ කණ්ඩලම යන ගම්මානවල දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් 130 ක් සඳහා වියළි සළාක මලු බෙදාදීමක් සහ ආබාධිත තත්ත්වයට පත් වූ අයකු හට රෝදපුටුවක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 12 වන දින එම පාබල සේනාංක මූලස්ථානයේදී පැවැත්විණ.

53 වන පාබල සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති බ්‍රිගේඩියර් කේඑල්එස්එස් ලියනගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සත්කාරය සඳහා අනුග්‍රාහකත්වය අස්ගිරි මහා විහාරවාසී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන ශිලානන්ද ස්වාමීන් වහන්සේගේ සම්බන්ධීකරණයෙන් යුතුව සම්මාජෝති මහ තෙරණිය හා වියත් තෙරණිය ඇතුළු කොට පැමිණි වියට්නාමයේ දූත පිරිස විසින් දරණු ලැබූහ.



# කන්කසන්තුරය ඓතිහාසික තිස්ස රජමහා විහාරස්ථානයේ කඨින පූජාව



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපතිගේ මඟපෙන්වීම යටතේ ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපතිගේ අධීක්ෂණය මත කන්කසන්තුරය ඓතිහාසික තිස්ස රජමහා විහාරයේ සාම්ප්‍රදායික කඨින පූජාව එම විහාරස්ථානයේ විහාරාධිපති ගිංතොට නන්දාරාම හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් නොවැම්බර් 05 වන දින පැවැත්විණ.

# පුනරීන් ප්‍රහාරයේදී දිවිපිදූ විරෝදාර රණවිරුවන් සිහිපත් කෙරේ.





1993 වර්ෂයේ නොවැම්බර් 11 වන දින පුනරීන් ප්‍රහාරයේදී දිවිපිදූ හා රණක්ෂිතයට පත් අභීත රණවිරුවන්ට පිං අනුමෝදන් කිරීමේ සහ ආශිර්වාද එක්කිරීමේ විශේෂ බෝධිපූජා පිංකමක් යාපනය ආරක්ෂක සේනා ආඥාපති ගේ උපදෙස් මත 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මඟපෙන්වීම යටතේ ඉකුත් නොවැම්බර් මස 11 වන දින 552 වන පාබල බලසේනාවේදී පැවැත්විණ.

# මාහැඟි පරිත්‍යාගයක්

68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ අදහසකට අනුව දමිළ ජනතාවගේ සුවිශේෂී දිනයක් වන දීපවාලි දිනයට සමගාමීව එම බලප්‍රදේශය තුළ වෙසෙන අඩු ආදායම්ලාභී පවුල් 12 ක් සඳහා වියලි සලාක බෙදාදීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 12 වන දින සිදුකෙරිණ. 68 වන පාබල සේනාංකය, 593 සහ 681 වන පාබල බලසේනා මෙන්ම ඒ යටතේ පාලනය වන ඒකක විසින් මෙම සත්කාරය සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.



තවද, චේනාවිල් 1 වන කොටස පුදුකුඩිඉරිප්පු යන ලිපිනයේ පදිංචි කලෙවේල්වම් පත්මිණි යන අයගේ නිවසෙහි වහලයේ අළුත්වැඩියාව සඳහා අවශ්‍ය උලුකැට පරිත්‍යාග කිරීමටද 3(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් කටයුතු කරනු ලැබිය.

# ඒකක තතු සොයා සංචාරයක





11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් නොවැම්බර් 06 සහ 07 යන දෙදින තුළ 3(සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිරීක්ෂණ සංචාරයක නිරතවිය. 3(සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අණදෙන නිලධාරී විසින් එහිදී සේනාංකාධිපති උණුසුම් අයුරින් පිළිගත් අතර, එම ඒකකයේ ඉටුකරන රාජකාරී පිළිබඳ සේනාංකාධිපති දැනුවත් කිරීමට ද කටයුතු කරන ලදී. සේනාංකාධිපති සිය සංචාරයේදී එම ඒකකයේ හටපිරිස් අමතන්නට කටයුතු කළ අතර, එම හටපිරිස් රාජකාරී කරන ස්ථාන හා පිදුරුතලාගල සම්ප්‍රේෂණාගාරය ද ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය.

# සංචාරයක මතක සටහන්





532 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීඩීඑස්එම් අල්විස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ඉකුත් ඔක්තෝබර් 06 වන දින 19 ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයේ සංචාරයක නිරත වූයේය. එම ඒකක අණදෙන නිලධාරී මේජර් බීජ්කේඅයිකේ බෝගොඩ ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ ගෞරවනීය පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි බලසේනාධිපති එම හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.

# 682 වන පාබල බලසේනාධිපති ඒකක සංචාරයක



682 වන පාබල බලසේනා මූලස්ථානය ඉකුත් ඔක්තෝබර් 26 වන දින යටපත් කිරීමට ප්‍රථම එහි බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඩබ්ලිව්කේ රොහාන් ආර්එස්පී යූඑස්පී විසින් ඉකුත් ඔක්තෝබර් 25 වන දින 3(සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ සහ 6 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ සංචාරයක නිරත වන ලදී. එහිදී, ඒකක අණදෙන නිලධාරීන් විසින් බලසේනාධිපති හට සම්මාන මුරයක් පිරිනමා ගෞරවාන්විතව පිළිගත් අතර, බලසේනාධිපති විසින් ඒකක හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මඟින් රණවිරු දූදරුවන්ගේ සුබසාධනය උදෙසා දිවයිනේ විවිධ ප්‍රදේශවල පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන අතර, ඒ සඳහා යුද්ධ හමුදා නොවන අයවලුන්ගේ දරුවන් හටද අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසා දී ඇත. එම පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයන්හි වර්ෂ අවසාන විවිධ ප්‍රසංග රැසක් පසුගියදා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.



# විරු කැකුළු
## දරුවන්ගේ හපන්කම්





මැනිං ටවුන් විරු කැකුළු පෙර පාසල



අනුරාධපුර විරු කැකුළු පෙර පාසල



ගාල්ල විරු කැකුළු පෙර පාසල



පල්ලේකැලේ විරු කැකුළු පෙර පාසල



පනාගොඩ විරු කැකුළු පෙර පාසල




මින්නේරිය විරු කැකුළු පෙර පාසල



ඉපලෝගම විරු කැකුළු පෙර පාසල



දියතලාව විරු කැකුළු පෙර පාසල

# දිවි නැගුමට අත්වැලක්




11 වන පාබල සේනාංකයේ හා ඒ යටතේ ඇති පාබල බලසේනා මූලස්ථාන/ඒකකයන්හි රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් හා සිවිල් සේවක මහතුන් 100 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 09 වන දින මධ්‍යම පාලාත් සහා සංකීර්ණ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සංවිධානය වූ මෙම වැඩසටහන සඳහා විශේෂ බලකා සේවා වනිතා ශාඛාවේ ලේකම් ප්‍රසාදිනී ජයසිංහ මහත්මිය, 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, සේවා වනිතා සාමාජිකාවෝ ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශය යටතේ රාජකාරී නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් සහ සිවිල් සේවක මහතුන් 100 දෙනකු සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වයට යම් සහනයක් ලබාදීමේ අරමුණින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 22 වන දින දියතලාව පිහිටි ගෝල්ෆ් සමාජශාලා පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය.




# පාසල් උපකරණ සහ ශිෂ්‍යත්ව ප්‍රදානයක්





ශ්‍රී ලංකා සංඥා බලකායේ 80 වන සංවත්සරයට සමගාමීව සහ ලෝක ළමා දිනය නිමිත්තෙන් එම බලකා සේවා වනිතා ශාඛාව මගින් ශ්‍රී ලංකා සංඥා බලකා සාමාජිකයන්ගේ පවුල්වල අධ්‍යාපනය ලබන සිසුන් 112 දෙනකුගේ ප්‍රයෝජනය සඳහා සුභසාධන වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් මස 26 වන දින පවත්වනු ලැබීය.

මේ සඳහා රුපියල් මිලියන 9ක පමණ මූල්‍ය අනුග්‍රාහකත්වය *PrintXcel" Atlas Axillia Company* යන පුද්ගලික සමාගම් සහ සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් පිරිනමනු ලැබීය. උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවෙහි සභාපතිනී නාලිනී රත්නායක මහත්මියගේ ආරාධනයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය. එහිදී, මන්නාරම ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියෙහි යෙදී සිටියදී වර්ෂ 1999 දී රට වෙනුවෙන් දිවිපිදූ 3 සංඥා බලකායට අයත් වීරෝදාර රණවිරුවකුගේ පේරාදෙණිය වෛද්‍ය පීඨයේ තුන්වන වසරේ අධ්‍යාපනය ලබන දියණියක් වෙත ඇයගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් වනතුරු මසකට රුපියල් 10,000.00 බැගින් වූ ශිෂ්‍යත්වයක් ද පිරිනමන ලද අතර, එසේම 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් පාසල් සිසුන් සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය සහ අභ්‍යාස පොත් ඇසුරුම්ද මෙහිදී බෙදාදෙන ලදී.

උත්සව අවස්ථාවේ එම පාසල් සිසුන්ට ඉංග්‍රීසි භාෂා ක්ෂේත්‍රයේ අධ්‍යාපනය සඳහා මනා පිටුවහලක් වන "තක්සලාව" අධ්‍යාපනික අන්තර්ජාල සහ ජංගම යෙදුම සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් නිල වශයෙන් එළිදැක්වීම ද සිදුකෙරිණි. වැඩසටහන අවසානයේදී "තක්සලාව" අධ්‍යාපනික මෘදුකාංගය නිර්මාණය කරන ලද සාමාජිකයින් ඇගයීමට ලක්කරමින් ඔවුන් වෙත සහතිකපත් ප්‍රදානය කිරීමද සිදුවිය.

# රණවිරු පවුලක් වෙත නව නිවසක්





දොම්පේ, ඉන්දොලමුල්ල ප්‍රදේශයේ පදිංචි දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන පවුලක් සඳහා නව නිවසක් ඉදිකිරීම වෙනුවෙන් මුල්ගල් තැබීමේ උත්සවයක් ආගමික වතාවත් මධ්‍යයේ ඉකුත් නොවැම්බර් මස 28 වන දින පැවැත්විණි. එහිදී, අභාවප්‍රාප්ත රණවිරුවකුගේ භාර්යාවක් වන චංචලා චාන්දනී මහත්මිය වෙත මෙම නව නිවස ඉදිකරදෙනු ලැබීය. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ උපදෙස් පරිදි සිංහ සමාජයේ මූල්‍ය අනුග්‍රාහකත්වය මත එම ඒකකය මගින් මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබූ අතර, යුද්ධ හමුදා භටපිරිස්හි ශ්‍රම දායකත්වය මත නිවසේ සම්පූර්ණ ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලැබේ. එම උත්සව අවස්ථාවට යුද්ධ හමුදා නිලධාරීන්, සෙසු නිලයින්, පත්රක දාබරේ මහතා සහ සිංහ සමාජයේ සාමාජික සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව





ඉංජිනේරු බලකා කර්නල් සේනාවිධායකගේ අදහසකට අනුව එම බලකා සේවා වනිතා ශාඛාව වෙතින් සිදුකරනු ලබන සුබසාධක කටයුතු වඩාත් පුළුල්ව සිදුකිරීමේ අරමුණින් යුතුව ඒ සඳහා අවැසි මුදල් රැස්කිරීමේ පරමාර්ථයෙන් සංවිධානය කෙරුණු සංගීත ප්‍රසංගයක් ඉකුත් ඔක්තෝබර් 21 වන දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී පැවැත්විණ. ඒ සඳහා චන්දිමාල් ප්‍රනාන්දු ප්‍රමුඛ සංගීත කණ්ඩායම විසින් සංගීතය සැපයූ අතර, ජනප්‍රිය කලාකරුවන් 16 දෙනක් ඊට සහභාගී වූහ. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ සහ ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශම්මි ජයවර්ධන මහත්මියද එක්වූහ.

# ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව

අපොස (උසස් පෙළ) විභාගය ඉහලින් සමත් දූදරුවන් සිව්දෙනකු සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි වෙලගෙදර මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ එහි සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් ඔක්තෝබර් මස 19 වන දින පැවැත්විණ. මෙහිදී, එක් අයකු සඳහා රුපියල් 25,000.00 බැගින් ශිෂ්‍යත්ව තුනක් සඳහා පොන්ටේරා ආයතනය වෙතින් රුපියල් 75,000.00 ක මූල්‍ය පරිත්‍යාගයක් සිදුකළ අතර, ගැමුණු හේවා රෙජිමේන්තු හිටපු සාමාජිකා මුම්තාස් මහත්මිය විසින් රුපියල් 25,000.0 ක දායකත්වයක් ද දරණ ලදී.



තවද, 2023/2024 වර්ෂයේ අපොස (සා/පෙළ) විභාග සඳහා පෙනී සිටීමට නියමිත දරුවන් වෙනුවෙන් පාසල් පොත් ලබාදීම ද එම සිසුන් හා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සිටින සෙනින් භට ජීවිතය සාර්ථක කරගැනීම සඳහා ඉතා වටිනා දේශනයක් ද එහිදී පැවැත්විණ.

# යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





අභිමංසල 11 කඹුරුපිටියෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීමේ සංචාරයක් පසුගිය නොවැම්බර් 19 වන දින යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියංගා වික්‍රමසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. ඒ සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක්ද යුද්ධ හමුදා අධ්‍යක්ෂක ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ අධිපති ඇතුළු නිලධාරීන් ද සහභාගී වූහ. එහිදී, එම නේවාසික රණවිරුවන් හට අත්‍යවශ්‍ය පැවති ඇඳුම් කට්ටල පිරිනැමීමටද කටයුතු කෙරිණ.

# විශේෂ බලකා සේවා වනිතා ශාඛාව





විශේෂ බලකාය යටතේ රාජකාරි නියුතු සෙසුනිලයින්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ මාතෘත්වය බලාපොරොත්තුවෙන් සිටින බිරින්දෑවරුන් හට තම මාතෘත්වයට එළැඹීමෙන් පසු අවශ්‍ය වන භාණ්ඩ කට්ටල පරිත්‍යාග කිරීමේ උත්සවයක් ඉකුත් නොවැම්බර් 04 වන දින විශේෂ බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙම මාහැඟි කටයුත්ත සඳහා විශේෂ බලකායේ බලකාධිපති මෙන්ම 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනෝජා පීරිස් මහත්මිය ඇතුළු සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව





ලෝක ළමා දිනයට සමගාමීව සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව වෙතින් සංවිධානය කළ විරුදරු ශිෂ්‍යත්ව ප්‍රදානෝත්වයක් එම බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් ඔක්තෝබර් 24 වන දින පැවැත්විණ. එහිදී, දරුවන් 44 දෙනකු සඳහා පාසල් උපකරණ ලබාදුන් අතර, 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා වැඩිම ලකුණු ලබාගන්නා ලද සිසුන් 05 දෙනකු සඳහා රුපියල් 10,000.00 බැගින්ද, අ.පො.ස සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා විශිෂ්ට සාමාර්ථ ලබාගනිමින් දක්ෂතා දැක්වූ දරුවන් සඳහා පිළිවෙලින් රුපියල් 15,000.00 ක් සහ රුපියල් 20,000.00 බැගින් ද ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රජිතා ජයසූරිය මහත්මිය සහභාගී වූවාය.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව





මෙවර ලෝක ළමා දිනය නිමිත්තෙන් වෛද්‍ය බලකා සාමාජිකයින්ගේ දූවා දරුවන් වෙනුවෙන් සංවිධානය කෙරුණු සැණකෙළියක් හා 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් හට ත්‍යාග ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 29 වන දින පැවැත්විණ. වෛද්‍ය බලකා සේවා වනිතා සභාපතිනි විශේෂඥ වෛද්‍ය ඒ නිල්මිණී ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවති එම වැඩසටහනේදී 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් 46 දෙනකු හට ත්‍යාග පිරිනැමුනු අතර, වයස 12 ට අඩු දූවා දරුවන් සඳහා ළමා සැණකෙළියක්ද පැවැත්විණ. වූ දරුවන් 150 ක පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම විචිත්‍රවත් වැඩසටහන සඳහා එහි සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ රැසක් ද සහභාගී වූහ.

## සේවා බලකා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස චන්ද්‍රිකා රාජපක්ෂ මහත්මිය ඉකුත් ඔක්තෝබර් 20 වන දින සුබ මොහොතින් සිය තනතුරෙහි වැඩ අරඹනු ලැබුවාය.

## යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව



යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ඉරේෂා දිල්රුක්ෂි මහත්මිය ඉකුත් නොවැම්බර් 07 වන දින සුබ මොහොතින් රාජකාරී අරඹනු ලැබුවාය.

# කෘෂි හා පශු සම්පත් සේවා වනිතා ශාඛාව






ගාල්ල රත්දෙණිගම කණිෂ්ඨ විද්‍යාලය වෙත පාසල් පොත් සහ ජල පිරිපහදු උපකරණ පිරිනැමීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 06 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ෂෙහානි ප්‍රනාන්දු මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එම සේවා වනිතා ඒකකයේ තවත් ප්‍රජාසත්කාරයක් ලෙස පැවැත්වූ මෙම වැඩසටහන සඳහා එහි සාමාජිකාවෝ රැසක්ද එක්වූහ.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ අදහසකට අනුව එම බලකාය යටතේ රාජකාරී කරනු ලබන නිලධාරී, සෙසුනිල හා සිවිල් සේවක මහත්වරුන්ගේ පවුල්වල සිටින විශේෂ අවශ්‍යතා පවතින අයවලුන් වෙනුවෙන් සුබසාධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව මාතලේ ප්‍රදේශයේ පදිංචි ගන්නොරුව ශ්‍රීලවියාඉ පුහුණු පාසලෙහි රාජකාරී කරනු ලබන ටීජීඑස් ආරියවංශ යන සිවිල් සේවක මහත්මාගේ බිරිඳ වෙනුවෙන් සත්කාරයක් සිදුකරන ලදී. ඇයගේ දකුණු කකුලේ ඇතිවූ තුවාලයක් හේතුවෙන් සිදුකරන ලද ශල්‍ය කර්මයකින් දණහිසට පහළ කොටස ඉවත්කර ඇති බැවින්, ඇයගේ දෛනික කටයුතු සිදුකර ගැනීම අපහසුව තිබිණ. එබැවින් ඇයගේ පහසුව පිණිස ඈ වෙත රෝද පුටුවක් පරිත්‍යාග කිරීම විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් වන චන්දිමා ඒකනායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 02 වන දින එම පුහුණු පාසල් පරිශ්‍රයේදී සිදුකෙරිණ.

# පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව





ලෝක ළමා දිනයට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාව වෙතින්ද ඉකුත් ඔක්තෝබර් 21 වන දින වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය. මෙම උත්සවයේදී රත්මලාන අන්ධ විද්‍යාලයේ ළමුන් 90 දෙනකු වෙනුවෙන් ආහාර, ඖෂධ සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇතුළත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පාර්සල් පරිත්‍යාග කෙරිණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ බලකාධිපතිගේ මගපෙන්වීම සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ප්‍රියන්තිකා ද සොයිසා මහත්මියගේ මගපෙන්වීම යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී, ළමුන් වෙනුවෙන් දිවා ආහාර වේලක් පිරිනැමීමටද විනෝදාත්මක වැඩසටහනක් පැවැත්වීමටද කටයුතු කෙරිණ.

# පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ 72 වන සංවත්සර දිනයට සමගාමීව එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හිමාලි නියංගොඩ මහත්මියගේ අදහසකට අනුව කොළඹ කොටුව සිංහ සමාජය හා අනිකුත් අනුග්‍රාහක භවතුන්ගේ පරිත්‍යාග සමගින් අඩු ආදායම්ලාභී පවුල්වල වෙසෙන දියතලාව, කහගොල්ල මධ්‍ය මහා විද්‍යාලයේ දූ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 26 වන දින එම විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ.

# කාන්තා බලකා සේවා වනිතා ශාඛාව





කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශ්‍යාමලී විජේසේකර මහත්මියගේ මගපෙන්වීම මත එම බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ ගැබ්ගෙල පිළිකා සහ පියයුරු පිළිකා පිළිබඳ දැනුම්වත් කිරීමේ දේශනයක් ඉකුත් ඔක්තෝබර් 23 වන දින බොරැල්ලේ පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලෙහි ප්‍රසව හා නාරි වෛද්‍ය අංශයේ කපිතාන් වෛද්‍ය දිනූෂිකා චන්ද්‍රසිරි එම දේශනය මෙහෙයවනු ලැබුවාය. මේ සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථානය සහ 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය යටතේ රාජකාරි නියුතු නිලධාරිනියන් සහ සෙබළියෝ රැසක් සහභාගී වූහ.

# පුරෝගාමී බලකා සේවා වනිතා ශාඛාව





පුරෝගාමී බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ අභිමංසල 11 කඹුරුපිටිය සුවසහන නිකේතනයේ නේවාසික ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා ඉකුත් නොවැම්බර් 18 වන දින සංචාරයක් සිදුකරනු ලැබූහ. එහිදී, රණඝිතයට පත් රණවිරුවන් හට තේ පැන් සංග්‍රහයක් ලබාදීමට සහ ඔවුන් වෙනුවෙන් වියළි සලාක ඇතුළත් ත්‍යාග පාර්සල් බෙදාදීමක්ද සිදුකරන ලදී. මෙම අවස්ථාවට පුරෝගාමී බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එච්ජී ස්වර්ණලතා මහත්මිය ඇතුළු එම සේවා වනිතා සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

# ජාතික ආරක්ෂක බළමුළු සේවා වනිතා ශාඛාව





ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු සේවා වනිතා ශාඛාවේ උප සභාපතිනි ජිවන්ති කීර්තිනාථ මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම ඒකක සාමාජිකාවෝ පිරිසක් පසුගිය නොවැම්බර් මස 18 වන දින පාන්ගොල්ලෙහි පිහිටි අභිමංසල 3 සුවසහන මධ්‍යස්ථානයෙහි සංචාරයක නිරත වූහ. එහිදී, රණඝිතයට පත් රණවිරුවන් සඳහා ප්‍රනීත දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමුණු අතර, එම සුවසහන මධ්‍යස්ථානයෙහි ප්‍රයෝජනය සඳහා රුපියල් 50,0000.00 ක පමණ වටිනාකමකින් යුත් සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ විදුලි උපකරණ ප්‍රදානයක්ද සිදුකරන ලදී. රණඝිතයට පත් රණවිරුවන් 31 දෙනකු සඳහා රුපියල් 4,500.00 ක පමණ වටිනාකමින් යුත් ත්‍යාග පාර්සලය බැගින් ද එහිදී ප්‍රදානය කෙරිණ. නේවාසික රණවිරුවන්ගේ මානසික තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් රෙජිමේන්තු කැලිප්සෝ සංගීත කණ්ඩායම විසින් එහිදී සංගීත ප්‍රසංගයක් ද පවත්වන ලදී. ජාතික ආරක්ෂක බලමුළුවෙහි මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ඒ කීර්තිරත්න ආර්එස්පී කේඑස්පී පීඑස්සී ද මෙම අවස්ථාවට එක්විය.



# කණට ඇහුණු හිතට දැනුණු පුංචි කතාවක්...

## කියවලාම බලන්න

කෑම්ප් එකේ වැඩ කරන මාසේ ගෙවෙන විදියයි, නිවාඩුවට ගෙදර ආවම දවස් දහය ගෙවෙන විදියයි හරියට අහසයි පොළොවයි වගේ...

ගෙදර ආවම ඔරලෝසුවේ කටු වේගෙන් කැරකෙනවද කියලත් වෙලාවකට හිතෙනවා...

මට වැඩට යන්න බිරිඳ මගේ බෑග් එක ලෑස්ති කරලා ඉවර වෙලා ඔන්න ඊලග වැඩේ පටන් ගත්තා .

"චූටි මැණිකේ ඔය සෙල්ලම් කරන එක නවත්තලා ඇවිත් අප්පච්චිට වඳින්න දරුවෝ"

ඒ මගේ ආදරණීය බිරිඳ මට සමුදෙන අවසන් හෝරාවට ලකලෑස්ති වෙන පලමු පියවරට සේන්දු වෙන මොහොතයි...

අනේ, ඒ මොකටද අම්මේ...

බබා තාම සෙල්ලම් කරනවනෙ...

මේ... කියන දේ අහලා අප්පච්චිට වඳින්න එන්න, අප්පච්චි නිවාඩු ඉවරවෙලා කෑම්ප් එකට යන්න හදන්නේ දරුවෝ...

සෙල්ලම් කර කර හිටිය පොඩි දුව එකපාරම සෙල්ලම නවත්තලා වේගෙන් මං ලගට දුවගෙන ආවේ අව්වට අවපැහැ වුන පුංචි මලක් වගේ, දුක්මුසු පෙනුමකින්...

අප්පච්චි... අප්පච්චි...

ඔයා කොහේද යන්නේ...?

ආහ්, කෝ මගේ මැණිකේ... කෝ එන්නකෝ මගේ ලගට ටිකක්...

දුවගේ වෙනස්ම හැඟීම මට දැනුන නිසාම ඇයව ආදරයෙන් තුරුල් කරගනිමින් ඔලුව අතගෑවා...

කෝ ඉතින් කියන්නකෝ

අප්පච්චි... කොහේද දැන් මාව දාලා යන්න හදන්නේ...

හුරුපුරුදු හුරතලෙන් එහෙම කියද්දි මගේ පපුව පිච්චිලා ගියා වගේ දැනුනා...

"අප්පච්චි යනවා මගේ රත්තරං දෝණිට ටොෆි ගන්න, සල්ලි අරන් එන්න..."

ඉතින් කොහේටද යන්නේ අප්පච්චි...

සල්ලි ගේන්න වැඩට යන්න එපැයි මැණිකේ...

ඉතින් අප්පච්චි කෑම්ප් එකට ගිහින් වැඩ කරලා සල්ලි අරන් ඉක්මනට එන්නම්කෝ...

අනේ ඔය කිව්වට අප්පච්චි ඉක්මනට එන්නේ නෑනේ...

කලිනුත් ඔහොම තමයි කිව්වේ...

මං දන්නවනේ හැටි...

දැන් ගියාට පස්සේ ගොඩ දවසකින් තමයි ආයේ එන්නේ...

ගිය මාසේ දහම් පාසලේ තෑගි දෙන උත්සවේට ආවෙත් නැහැ...

එදා හැමෝම කිව්වා අප්පච්චිත් ඉස්සර දහම් පාසලේ හැම පාරම පන්තියේ පලවෙනියා වුණාලු...කෝ ඉතින් ඊත් එදා අප්පච්චිට වඳින්න මගේ ලග හිටියේ නෑනේ...

හරි නරකයි...

ආහ්හ්... මගේ රත්තරං දුව මං වගේ වෙන්න එපැයි කෝමත්...

මං දන්නවා දූ මේ පාර වගේම ලබන පාරත් ඔයා දහම් පාසලේ පලවෙනියා වෙනවා කියලා...

මගේ දුවනෙ ඔයා...

අප්පච්චි නරක නෑ මගේ මැණිකේ...

මං ගිහින් ඉක්මනට එන්නම්කො...

හරි ඉතින් කෑම්ප් එකට යන්නේ නැතුව අප්පච්චිගේ අර පර්ස් එකේ තියෙන කාඩ් එක දාලා බැංකුවෙන් සල්ලි අරගෙන එහා පැත්තේ තියෙන ෆුඩ් සිටි එකෙන් අපි ටොෆී ගමුකෝ...

අනේ, ඒ කාඩ් එකෙන් සල්ලි ඉවරයිනේ මගේ මැණිකේ...

නැත්නං මං යන්නේ නැතුව එහෙම කරනවනෙ දරුවෝ...

ඉතින්, අප්පච්චිට කෑම්ප් එකට යන්නම ඕනද?

ඔව්, මැණිකේ...

කෑම්ප් එකට නොගිහින් කොහොමද මගේ දෝණිට ටොෆී ගන්න සල්ලි ගේන්නේ...

පැහැච්ච කෙල්ල ටිකක් කල්පනා කරලා හරිම ආදරෙන් මගේ මූණ දිහා බලාගෙන හැඟුම්බරව මෙහෙම කියනවා...

හරි, එහෙනම් අප්පච්චි අපි මෙහෙම කරමු...

කොහොමද දුවේ...

මට ටොෆී ඕනේ නැහැ...

මං ආයේ කවදාවත් ටොෆී ඉල්ලන්නෙත් නෑ...

අප්පච්චි දුර යන්නේ නැතුව මගේ ලඟට වෙලා ඉන්න...

ඒ හොඳටම ඇති...

ටොෆීවලට වැඩිය බබාට අප්පච්චිව ඕනේ...

පුංචි හිතට දැනෙන වේදනාවක තරම...

ඇස්වලට ඉනුව කඳුළු බිංදු හොරෙන්ම පිහිදගෙන මගේ දෝණිව තවත් හයියෙන් තුරුලු කරගත්තේ...

"මේ තමයි මගේ එකම සම්පත" කියලා මටම හෙමිහිට කොඳුරගෙන...

පැත්තකට වෙලා මේ සේරම අහන් හිටිය බිරිඳත් අහක බලාගෙන කඳුළු පිහිද ගත්තේ මං දකී කියලා....

මං දන්නවා දුව පොඩිකමට කියපු දේවල් වගේම ඊටත් වඩා නොකියවන ලොකු දෙයක් ඔයාගේ කඳුළුවලත් හැංගිලා තියෙනවා කියලා...

ඒත් මොනා කරන්නද නෝනේ,

මේ තමයි අපේ ජීවිතවල හැටි...

හැමදාමත් ආදරයෙන්

සටහන :- සැරයන් සිල්වා ඩබ්ලිව්.ඩබ්ලිව්.එන්
යුධ හමුදා පොලිසිය

# දෙවියනි ඔබට කුමටද රුපියල් කාසි

යනවිට නුවර මම වාහනයේ දිනක
දෙවොලක් දුටුව මග අනුහස් ඇති නේක
ලොකුවට පෙනෙන්නට ඒගි ඉදිරියෙ තැනක
පිංකැටයක් තනා තිබුණා තාප්පෙක

මැදිකර පිංකැටය දෙපසට වී ඉන්න
හිඟනුන් බොහොයි තාප්පයට පිටදුන්න
රිංගා ඔවුන්ගේ අතරින් වදිමින්න
මිනිසුන් කාසි දානව කැටයට ඔන්න

කිසිවක් නොදත් පොඩි දරුවන් ළඟ හිඳුවා
ගැහැණුන් සිටිනවා ලෙස අහරක් නැතුවා
අතපය නොමැති තව සමහරු දත හියවා
හිඟමන් යදිනවා මොන මොනවද කියවා

නවතා යාන වාහන හදිසියේ යන
බැහැලා ඒයින් දුවලාවිත් පඩුරු ගෙන
බලලා දෙවොල වැඳලා ආපසු හැරෙන
මිනිසුන් කිසිත් නොබලයි යාචකයො ගැන

කලවම් වෙලා පිරිමින් ගැහැණුන් පෙළට
හිඟමන් යදින හැටි දුටුවම දුකයි මට
කාසිය ඔබන විට පිංකැටයේ කටට
හිස්වන බව දැනේ හිඟනුන්ගේ කුසට

අභිමුව වැතිර කෝවිල් පන්සල් අසල
යාචක වෙසින් ඉන්නා මිනිසුන් නොමල
නොබලා උන් දිහා පින් ගන්නට නිමල
නොපෙනෙන දෙවිවරුන් ගැන ඇයි මේ කුහුල

හැමදෙන වදින් පුදබිම් අසලින් යනෙන
සිය දහසක් දනන් පිංකැටයට දමන
රුපියල දෙකට අනුහස් නොමිලේ බෙදන
මිනිසුන් වත්ද ඉන්නේ දෙවිවරු වෙසින

සමාජයේ සමහරු හිඟමන් යදින
ඇත්තට වඩා බොරු කරනව බොහෝ දෙන
තෝරාගන්න මේ බව අපහසු බැවින
මිනිසුන් සිටි දෙවියන් හට පඩුරු දෙන

දියුණුව තකා දෙවොලේ පන්සලේ මතු
පිංකැට ඇතත් අරමුණ බොරුවක්ය හෙතු
පඩුරක් නොදැම්මත් පිරිසිදු ලෙසට සිතු
සිතිවිලි තිබේ නම් ඒ පින හැමට නතු

දහඩිය හලා විඳදුක් කරදර රාසී
ජීවත් වෙන්නෙ සමහරු දිවියම වෙහෙසී
හැති මිනිහගෙන් අරගෙන පොඩි පොඩි වාසී
දෙවියනි ඔබට කුමටද රුපියල් කාසි

- ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ



# වැස්ස



මිනිසාට මනෝවිද්‍යාත්මක උත්තේජනයක් වන වැස්ස යනු ස්වභාවදහමේ අපූර්ව දායාදයක්. එය පාලි භාෂාවෙන් වස් ලෙසත් සංස්කෘත භාෂාවෙන් වරුෂා ලෙසත් සිංහල භාෂාවෙන් වැස්ස ලෙසත් ව්‍යවහාරයේ යෙදෙයි. කාලගුණික විපර්යාස තුළින් විවිධ ධාරිතා වලින් යුතු තද වැසි මෙන්ම ගිගිරුම් සහිත වැසි ද ඇතිවන අතර, ඒ තුළින් මිනිසාට මහත් කරදර ගෙන දෙයි. වැස්ස වැඩි වූ විට කුඩා දිය පහරවල් වැඩි වී ගං වතුර තත්ත්වයක් ඇති වෙයි. මහ පොළව සලිත කරවා කඳු හෙල් නාය යයි. ගහ කොළ සතා සිව්පාවා මෙන්ම ගෙවල් දොරවල් විනාසකර දමයි. විටෙක වැස්ස යනු අපූරු චමත්කාරජනක සිතුවිලි මැවෙන නැවුම් අත්දැකීමකි. වැස්ස මිනිසාට බොහෝ සමීපය. ඒ නිසාම වැස්ස ගැන බොහෝ කවි ගී නිර්මාණ ද බිහි වී තිබේ. එවැනි නිර්මාණ අතර වැස්ස පාදක කරගෙන නිර්මාණ කරුවන් විසින් ගී පදවැල් මුමුණමින් නැවුම් වූ මිහිරි සත්සර නාද රටා ඔස්සේ විවිධාකාර වැසි වර්ග හඳුන්වා දී ඇත්තේ සංගීත රසාස්වාදය උපරිමයෙන් සැපයීමට මිස නියමාකාර වූ වැසි වර්ග වෙන් වෙන්ව හඳුන්වාදීමට හැකිවන පරිදි ද නොවේ. ගැමි ව්‍යවහාර අනුව හා වැස්සේ ස්වභාවය අනුව ද වැසි වර්ග විවිධාකාර වේ.

## පිණිපොද වැස්ස

පිණි පොද වැස්ස සියලු වැහි අතර කුඩාම වැස්ස වේ. පිණි බිඳු සෙමින් සෙමින් බිම පතිත වීම පිණි පොද වැස්ස සේ සැලකේ. දවසේ ඕනෑම වෙලාවක පිණිපොද වැස්ස බලාපොරොත්තු විය නොහැකිය. බොහෝ වේලාවට පිණි වැස්ස අලුයම් කාලයේ සිට හිමිදිරිය දක්වා දක්නට ලැබේ. ජල ගැලීමක් සිදු නොවන අතර පිණි දිය එකතුකරන අයටනම් මෙම වැස්ස ඉතාම වටියි.

## හිරිපොද වැස්ස

හිරිපොද වැස්ස නමින් මෑත කාලයේ බොහෝ කවි ගී මෙන්ම චිත්‍රපටයක් ද නිර්මාණය වී තිබේ. හිරිපොද වැස්ස ඉතා සෙමෙන් හා කුඩා වැහි බිඳු ඇද හැලෙන්නකි. මහත් විනාශයක් හෝ පීඩාවක් ගෙන ඒමට තරම් හිරිපොද වැස්ස නපුරු හෝ අකීකරු නැත. වැස්සේ ආශ්වාදය විඳ ගැනීමට ඉඩ සලසයි. හිරිපොද වැස්ස විටෙක ප්‍රේමනීයයි. විටෙක ආනන්දජනක හැඟීම් උපදවයි. "සඳ රැජිනියෙ ඔබ හිරිපොද වැස්ස අරන් මගෙ යහනට එනවද මිහිඳුම් සළු අතරින්" ලෙස ප්‍රේමාන්විත ගීත තුළින් විටෙක අපව වෙනත් ලෝකයකට ගෙනයයි. තව ද මේ අතර සිහින් වැහි බිඳු සහිතව තුනීවට ඇද හැලෙන වැස්ස කඩු පොද වැස්ස ලෙස හැඳින් වේ.

## මල් වැස්ස (ආශිර්වාද වැහි)

මේවා යම් විශේෂ අවස්ථාවකදී අහඹු ලෙස පතිත වන වැහි වේ. ජන විශ්වාසය හා ජන ව්‍යවහාර මත පදනම්ව විශේෂ අවස්ථාවකදී ඇද හැලෙන වර්ෂාව ආශිර්වාද වර්ෂාව ලෙස අතීතයේ සිටම අර්ථ දක්වා ඇත. ඒ අතර යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු වෙත වර්ණ ප්‍රදානය කිරීමේ අවස්ථාවලදී ඉතා කෙටි කාලසීමාවක් තුළ වර්ෂාවක් පතිත වීම ද ඉතා සුලභ වේ. සුබ කටයුත්තක් ආරම්භ කිරීමකදී මෙන්ම මංගල හා අවමංගල කටයුත්තකදී වුව ද මෙලෙස අහඹු ලෙස ඇද හැලෙන වර්ෂාව ආශිර්වාද වැසි ලෙස අරුත් නැගෙයි.

## ධාරාණිපාත වර්ෂාව

බොහෝ වේලාවක් එක දිගටම නොනවත්වා ඉහළ සනත්වයකින් පතිතවන වැස්ස ධාරාණිපාත වර්ෂාව ලෙස හැඳින් වේ. මෙම වර්ෂාවේ දී කුඩා දිය පහරවල් මඩ මිශ්‍රිත වර්ණයෙන් වර්ණ ගැන්වී විශාල දිය දහරා තෙක් වර්ධනය වී චණ්ඩ වූ මහා දිය කඳක් සේ මුහුදට ගලා බසියි. කුඩයකින් ආවරණයක් ගෙන වුව ද නොතෙමී ගමන් ගැනීම ඉතා අසීරුය. "සැමදා නියං එක දා වැහි වලාවේ" යන යෙදුම පැහැදිලි අරුත් නගන්නේ හැමදාම නියං සමයෙන් පීඩා විඳ එම නියං සමය අවසන්ව ධාරාණිපාත ලෙස ඇද හැලෙන වර්ෂාවෙන් සම්පූර්ණ නියං සමයම ආවරණය වන තරමට වැස්ස ඉතා දැඩි බවයි.

## මොර සූරන වැස්ස

මොර සූරන වැස්ස දැඩි සේ බිම පතිත වන වැහි බිඳු වලින් පිරුණු එකකි. මොර යනු අතු රිකිලි අග හට ගන්නා පලතුරකි. ඒවායේ නටු ඉතා ශක්තිමත්ව හටගෙන තිබේ. මඳ සුළඟකට හෝ වර්ෂාවකට මොර ගෙඩි නටුවෙන් පහසුවෙන් ගැලවී නොයයි. එනිසා මොර සූරන වැස්ස ලෙස හඳුන්වා ඇත්තේ ශක්තිමත් මොර ගෙඩි පවා බිම හෙලීමට තරම් ප්‍රමාණයෙන් විශාල වැහි බිඳු වැටෙන බවයි.

## දොඹ සූරන වැස්ස

දොඹ සූරන වැස්ස ද මොර සූරන වැස්ස මෙන් ඉතා දැඩිව ඇද හැලෙන්නකි. දොඹ යනු ප්‍රමාණයෙන් මොර ගෙඩි වලට වඩා විශාලය. ශක්තිමත්ව නටුවෙන් සවි වී ඇති අතර සුළඟකට හෝ වර්ෂාවකට පහසුවෙන් බිම පතිත නොවේ. එබැවින් මෙයින් ද අර්ථ දනවන්නේ දොඹ සූරන වැස්සේ ප්‍රමාණය හා තද බවය.

## අනෝරා වැස්ස

අනෝරා වැස්ස ද බොහෝ වේලාවක් නොනැවතී වහින වැස්සකි. නමුත් මෙම අනෝරා යන වචනයේ අරුත් පිළිබඳ සිංහල වියරණ ඇදුරන් විසින් විවිධ මත ඉදිරිපත්කර තිබේ. අනෝරා යන වචනයේ නොනැවතී යන අරුත ද ගැබ් වී තිබේ. අනෝරා යනු අවේලාවේ යන අරුත් ද ඇති බවට තවත් මතයක් ඇත. හෝරා යනු වේලාවයි. "අන් + හෝරා" = අනෝරා ලෙස පද සන්ධි වී ඇති බවත් "වරා" යනු වර්ජනය හෙවත් නැවැත්වීම යන අරුත මත "අන + වරා" = නොනැවතී යන අරුත් ඇති බවත් වියරණ ඇදුරන්ගේ මතයයි. ඒ කෙසේ වෙතත් අනෝරා යන යෙදුම අප ජන ව්‍යවහාරයේ දුලබ නොවේ.

## අකල් වැහි

අකල් වැහි යනු වැසි නොලැබෙන කාලයේ අහඹු ලෙස ඇද හැලෙන වර්ෂා වේ. මෙය මෝසම් වැස්ස ලෙස ද හඳුන්වයි. අප රටේ විවිධ ප්‍රදේශවලට මෙලෙස අකාලයේ මඳ වැසි මෙන්ම තද වැසි ද පතිත වේ.

## නා කපනා වැහි

ජන ව්‍යවහාරයේ නිතර යෙදෙන නා කපනා වැස්ස ද දැඩිව ඇද හැලෙන්නකි. මේ ගැන බොහෝ ගීත නිර්මාණ ද බිහි වී ඇත. තද වැස්සෙන් එකතු වන වැහි දිය දහරා කඳු හෙල් මුඳුනේ සිට පහළට ගලා එන්නේ නාගයකු ඇදී එන්නා සේය. ජල පහරක් කිසි විටෙක එක එල්ලේ පහළට ඇද හැලෙන්නේ ද නැත. එමෙන්ම නාය යෑම ද මෙම වැස්සේම අතුරු ප්‍රතිඵලයක් ලෙස සිදු වේ. නාගයකු ඇදී එන්නා සේ දිය දහරා පහළට ඇදී එන තරමට වර්ෂාව චණ්ඩ වීම නා කපනා වැහි සේ ජන ව්‍යවහාරයයි.

## අසනි වැහි

අසනි යනු අකුණු වේ. අකුණු සමග වැහි ඇද හැලෙන්නේ බක් මාසයේ හෙවත් අප්‍රේල් මාසයේදීය. අප්‍රේල් මාසයේ දිවයිනේ අන් ප්‍රදේශවලට කෙසේ වෙතත් මධ්‍යම කඳුකරයටනම් අකුණු සමග වැහි ඇද හැලීමේ අඩුවක් නැත. අසනි වැහි වැටීම පිළිබඳ තවත් ආදරණීය පබැඳුමක් උපුල් ශාන්ත සන්නස්ගල විසින් නිර්මාණය කල 'ආදරණීය වස්සානය' චිත්‍රපටයේ ද හමු වේ.

**"ඔබ දුර නිසා ගගණාත පුරා අසනී වැසි වැටුනා**
**සිත දුක් දරා සුසුමින් වසා කඳුළුත් හදක් හැඩුවා"**

අතීතයේ වැස්සට වැහි දෙයියෝ ලෙස ද පැරැන්නෝ ගෞරවාර්ථයේ පිහිටුවා හැඳින්වූහ. ඒ තරමට වැස්ස ගැන බොහෝ විශ්වාස හා ඇදහිලි ද පැවතුනි. පුරාණ ගැමියෝ වැස්ස වසින තුරු බලා සිටීයේ වගා කටයුතු ආරම්භ කිරීමටය. වැහි පිරිත් කියා වර්ෂාව අපේක්ෂා කලේ නියං සමයෙන් බැට කෑ ගම්මානවල ජනයා වේ. එමෙන්ම සීතල උඳුවප් මහේ හෙවත් දෙසැම්බර් මාසයේ ඇදහැලෙන වැසි වර්ග කිපයක්ද ඇත. නත්තල් කුණාටුව 'හත්දාමාරිය, උඳුකුඩ වැස්ස' ලෙස හැඳින්වෙන අතර මේවාට ගැමියෝ මහත් බියක් දක්වති. මේ අතර අකාල වැහි, නින්දා වැහි, වැනි ව්‍යවහාරත් දුවන වැහි, තුන්දා වැහි, හත්දා වැහි, කඳුළු වැහි වැනි සාම්ප්‍රදායික වැහි ද ප්‍රචලිතය. වැස්ස විටෙක සුන්දරය. තවත් විටෙක බියකරුය. වැස්ස විටෙක මිනිසාට නරක කලදසාවක් ද උදාකර දෙයි. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට විසූ බ්‍රිතාන්‍ය ජාතික මේජර් තෝමස් ස්කිනර් විසින් රචිත *"Fifty Years in Ceylon"* "ලංකාවේ පනස් වසක්" නම් කෘතියේ වැසි සමයේ ඇති වූ උවදුරු පිළිබඳ විග්‍රහ කරන අතර බ්‍රිතාන්‍ය ජාතික කපිතාන් ෆ්‍රැන්සිස් ඩෝසන් හට මැලේරියා උවදුර උග්‍ර වී මරණාසන්න වූ වග ද එම කෘතියේ විස්තරකර තිබේ.


වැස්ස යනු මිනිසාගේ ජීවිතයට ඉතාම සමීපතමක් දක්වන්නකි. වැස්ස ස්වභාවධර්මයේ නිර්මාණයක් වුව ද මිනිසා විසින් මිනිසාගේම මානසික සුවතාව හා තෘප්තිය වෙනුවෙන්ම මැවූ සෘංගාරාත්මක ප්‍රේමනීය වැස්සක් ද තිබේ. ඒ හාදු වැස්සයි. අනෝරා වැහි නා කපනා වැහි ධාරාණිපාත වැහි වලින් පීඩා විඳීමට අප මහත් සේ මැලිකමක් දැක්වුව ද හාදු වැස්සේ තෙමෙන්නට කවුද අකමැති. අනෝරා හාදු වැස්සකට මැදි වූ විටෙක අවට පරිසරය අඳුරු වලාවෙන් වැසී අකුණු ගසමින් විද්‍යුත් සම්බන්ධතාවයෙන් ආලෝකමත් වී බොහෝ පාරිසරික විපර්යාසය සිදු වී තිබුණ ද, මොහොතකට හෝ හාදු වැස්සෙන් මිදීමට සිත් නොදෙයි.



සටහන :-
මේජර් එම්පී සාලින්ද පීඑස්සී
ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

# නොදකින

# පැතිකඩ



විශ්වය ආරම්භයේ සිට මිහිතලය මත ජීවය හට ගන්නේ කෙදිනද, එදින සිට මේ මිහිමත බිහිවූ සෑම ජීවියකුම තම සිතැගි හැඟීම් ප්‍රකාශ කරගැනීම සඳහා භාෂාව ද මේ පොලොව මත ජීවයේ පැවැත්ම උදෙසා බිහි වී ඇත. එලෙස බිහි වූ භාෂාව මිනිසා සේම පරිණාමයට භාජනය වී, ආගම මත පදනම්ව ශාස්තෲවරුන් විසින් ශ්ලෝක, ස්තෝත්‍ර හා ගාථා ආදී ලෙස සංවර්ධනය වී අද දක්වාම විකාශනය වෙමින් පවතී. භාෂාවක් යනුවෙන් අදහස් කරන්නේ යම්කිසි රූපකයක්, අක්ෂරයක් ලෙස ගෙන හැර දැක්වීමය. එය මිනිසාගේ දිව, තොල්, දත්, හකු සහ උගුර හා නාසය ආධාරයෙන් පිට කරනු ලබන ශබ්ද තරංග යම් රිද්මයානුකූල කලාවකට අනුව සකසා උච්චාරණය තුළින් මුවෙන් පිටවන ශබ්ද තරංග හඳුනා ගැනීම වූ කලී භාෂාවක් ලෙස හැඳින්විය හැක. එලෙස බිහිවූ භාෂාව අද වනවිට මුළු විශ්වය පුරා විවිධ වූ ජාතීන් රැසකගෙන් සමන්විතව මිහිතලය මත මිනිසාගේ සන්නිවේදනය උදෙසා මිනිසා විසින්ම භාෂා සියගණනක් නිර්මාණය කරගෙන ඇත.

පුරාතන ශිලා යුගයෙන් ඇරඹි මිනිස් ජීවයද පරිණාමය වෙමින් විශ්වය පුරා විහිදෙමින් තම බලය මත පදනම්ව පෘථිවි භූතලය බෙදා වෙන්කරගනිමින් බලය තුළ ගොඩනැගුණු ශක්තිය උපයෝගී කරගනිමින් තම බලය පතුරවනු ලැබ ඇත. මේ ලෝකය මත ජීවත් වූ මිනිසුන් විසින් එකම භාෂාවක් කථා නොකරන බැවින් මුල්කාලීනව මිනිසා විසින් යම් රූප සංඥා සටහන් ඇතුළත් ලේඛන හා හස්ත සංඥා ක්‍රම මගින් ඔවුනොවුන්ගේ අදහස් ප්‍රකාශ කරගන්නට ඇති බවට උපකල්පනය කරනු ලබයි. එහෙත්, මිනිසාගේ පරිණාමයත් සමග මිනිසුන් විසින් ගෝත්‍රික තත්වයෙන් මිදී ශිෂ්ටසම්පන්න ජාතීන් බවට පත්වීම හා තාක්ෂණික වශයෙන් දියුණු වී ලෝකය පුරා සංචාරයේ නිරතව විවිධ භාෂා, සංස්කෘතීන්, ආගම් හා ජාතීන් මෙන්ම භූගෝලීය සාධක අධ්‍යයනය කරමින් යන ගමනේදී ඔවුන් ඒ වෙනුවෙන් පොදු සන්නිවේදන මාධ්‍ය ලෙස වර්තමානයේදී ඉංග්‍රීසි භාෂාව ඒ සඳහා තෝරාගෙන ඇත. 14 වන සියවසේදී පමණ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ලෝකයේ බොහෝමයක් රටවල් තම අණසක යටතේ යටත්විජිත ලෙස තබාගනිමින් පාලනය කිරීමෙහිලා බොහෝ රටවල ඉංග්‍රීසි භාෂාව ප්‍රචලිත වීම මේ තත්ත්වය උදෙසා ඉවහල් වී ඇති බව සිතීම සාධාරණ වනු ඇත.

ඒ අනුව ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අධ්‍යනය කිරීමේදී ආරම්භයේ පටන් ඉංග්‍රීසි භාෂාවෙ අක්ෂර අද ඔබ මෙම ලිපිය කියවන අවස්ථාව දක්වාම අක්ෂර 26 කින් සමන්විත වී ඇත. ඔවුන් මුළු ලෝකය පුරා සැරිසැරුවද එම අක්ෂර 26 නොවෙනස්ව පවත්වා ගැනීමටත්, තම භාෂාව තුළ නොමැති විදේශීය වචන ඔවුන්ගේ අක්ෂරවලට අනුකූලව සකසාගෙන භාවිතා කිරීමටත් බුද්ධිමත්ව කටයුතු කර ඇත. උදාහරණයක් ලෙස බ්‍රිතාන්‍ය වැසියන් වනාන්තර සඳහා Forest ලෙස භාවිතා කරනුයේ රුක්ස ගස් සහිත වනාන්තරවලට වුවද ඉන්දියාව හා ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල කටුපඳුරු සහිත ලඳු කැළෑ සඳහා ඔවුන් විසින් ඔවුන්ගේ භාෂාවෙන් ඒ සඳහා නමක් නිර්මාණය කිරීමේදී අළුතින් භාෂාවට අකුරක් එක්කිරීමට සිදුවන හෙයින් ඉන්දියානු වැසියන් විසින් කටුපඳුරු සහිත ලඳු කැළෑ සඳහා භාවිතා කළ ජංගලි නමැති

වචන උච්චාරණයම ගෙන Jungle ලෙස ව්‍යවහාරයට ගෙන ඇත. එහිදී, ඉන්දියාව නමැති නාමය භාරත දේශයට එකතු වී අත්තේ INDIYANS ස්වදේශිකයා යන්න ඉංග්‍රීසි භාෂා ව්‍යහාරයේ ප්‍රතිඵලයක් වශයෙනි. වර්තමානයේදී INDIYAN යන නාමය වෙනුවට භාරත දේශය ලෙස නම් කිරීමට යාමේදී ඉන්දියානු මධ්‍යම රජය දේශපාලනික වශයෙන් ඉතා බරපතල ප්‍රශ්නසහගත තත්වයකට මුහුණ පා ඇත.

ඉහත කරුණු අධ්‍යයනය කිරීමේදී අතීතයේදී බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ලොව පුරා සංචාරය කරන අතරතුර ඉතා උපායශීලී ලෙස තම භාෂාව යටත් විජිතවල ප්‍රචලිත කරලීම සිදුකලේ යම් අනාගත සැලැස්මක් මතද යන්න නිශ්චිතවම ප්‍රකාශ කළ නොහැකි නමුත්, වත්මනෙහි එහි ප්‍රතිඵලය ඔවුහු බුක්තිවිඳිමින් සිටිති. එනම් කලක් බ්‍රිතාන්‍ය යටත් විජිත ලෙස පැවත පසුව නිදහස ලබාගත් රටවල සියලු රාජ්‍යතාන්ත්‍රික කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරලීමයි. සමහර වචන ලෝකය පුරා සන්නිවේදනය වීමේදී වැරදි අවබෝධයක් ඇතිවීම ඉංග්‍රීසි භාෂාවේ වරදක් නොවූවද ප්‍රකාශ කරන්නා තමන් විසින් ප්‍රකාශ කරන කාරණය සිදුවීම හෝ සටහන්කරණයේ අන්තර්ගත වචන පිලිබඳව ඇති අනවබෝධය තුළ විශාල අර්බුද නිර්මාණය වීම වැලැක්විය නොහැකි කරුණකි. එලෙස, ගෝලියකරණය හමුවේ සන්නිවේදනය වන හෝ ප්‍රචාරණය වන වචනවල සැබෑ අර්ථකථනය ජනගත නොවූ සුප්‍රසිද්ධ වචන දෙකක් ගැන විමසා බලමු.

## 1. යුද්ධය

යුද්ධය යන්නෙන් ජන විඥානය තුළ අදහස් කරන්නේ එහි නියමාකාර නිර්වචනය හෝ අන්තර්ජාතික පැහැදිලි කිරීම නොවනු ඇත. එනිසා ඔවුන් විසින් එහි බරපතලකම ගැන නොදැන පොදු සමාජය තුළ ව්‍යවහාරය සඳහා පමණක් යුද්ධය ලෙස ප්‍රකාශ කර ඇත. එහෙත්, වාර්තාකරණයේදී හෝ මාධ්‍ය ප්‍රචාරණයේදී ආරක්ෂක අංශ සාමාජිකයකු හෝ ජනමාධ්‍යකරුවකු විසින් ශ්‍රී ලංකාවේ දශක 03 කට ආසන්න කලක් පැවති අවත්‍රීවුනා අරගලය පිළිබඳව යුද්ධයක් ලෙස නිර්වචනය කිරීම බරපතල වරදකි. සත්‍යය වශයෙන්ම ශ්‍රී ලංකවේ වසර 30 කට ආසන්න කලක් පැවතියේ අවත්‍රීවුනා අරගලයකි. ජාත්‍යන්තර පැහැදිලි කිරීමට අනුව අවත්‍රීවුනා අරගලයක් යනු එක් රටක් දෙකඩවීමට යන උච්චතම අවස්ථාව හෝ නියමාකාර යුද්ධයක මූලාරම්භය ලෙසත්, නියමාකාර යුද්ධය වනාහි රටවල් දෙකක් අතර සිදුවන සන්නද්ධ අවි ගැටුම් ප්‍රහාර ලෙස හඳුන්වා දී ඇත. එය එසේවීනම් රටක් ජාතියක් ලෙස අප විසින් දැන හෝ නොදැන හෝ කර ඇති වරදේ බරපතලකම වැටහෙන විට සියල්ල සිදුවී අවසන් වී තිබෙනු ඇත. මන්දයත් ජාත්‍යන්තර ප්‍රජාව මෙවැනි වතාවරණයන් අවබෝධ කරගන්නේ සන්නිවේදනය තුලින් මුදාහරින වචනය මිස භූමියේ සැබෑ පාරිසරික තත්ත්වය නොවේ. ශ්‍රී ලාංකිකයින් විසින් යුද්ධය ලෙස සන්නිවේදනය කිරීම හරහා විදේශීය ජාතිකයින් සිතනුයේ ශ්‍රී ලංකාව යනු මැදපෙරදිග සහ යුරෝපා හා අප්‍රිකා ආදී රටවල මෙන් භූමියෙන් වෙන්වූ එකම භූමියක පිහිටි රටවල් දෙකක් ලෙසය. එහිදී, සිංහල ජාතිකයින් විසින් දෙමළ ජාතිකයින්ගේ රට බලහත්කාරයෙන් යුද වැදී අත්පත් කරගෙන ඇති ලෙසය. ඔවුන් එලෙස සිතනුයේ, අප විසින් සන්නිවේදනය කරන යුද්ධය යන වචනය තුළ ඇති අර්ථය තේරුම්ගෙනය. එම පදනම තුළ විදේශීය ජනයාගෙන් බහුතරයක් දෙමළ ජනතාවට බලවත් අසාධාරණයක් සිදුවී ඇති ලෙස සිතමින් අධාර උපකාර කරනුයේ දෙමළ ලේබලයෙන් පෙනී සිටින ත්‍රස්තවාදී කණ්ඩායම්වලට බව ඔවුන් නොදනී. එසේනම්, ඒ සඳහා වගවිය හා වගකිව යුත්තන් කවුරුන්ද යන්න ඔබ විසින් තවදුරටත් අවබෝධ කරගතයුතුව ඇත.

## 2. ඩයස්පෝරාව

ඩයස්පෝරාව යන වචනයද අප සියලු දෙනාම මෙන් ඕනෑ තරම් අසා ඇතිවාට කිසිදු සැකයක් නොමැත. එහෙත්, මෙම වචනයෙහි නියමාකාර තේරුම දන්නේ කොපමණ ස්වල්ප ප්‍රමාණයක්ද යන්න විමසුවහොත් එදිනට ඔබ පුදුම වනු නියතය. ඒ අන් කිසිවක් නිසා නොව මෙම වචනය පිළිබඳව ඔබ විමසන අයගෙන් බහුතරයක් එහි අන්තර්ගත තේරුම නොදැන සිටීමය. ඩයස්පෝරාව යන වචනය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එහි ඓතිහාසික පසුබිම හමුවන්නේ පුරාණ ග්‍රීසියෙහි විසූ යුදෙව් ජාතිකයින්ට ඔවුන් තම ශුද්ධ වූ භූමිය ලෙස සැලකූ ජෙරුසෙලම සහිත ප්‍රදේශය වර්තමාන ඊශ්‍රායලය හැරදමා යන්නට වූයෙන් ඔවුන් විසින් *Diaspora* වචනයෙන් "තුළින්" නැතිනම් "එහා"නමැති අදහසද Speiro යන්නෙන් විසිර සිටීම හෝ ව්‍යාප්තිය යන අදහස සහිතව ඔවුනට ජීවත් වීමට නිජබිමක් අවශ්‍යයි යන සංකල්පය පෙරදැරිව ඩයස්පෝරාව යන වචනය භාවිතාකර ඇත. එය

“
පුරාතන ශිලා යුගයෙන් ඇරඹි මිනිස් ජීවයද පරිණාමය වෙමින් විශ්වය පුරා විහිදෙමින් තම බලය මත පදනම්ව පෘථිවි භූතලය බෙදා වෙන්කරගනිමින් බලය තුළ ගොඩනැගුණු ශක්තිය උපයෝගී කරගනිමින් තම බලය පතුරවනු ලැබ ඇත.
”

එසේනම් ශ්‍රී ලාංකික දෙමළ වැසියන් හට මෙරට තුළ දේශපාලන ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආගමික යන සියලුම සාධක භුක්තිවිඳීමට නීත්‍යානුකූල පරිසරයක් හිමිව තිබියදී දෙමළ ඩයස්පෝරාව ලෙස අනවබෝධය තුළ එල්බගෙන අප විසින් සන්නිවේදනය කරන කරුණු ඔස්සේ සවන්දෙන්නන් අවබෝධ කරගන්නේ වැරදි අර්ථකතන මතය. මෙයට ප්‍රධානතම හේතුව වනුයේ ගෝලීයකරණය හමුවේ මෙම වචන අප භාෂාව තුළට පිවිසීමත්, අප විසින් එයාකාරයෙන්ම ඒවා වැළඳ ගැනීමත්ය. වර්තමානයේදී ගෝලීයකරණය හමුවේ විශේෂයෙන් ආසියාතික රටවල ජීවත් වන නොයෙකුත් ජාතීන්ට අයත් විවිධ ආගම් අදහන තරුණ කණ්ඩායම්වලින් සහ මාධ්‍ය වාර්තාකරණයේදී මෙවැනි අතපසුවීම් හරහා ජාත්‍යන්තර වශයෙන් රටකට එල්ලවන අභියෝග සුළුපටු නොවනු ඇති බව අකමැත්තෙන් වුවද අවබෝධ කරගත යුතුව ඇත.

*සො/3ය00139*
*මා/ සැරයන් අමරපාල ඒඑන්*
*බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය*



# සයුරෙන් එතෙරට

# යුද හමුදා මෙහෙවර

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරිවල නිරතවීමට හැකිවීම රාජ්‍යයකට ජාත්‍යන්තර වශයෙන් ලැබිය හැකි ඉහළම ගෞරවයකි. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමසාධක මෙහෙයුම්වලට සහභාගී වී සිදුකරන සුවිශේෂී කාර්යභාරය නිසාවෙන් ජාත්‍යන්තරයේ කීර්තිනාමයක් අත්පත්කර ගෙන ඇත. එමෙන්ම හමුදා සෙබළකුට එක්සත් ජාතීන්ගේ සාම හමුදාවේ සේවයේ යෙදීම අභිමානයක් මෙන්ම තම සේවා කාලය තුළ ලබාගත හැකි සුවිශේෂී වෘත්තීමය අවස්ථාවකි. ශ්‍රී ලංකාව මේ වනවිට සාමසාධක රාජකාරීන්හි අභිමානවත් ලෙසත් මහත් ගෞරවයක් ලබමින් රටට කීර්තියක් ලෙස ජාත්‍යන්තරයේ සේවයේ යෙදෙමින් සිටී.

ශ්‍රී ලංකාව ත්‍රස්තවාදය පරාජය කිරීමේදී ලබාගත් පන්නරය එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී ඉටු කරමින් මේ වනවිට ජාත්‍යන්තරයේදී උපයෝගී කරගනිමින් සිටී. එහි ප්‍රතිඵලයක් වශයෙන් යුද්ධ හමුදාව විසින් පමණක් ඒක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී ආරම්භ කළ දින සිට මේ දක්වා හයිටි, ලෙබනන්, අබෙයි, නිව්යෝර්ක්, දකුණු සුඩානය, මධ්‍යම අප්‍රිකානු ජනරජය, මාලි , බටහිර සහරා, බුරුන්ඩි, එරිත්‍රියා සහ චැඩ් ජනරජය වෙත යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසු නිලයින් 20520 ක ප්‍රමාණයක් සාමසාධක රාජකාරී සඳහා යොදවා ඇත. මේ වනවිට මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායීතාවය ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථානය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් 20 ක් සහ සෙසු නිලයින් 223ක්, ලෙබනන් රාජ්‍යයේ නිලධාරීන් 10ක් සහ සෙසු නිලයින් 115ක්ද දකුණු සුඩාන් රාජ්‍යයේ නිලධාරීන් 17ක් සහ සෙසු නිලයින් 49ක් ද සාම සාධක රාජකාරි සඳහා යෙදී සිටිති. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමසාධක රාජකාරි බලතල යටතේ ඇති හයවන සහ හත්වන පරිච්ඡේදයට අනුව මෙලෙස ශ්‍රී ලාංකීය භටපිරිස් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා යෙදවෙයි. එදා මෙදා තුර එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීවලින් පමණක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මෙරරට ඇමරිකානු ඩොලර් මිලියන තුන්සියයකට ආසන්න විදෙස් විනිමය ප්‍රමාණයක් උපයා දී ඇත. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් නිලධාරීන් සහ සෙසු නිලයින් ඒක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා මේ වනවිට යොදවා ඇත.

පසුගිය දශක 6 තුළ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් ගෝලීය වශයෙන් මහත් පරිණාමයකට ලක්විය. එක්සත් ජාතීන්ගේ සාමසාධන හමුදාවට විශාල වශයෙන් භටපිරිස් දායකත්වය ලබා දී ඇත්තේ දකුණු ආසියානු කලාපීය රටවල්ය. එහිදී, පකිස්තානය, බංගලාදේශය, ඉන්දියාව සහ නේපාලය විශාල ලෙස භටපිරිස් සපයනු ලබයි. ශ්‍රී ලංකා යුද හමුදාවට

ආවේනික වූ සංග්‍රාමික රාජකාරී සඳහා කාන්තා සෙබළියන් එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා සහභාගී කරවීම සුවිශේෂී වේ. තවද, 1955 වසරේ සිට ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවේ සාමාජික රටක් වන අතර, 1957 වසරේ නිලධාරීන් කිහිප දෙනකු ලෙබනන් රාජ්‍යයේ හමුදා නිරීක්ෂකයින් වශයෙන් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා සහභාගී වී ඇත.

වර්තමානය වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් 434 දෙනෙක් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීවල නිරතව සිටී. ඔවුන් මාණ්ඩලික නිලධාරීන් සහ හමුදා නිරීක්ෂණ නිලධාරීන් වශයෙන් සාමසාධක රාජකාරීවල නිරතව ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සාමාජිකයින් දැනට හයිටි, ලෙබනන්, දකුණු සුඩානය සහ මාලි ආශ්‍රිතව එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් 4ක් සඳහා සහභාගී වී රාජකාරී කරනු ලබයි. ඒ අතරින් වඩාත් අභියෝගාත්මක රාජකාරීන් සඳහා ස්ථානගත වී ඇත්තේ මාලි රාජ්‍යයේ ස්ථාපිත සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමයි. දකුණු සුඩානයේ බෙන්ටි හි ස්ථාපිත මට්ටමේ රෝහල දෙවන මට්ටමේ රෝහල, මූලස්ථාන ආරක්ෂක භට කණ්ඩායම - ලෙබනන් සහ බටහිර සහරා හි එක්සත් ජාතීන්ගේ හමුදා නිරීක්ෂණ නිලධාරිනියක් ද රාජකාරී සිදුකරනු ලබයි.මේ දක්වා ඉටුකර ඇති එම මෙහෙයුම්වලින් ඇමරිකානු ඩොලර් මිලියන 298කට අධික විදේශ විනිමය ප්‍රමාණයක් මෙරටට උපයා දී ඇත.

ඒසේම, මේ වනවිට යුද්ධ හමුදා නවෝත්පාදනයන්ට නව සන්ධිස්ථානයක් එක්කරමින්, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා භටපිරිස් විසින් නිෂ්පාදනය කරන ලද යුනිකෝන්/යුනිබෆල් රථ බටහිර අප්‍රිකාවේ, මාලි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා යොදවා සිටින ශ්‍රී ලාංකික සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමේ (Combat Convoy Company) පරිහරණය සඳහා යොදවා ඇත.

මෙලෙස නිර්මාණය කරන ලද යුනිකෝන්/යුනිබෆල් සහ උපකරණ එක්සත් ජාතීන්ගේ පිරිවිතරයන්ට අනුකූල වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ආනයනික අමතර කොටස් භාවිතා කරමින් නිෂ්පාදනය කර ඇති හෙයින් රජයට සහ යුද්ධ



හමුදාවට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකිය.

එසේම බිම්බෝම්බ ආදී උවදුරු සඳහා ඔරොත්තු දෙන පරිදි මෙම වාහන සහ උපකරණ, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ භටපිරිස්හි තාක්ෂණික විශේෂඥතාවයෙන් දේශීයව නිෂ්පාදනය කරන ලද අතර, මීට පෙර ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයන් වෙනුවෙන් විදෙස් රටවලින් ආනයනය කළ යුද රථවල තාක්ෂණයන් ඉක්මවා ගිය තාක්ෂණයක් සහිතව නිෂ්පාදනය කිරීමට ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය දායක වී තිබේ. එලෙස නිෂ්පාදනය කරන වාහනවල ගුණාත්මකභාවය සලකා බලමින් ශ්‍රී ලංකා පොලිසියද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ලවා සාමසාධක රාජකාරී සඳහා අවශ්‍ය වාහන නිෂ්පාදනය කර ගනු ලැබීය.

එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්වලදී මේ වනවිට ශ්‍රී ලංකා යුධ හමුදාවේ එක් නිලධාරියකු සහ සෙසු නිලයින් අට දෙනෙකු හයිටි සහ මාලි රාජ්‍යන්හිදී එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් අතරතුර දිවි පිදූ අතර නිලධාරීන් හය දෙනකු සහ සෙසු නිලයින් 31 දෙනකු සිය රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබා ඇත. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්වලදී මියගිය පළමු ශ්‍රී ලංකා යුද හමුදා සෙබලා 6 ශ්‍රීලපාහ හි සෙ/310553 කෝප්‍රල් විජේසිංහ එච් එම් විය. 2005 මාර්තු 20 වන දින හයිටියේ පෙටිට්ගෝවේ හි සාම සාධක මෙහෙයුමේදී ත්‍රස්තවාදී කණ්ඩායමකින් එල්ල වූ ප්‍රහාරයකින් ඔහු මිය ගියේය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය හයිටි රාජ්‍යයේ 2014 සිට 2015 දක්වාත්, මාලි රාජ්‍යයේ 2018 වසරේ සිට මේ දක්වාත්, ලෙබනන් රාජ්‍යයේ 2010 වර්ෂයේ සිට මේ දක්වාත් දකුණු සුඩාන් රාජ්‍යයේ 2014 වසරේ සිට මේ දක්වාත් සාමසාධක රාජකාරී සඳහා යොදවා ඇති අතර, මේ වනවිට මාලි රාජ්‍යයේ, ලෙබනන් රාජ්‍යයේ සහ දකුණු සුඩාන රාජ්‍යයේ නිලධාරීන් 19ක් සහ සෙසු නිලයින් 52ක් සාමසාධක රාජකාරී සඳහා යොදවා ඇත.

එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා ඉතා ඉක්මනින් යෙදවීමට හැකි භටපිරිස් 2500ක ප්‍රමාණයක් පුහුණු කිරීමේ හැකියාව කුකුලේගඟ සාමසාධක මෙහෙයුම පුහුණු ආයතනය සතුව පවතී. ඒසේම එක්සත් ජතීන්ගේ ස්ත්‍රී/පුරුෂ සමාජභාවයේ සමතුලිතතා නිර්ණායකය අනුව සාමසාධක රාජකාරී සඳහා යෙදවිය හැකි දක්ෂ කාන්තා නිලධාරීන් සහ සෙසුනිලයින්ද යුද්ධ හමුදාව සතුව ඇත.

තිස්වසරක් පුරා පැතිරුණු කුරිරු යුද්ධය මානුෂීය ස්වරූපයකින් නිමාකරමින් ලොව විශාලතම ප්‍රාණ ඇපකරුවන් මුදාගැනීමේ මෙහයුම සිදුකළ ශ්‍රී ලංකාව මේ ඉටුකරමින් සිටින්නේ අන්තර්ජාතික සබඳතා පවත්වාගෙන යාම වෙනුවෙන් වූ පැවරී ඇති භාරදූර වගකීමක් ඉටුකිරීමකි. එහිදී, ශ්‍රී ලංකාවේ හමුදාවන් ලොව මානුෂීයම හමුදාවන් වශයෙන් තමන් ලද විරුදාවලිය ඒලෙසින්ම ආරක්ෂා කරගනිමින් විදේශයකදී වුවද තම රණකාමීත්වය ආරක්ෂා කරමින් තම රටේදී අත්කර ගත් අත්දැකීම් ජාත්‍යන්තර සාමය ස්ථාපනය කිරීම වෙනුවෙන් යෙදවීමට අවස්ථාව උදාරතර සැබැවින්ම අගය කළ යුතුමය.



සටහන-:
ලුතිනන් දිලංක ගුණතිලක
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය




# "මරණය මාරුකරගත් කෝප්‍රල් සමරසිංහගේ කතාව"

කෝප්‍රල් සමරසිංහ මෙහි කතානායකයාය. මතුගම ප්‍රදේශයේ පදිංචි විවාහකයකු වූ ඔහු එවක සේවය කරන ලද්දේ මුලතිව් හි ස්ථාපිතව තිබූ 9 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අනුයුක්තවය. අදින් වසර 28කට එපිටදී ඔහු සිය හිතවතකු සමග මරණය හුවමාරුකරගත් අහඹු සිදුවීමක් පිළිබඳව දුලබ කතාව මෙලෙස දිගහැරෙනුයේ ජීවත්වීම යනු සැබැවින්ම ආශ්චර්යයක් බැව් කියාපාමිනි.

1996 වසර වනවිට උතුරු බිමෙහි ත්‍රස්තවාදය බොහෝ සෙයින් උඩුදුවා තිබූ කාලවකවානුවකි. එය කොතෙක්ද යත් ආරක්ෂක හමුදා සහ ත්‍රස්තවාදීන් අතර ද්වන්ධ සටන් පැවති අවස්ථා කෙතෙකුත් තිබිණ. මේ අතර තුර මුලතිව් හි පිහිටි යුද හමුදා කඳවුර ත්‍රස්තවාදීන්ගේ වැඩිපුරම ඇල්ම බැල්ම වැටුණු තැනක් බවට පත්වන්නට වූයේ නිතැතිනි. හුදෙකලාව පැවති මුලතිව් කඳවුරෙහි සියලු ක්‍රියාන්විත හා පාලන අවශ්‍යතා සපිරුණේ ගුවනින් හා මුහුදිනි. එහිදී, ද වැඩිපුර භාවිතා වූයේ ගුවනය. ඒ අනුව සතියකට තුන්වතාවක් පමණ කඳවුරට ගුවන් ගමන් සිදුවූ අතර ඒ සඳහා බොහෝවිට පැමිණියේ MI-17 වර්ගයේ හෙලිකොප්ටර්ය. නිවාඩු අවසන්ව පැමිනෙන හටපිරිස්ද ආහාර ද්‍රව්‍යද රැගෙන මුලතිව් වෙත එලෙස පැමිණෙන ගුවන්යානා නිවාඩු යන අයද අනෙකුත් පාලන අවශ්‍යතාද සපුරාලමින් යලි පිටත් වනුයේ ඇසිල්ලකිනි. එහිදී, එම යානා විනාඩි කිහිපයකට වඩා එහි නවතා නොතැබෙන අතර පැවති අවිනිශ්චිත වටපිටාව හමුවේ ඕනෑම මොහොතක කඳවුරට මෝටාර් ප්‍රහාරයක් එල්ලවීමේ හැකියාව පැවතීම ඊට හේතුවයි. එහිදී ගුවන් යානා තුනක් කඳවුරට පැමිනෙන නමුත් ඉන් වරකට ගොඩබස්වන ලද්දේ එක් යානයක් පමණි. විනාඩි කිහිපයක් තුළ එය පිටත්වූ සැනින් දෙවන තෙවන යානා අනුපිළිවෙලින් එහි ගොඩබැස්සවීම සිදුකරයි. ක්‍රියාන්විත බිමෙහි ජීවිත ආරක්ෂාව හා පරෙස්සම වෙනුවෙන් දැරූ බරතැබීම කොතෙක්ද යන්න ඉන් පැහැදිලි වේ. පැවති අධික රාජකාරී ස්වභාවය හේතුවෙන් මුලතිව් කඳවුරෙහි සියලු සාමාජිකයින්ගේ නිවාඩු බොහෝ සෙයින් සීමා විය. එහිදී, අවිවාහකයින්ට ඒ සඳහා මාස 4 - 5 ක් පමණ කාලයක් ගෙවිය යුතු වූ අතර විවාහක අයකුට පවා නිවාඩුවක් ලබාගැනීමේදී සැලකිය යුතු කාලයක් බලා සිටීමට සිදුවිය.

1996 ජූලි 07 වන දින සවස කෝප්‍රල් සමරසිංහ නිවාඩු ලැබ මුලතිව් කඳවුරෙන් පිටත්වනුයේ තවත් නිවාඩු හිමි වූ සගයින් පිරිසක්ද සමගිනි. ඒ වන විටත් මාස තුනක් ඉක්මවා ගෙවූ ඒකාකාරී කඳවුරු ජීවිතයෙන් දින

කිහිපයකට හෝ එලෙස අත්මිදෙන්නට ලැබීම පිළිබඳව ඔහුගේ සිතේ මතුවෙමින් තිබුණේ ආශ්වාද ජනක හැඟීමකි. එදින සවස 5 පමණ වන්ම සුපුරුදු ලෙසම කඳවුරට ගොඩ බෑ MI-17 වර්ගයේ හෙලිකොප්ටරයකින් ඔවුහු අනුරාධපුරය බලා පිටත්වූහ. අනතුරුව එහි සිට කොළඹ බලායන බස් රථයක නැගී කෝප්‍රල් සමරසිංහ මතුගම පිහිටි සිය නිවසට යද්දී මැදියම ඉක්මවා තිබිණ. මාස ගණනක ඇවෑමෙන් තම ස්වාමියා නිවසට පැමිණීම බිරිඳ චාන්දනී තුළ මහත් උද්දාමයට හේතුවිය. වසර දෙකක් වයසැති දියණියද සමගින් වූ ඔවුනගේ කැදැල්ල වඩාත් පරිපූර්ණවූ සමය එය බැව් ඇයට හැඟිණ.

මෙලෙස දින සති ගෙවී නොදැනීම සමරසිංහගේ නිවාඩුවේ අවසානයට එළැඹියේය. කඳවුර බලා යන දින වේලාසනින් අවදි වූ ඔහු සිය කළමනා සූදානම් කරගන්නට විය. ඒ සඳහා කලක පටන් නිවාඩු යාම් ඊම් සඳහා පමණක් භාවිතා කරනු ලැබූ රෝද සවි කරන ලද විශාල ප්‍රමාණයේ ගමන් මල්ලක් ඔහු සතුය. හමුදාවට බැඳුණු මුල් අවධියේ පටන් භාවිතයට ගන්නා එම බෑගය අව්ව සහ නිල ඇඳුම තරමටම ඔහුගේ වෘත්තියට සමීපය. ඇඳුම් පැළඳුම් එකින් එක එතුළට ඇසිරූ සමරසිංහ තම බිරිඳ විසින් සාදාදුන් අතිරස පාර්සලයක්ද එහි පැති සාක්කුවේ බහාලන ලද්දේ පරිස්සමටය. බිරිඳ චාන්දනීටද එය අතිශය කාර්යබහුල උදෑසනක් වූ අතර ඕ සැමියාගේ සත්කාර කටයුතු වෙනුවෙන් උපරිම තැනක් දුන්නාය. එදින පටන් යළිත් මාස ගණනාවක් යනතුරු සියතින් සෑදූ තේ කෝප්පයක, කෑම වේලක රස බලන්නට ඔහුට ඉඩක් නොලැබෙන බව දන්නා නිසාම ඕ සැමියාගේ රුචියට අනුව සියල්ල සකස්කර දෙන්නට වගබලා ගත්තාය.

නිවසින් නික්ම යන අවසන් මොහොත සමරසිංහට සේම බිරිඳ චාන්දනීටද හද දවන අවස්ථාවක් විය. යළිත් තම ස්වාමියා දකින්නට නම් අනිවාර්යයෙන් පසු කල යුතු මාස ගණන ගැන ඈ තුළ ඇත්තේ පැහැදිලි අවබෝධයකි. ඒ අතර කාලයද සැහැල්ලුවෙන් ගෙවා දැමීමේ අවස්ථාව ඇට නොවීය. උතුරු බිමෙහි දිනපතා පුපුරා යන සෑම බෝම්බ හඬකින්ම ඇගේ හදවතද ගිගුම් දුන්නාය. එය යුද බිමෙහි දිවිගෙවන සැමියකු සිටින සෑම බිරිඳකගේම හදවතෙහි බුර බුරා



මුලතිව් ප්‍රහාරයෙන් අතුරුදහන් වූ සැරයන් මේජර් සෝමසිංහ

නැගෙන ගිනි ජාලාවකි. සිය ගමන් මල්ලද රැගෙන නිවසින් නික්මෙන්නට සැරසුණු සමරසිංහ අවසන් වතාවටද සිය බිරිඳ චාන්දනීගේ නලලත සිඹිබේය. අනතුරුව නිවසේ සිට ප්‍රධාන මාර්ගය දක්වා වූ කිලෝමීටරයක් පමණ දුර පයින්ම ගෙවා දමන අතරේ ඔහු නිවස දිස්වන අවසාන තැනදීද යළිත් වතාවක් ආපසු හැරී බලන්නට අමතක නොකළේය. එහිදී තවමත් දොරකඩට වී බලා සිටින සිය බිරිඳගේ අපැහැදිලි සේයාව ඔහුට යන්තමින් පෙනිණ.

ප්‍රධාන මාර්ගයට පිවිසි සමරසිංහ මතුගම සිට කොළඹටත් එතැන් සිට ත්‍රිකුණාමලයටත් ගමන්කොට ත්‍රිකුණාමලය අතරමැදි කඳවුරට වාර්ථාකරන ලද්දේ එදින සවස් වරුවේය. ඒ වනවිට මුලතිව් වෙත මෙන්ම උතුරේ විවිධ ස්ථානවලට යාමට නියමිත සෙබළු බොහෝ පිරිසක්ද ඔහු මෙන්ම එහි පැමිණෙනු දැකිය හැකිවිය. එලෙස සෙබළුන් නිසි පරිදි එම කඳවුරට වාර්ථා කළ පසු එහි වූ කාර්යාලයේ සටහන් කෙරෙන අතර, අනතුරුව ඔවුන් පිළිබඳ තොරතුරු එහි තිබෙන පණිවිඩ හුවමාරු යන්ත්‍රය ඔස්සේ ඒ ඒ කඳවුරු වලටද දැනුම් දෙනු ලබයි. නිවාඩු අවසන මුලතිව් කඳවුර වෙත යාම සඳහා ත්‍රිකුණාමලයට රපෝර්තු කළ ඒ ඒ කණ්ඩායම්වලට අයත් සෙබළු සංඛ්‍යාව අනුව මුලතිව් කඳවුරේ මීලඟ නිවාඩු යන හටපිරිස් සූදානම් කිරීම සිදුකෙරේ. එහිදී, නිවාඩු ගොස් කිසිවකු නොපැමිණ සිටියහොත් (Absent) මුලතිව් හි එම සෙබළා අයත් කණ්ඩායමෙහි සෙබළකුගේ නිවාඩු යාමේ අවස්ථාව අහිමි වේ.

නිවාඩු අවසන අතරමැදි කඳවුරට පැමිණි කෝප්‍රල් සමරසිංහට එහිදී



මුලතිව් ප්‍රහාරයෙන් දිවි බේරාගත් කෝප්‍රල් සමරසිංහ

මුලතිව් වෙත යාමට නියමිත තවත් සෙබළු කිහිපදෙනකුම හමුවිය. අවිස්සාවේල්ලෙහි පදිංචි කෝප්‍රල් චන්ද්‍රගුප්ත ද ඒ අතර විය. ඔහු මුලතිව්හි බළඇණි මූලස්ථානයේ සංඥා ක්‍රියාකරුවකු ලෙස සේවය කළ අතර, ඔහු පැමිණ තිබුණේ තම විවාහයේ පළමු නිවාඩුව අවසන් වීමෙන් අනතුරුවය. එහි පැමිණි මොහොතේ පටන් ඔහුගේ මුහුණින් දිස්වූයේ දැඩි පශ්චාත්තාපයකි. අලුත ගෙනා බිරිඳ නිවසේ තනිකොට පැමිණි පළමු අවස්ථාව එය වීමත්, මුලතිව් කඳවුරට ගිය පසු නැවත ඇය දැකීමට කොතරම් දිනක් ගතවේදෝයි යන අවිනිශ්චිත බවත් ඔහුගේ එම හිත් රිදවීමට හේතු විය. මේ අතර පසුදින සවස ගුවන් මගින් මුලතිව් කඳවුර බලා යන පිරිස අතරට කෝප්‍රල් සමරසිංහගේ නමද ඇතුලත්ව ඇතිබව ඔහුට දැනගත හැකිවිය. එසේම, ඒ අතරට කෝප්‍රල් චන්ද්‍ර ගුප්තද තවත් එම කඳවුරට අයත් කෝප්‍රල් සමරසිංහ, සෙබළ ජයවර්ධන, සෝමතිලක යන අයගේ නම්ද අයත්ව තිබිණ.

අතරමැදි කඳවුරෙහි තැනක විශාල ප්‍රමාණයේ කෝන් ගසක් වූ අතර මුලතිව් කඳවුරට යාමට නියමිත හටපිරිස් ඒකරාශී වන පොදු ස්ථානය එය විය. නිවාඩුවේ දින ගණනාවක් එකිනෙකා නිදහසේ තම පවුලේ සමීපතමයින් හා ගතකළ සොඳුරු මතක දිගහැරෙන ප්‍රධානම තැන එතනය. එතැන් පටන් යළි ඇරඹෙන මුලතිව් හි අති දුෂ්කර ජීවිතය තුළ එවන් නිදහස් සතුටු සාමීචියකට අවස්ථාවක් නොලැබෙන බව ඔවුහු දනිති. එනිසාමදෝ එහි වැඩි දෙනකුගේ මුවෙහි සිගරට්ටුවක්ද වැරදුනේ නැත. කෙටි දැනුම් දීමකින් අනතුරුව පසුදින මුලතිව් බලා යාමට

සියල්ල සූදානම් කොට තබාගත් ඔවුන් එදින මැදියම වනතෙක්ම කෝන් ගහයටට වී අල්ලාප සල්ලාපයෙන් ගෙවා දැමුවේ කාලෙකින් ලැබුණ අපූරු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ගනිමිනි.

සියල්ල එලෙස සිදුවෙද්දී මුලතිව් කඳවුරේ සේවයේ නියුතු 9 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සැරයන් මේජර්වරයාද නිවාඩු අවසන්ව එදින එම අතරමැදි කඳවුරට වාර්තා කලේය. ඔහු නමින් හේමසිංහ විය. එහිදී ඔහුගේ පැමිණීම එහි සිටි එම ඒකක භටපිරිසට ඉමහත් උද්දාමයට හේතුවූහ. කලුතර සේරුවිල ප්‍රදේශයේ පදිංචි අයකු වූ සැරයන් මේජර් හේමසිංහ කටයුතු කරන ලදදේ 9 සිංහ රෙජිමේන්තුවේ ප්‍රධාන ලිපිකරු ලෙසය. විනයගරුක දක්ෂ අයකු වූ ඔහු එම ඒකකය තුළ සැමගේ ප්‍රසංශාවට බඳුන්වූ ජනප්‍රිය චරිතයකි. විශේෂයෙන්ම කෝප්‍රල් සමරසිංහ ද ඔහු යටතේ ඒකක මූලස්ථාන කාර්යාලයේ රාජකාරී නිරත බැවින් සිය ආයතන ප්‍රධානියා වූ සැරයන් මේජර් හේමසිංහ පිළිබඳ ඔහු තුළ පැවතියේද අසීමිත ගෞරවයකි.

ඒ වනවිට එදින සවස මුලතිව් බලා යන අයගේ නාමලේඛනයට කෝප්‍රල් සමරසිංහගේ නමද ඇතුලත්ව තිබුණි. ඒ අනුව සියලු බඩු භාණ්ඩ සූදානම් කරගනිමින් ඔහු පසුවූයේ සවස පැමිනීමට නියමිත ගුවන් යානය බලාපොරොත්තුවය. එහිදී, සැරයන් මේජර් හේමසිංහගේ අභිප්‍රාය වූයේද එදිනම සවස මුලතිව් බලා යාමය. නමුත් ඒ වනවිට ඔහු වෙනුවෙන් එහි ඉඩ පහසුකම් ඉතිරිව නොතිබිණ. එබැවින් ඔහු විසින් කෝප්‍රල් සමරසිංහගේ නම ඉවත්කරවා ඒ වෙනුවට තමන්ගේ නම ඊට ඇතුලත්කිරීමට කටයුතු කරන ලදී.

"සමරසිංහ තමුසෙ අද මෙහෙ ඉදලා හෙට චොපර් එකේ එනවා. මම තමුසෙගෙ නම කපලා මගෙ නම දාගෙන හවස මුලතිව් යනවා."

සැරයන් මේජර් වරයාගේ එම සෘජු ප්‍රකාශය හමුවේ ඊට එකගවීම හැර අන් යමක් සමරසිංහගේ මුවින් පිට නොවීය. විශේෂයෙන්ම ගුවන් පහසුකම් සීමිත වීම හේතුවෙන් ඇතමකුට එලෙස දින කිහිපයක්ම එහි ගතකිරීමට සිදුවන අවස්ථා කොතෙකුත් යෙදේ. කෙසේ නමුත් මුලතිව් හි දුෂ්කරතා අත්විදීමට වඩා දිනක් දෙකක් හෝ එලෙස එම අතරමැදි කඳවුරේ නතරවීමට ලැබීම කෝප්‍රල් සමරසිංහගේ ඉමහත් අස්වැසිල්ලට හේතු විය.

සවස 5 පමණ වන්නම මුලතිව් බලා භටපිරිස් රැගෙන යාමට නියමිත MI-17 වර්ගයේ හෙලිකොප්ටරයක් ත්‍රිකුණාමලයේ අතරමැදි කඳවුරට ගොඩබැසීය. එහිදී, පෙර නම් සඳහන් අයවළුන් අනුපිළිවෙලින් ඊට ගොඩවෙද්දී කෝප්‍රල් සමරසිංහ වෙනුවට සැරයන් මේජර් හේමසිංහද එම පිරිසට එකතු වූයේය. ඒ අනුව 1996 ජූලි මස 17 වන දින සවස 4.30 පමණ වෙන්ම එම පිරිස රැගත් හෙලිකොප්ටර් යානය මුලතිව් දෙසට පියාසර කරද්දී අතරමැදි කඳවුරේ කෝන් ගහ අසල වූ උස් බිම් තීරුවට වී කෝප්‍රල් සමරසිංහ ඒ දෙස බලා සිටියේය.

කාලය මිනිත්තු පැය ගනවන්ම ක්‍රමයෙන් ත්‍රිකුණාමලය අතරමැදි කඳවුර වටා අඳුර රජයන්නට විය. මුලතිව් බලා යාමේ අපේක්ෂාවෙන් පෙරදා ඔහු සමග එහි රැඳී සිටි තම හිතමිතුරු සගයන් කිහිපදෙනා ඒ වනවිටත් මුලතිව් බලා ගොස් ඇති බව කෝප්‍රල් සමරසිංහගේ නිසැක තහවුරුවයි. කඳවුරු භූමියේ වූ කෝන්ගහ අසල නිවාඩු අවසන එම දිනයේ පැමිණි තවත් ඒකක සගයින් කිහිපදෙනකුම රැඳී සිටිනු අයුරු ඔහු දුටුවේය. හෙතෙම භටනිවාසය වෙත පිටත්වූයේ හෙට දිනයේ මුලතිව් යාමට නියමිත බැවින් වේලාසනින් නින්දට යාමේ අරමුණෙනි. මුලතිව් ජීවිතය තුල කිසි විටෙකත් සුව නින්දක් ලබාගැනීම උගහට බව ඔහු දනී. කෙසේ වුවද ඔහු එහි වූ භටනිවාසයේ යකඩ ඇඳ මත වැතිරෙද්දී එම රාත්‍රියද මැදියම ඉක්මවා ඇති බව දැනුනේ ඒ වනවිටත් තැන තැන නිදා සිටින සෙසු අය දැකීමෙනි.

"කෝප්‍රල් සමරෙ, සමරෙ ඒයි නැගිටපල්ලා අන්න මුලතිව්වලට ගහනවා"

කිසිවකු වැර යොදා භටනිවාසයේ දොරට ගසන හඬ ඇසී කෝප්‍රල් සමරසිංහ සේම එහි නිදාසිටි පිරිස හිටිවනට තිගැස්සී ඇහැරුණේය. අතරමැදි කඳවුරේ පණිවුඩ හුවමාරු යන්ත්‍ර ක්‍රියාකරු වූ කෝප්‍රල් කුමාරසිංහ එම පණිවුඩය ලබා දුන් සැනින් යලි සංඥා මැදිරිය කරා දිව ගියේය. අනපේක්ෂිතව ලද එම ආරංචියෙන් තුෂ්නිම්භූතවූ පිරිස භටනිවාසය තුල කඩිගුලක් සේ ඇවිස්සී යද්දී කෝප්‍රල් සමරසිංහ අතබැඳි ඔරලෝසුව දෙස බැලීය. එහි අලුයම 3 ලෙස වෙලාව සටහන්ව තිබුණේය. ඔහුද ඒ මොහොතේම වහා සංඥා මැදිරිය කරා දිවයන්නට වූයේ සියල්ල සැකහැර දැනගැනීමේ අටියෙනි. ඒ වනවිටත් මුලතිව් හි සිදුවන කතාබස්වලට සවන් යොමමින් සැලකිය යුතු පිරිසක්. එහි නොඉවසිලිමත්ව සිටිනු පෙනිණ.

මුලතිව් ගැටුම මොහොතින් මොහොත උග්‍රවන සෙයක් ගුවන් විදුලි පණිවුඩ හුවමාරුව ඔස්සේ ඇසෙන කතාබස් වලින් ගම්‍ය විය. එහිදී, සංඥා මැදිරිය තුළ සිටි කිසිවකුට එකිනෙකාගේ මුහුණු බැලීම හැරෙන්නට තම සගයින් වෙනුවෙන් කළහැකි කිසිවක් ඉතිරිව නොතිබිණ. කෝප්‍රල් සමරසිංහගේ සුරත කිටි කිටියේ තද වන්නට විය. අරමුණකින් තොරව ඔහු ඔබමොබ ඇවිදින්නට වූයේ සිහිය විකල් වූවකු මෙනි. තමාගේ අවස්ථාව මගහරවා ස්වෙච්ඡාවෙන්ම මුලතිව් බලාගිය සැරයන් මේජර් හේමසිංහගේ මුහුන ඔහුට මැවී පෙනෙන්නට විය. එය එසේ සිදුනොවුනේ නම්, මේ වනවිටත් තමා මුලතිව් සටනට මැදිව සිටිනවා නොවේදැයි ඔහුට සිහිවිය. තම ඉරණම වෙනස් කළ සැරයන් මේජර්වරයා පිළිබඳ ඔහුගේ සිත තුළ උපන්නේ විස්තර කල නොහැකි තරමේ පසුතැවීමකි. අඳුරේම ඔහු කඳවුර පසෙක වූ කෝන්ගහ සමීපයට ආවේය. හෙතෙම අහස දෙස බැලීය. පෙරදා සවස සැරයන් මේජර් හේමසිංහ ඇතුළු පිරිස රැගත් MI-17 හෙලිකොප්ටරය ගුවන්ගතව මුලතිව් දෙසට නොපෙනී ගිය හඬ යලිත් ඇසෙන්නට විය. ඒ අතරේ අපැහැදිලි රුවක්ද ඔහු ඉදිරියේ මැවී පෙනුණි. හෙතෙම තිගැස්සුණේය. සිය විවාහයේ ප්‍රථම නිවාඩුව අවසන මුලතිව් බලා ගිය කෝප්‍රල් චන්ද්‍රගුප්තගේ රුවද නිවසේ තනිවූ ඔහුගේ අලුතගෙනා මනමාලියගේ සිහින් ඉකිබිඳුමක්ද ඔහුට ඇසි නැසී යන්නට වූයේ සිහිනයකින් මෙනි.

(සැරයන් මේජර් සේමසිංහ ජීවිතය රැකගනීද)

ඉතිරි කොටස ලබන කලාපයට...



සටහන-:
ලුතිනන් කර්නල් සුචිත් චමින්ද එදිරිසිංහ



# ආදරයක් යනු

## ගීතයකට සමාන කවියකට සමාන කවියකි. ඔබ ඔබේ කවියට සවන් දෙන්නෙකු වන්න

**විවාහය** කියන්නෙම මිනිස් ජීවිතයේ නව ඇරඹුමක්. සිංහල රාජ්‍ය සමයද මෙකී ආදර කතා වූ බව අපි අසා ඇත්තෙමු. එක්ටැම්ගෙයක සිර වූ උන්මාද චිත්‍රාගේ කතාවත් එවැන්නකි. ඇය ගැන එතරම් සාක්ෂි ඉතිහාසයේ හමු නොවූ නිසා බොහෝ ඉතිහාසඥයින් පවසන්නේ ඇ ජනශ්‍රැතියක් බවයි. කෙසේ නමුත් සාක්ෂි නොමැති ව වුවත් උන්මාද චිත්‍රා දීඝගාමිණී ප්‍රේම වෘත්තාන්තය තවත් බොහෝ කාලයක් ලක් ඉතිහාසය වර්ණවත් කරනා බව නොරහසකි.

විවාහය හා ආදරය පදනම් වූ මෙම කතාවෙන් උන්මාද චිත්‍රාගේ කතාව ගෙනහැර පාන්නේ ආදරය හා විවාහය යන බැම්ම යක්ෂ ගෝත්‍ර රැකවල්වලින් පවා සිරකර දැමිය නොහැකි. එක්ටැම් විමානෙක වුව සිරගත කළ නොහැකි බැවි පසක් කරයි. සදාකාලික කඳුළ උරුම වූ ආදර කතා අතර උන්මාද චිත්‍රාගේ කතාව පරම වූ ප්‍රේම කතාවක් යැයි කිව හැකිය. ඉතිහාසය ගැන බොහෝ කියැවීම් සොයා යද්දී හිත තදින් අල්ලා බැඳගත් කතාවක් වූ චිත්‍රාගේ කතාව ජීවිතයේ යථාර්ථය සේම අනාගතයට දුන් සිහිකැඳවීම් බොහෝය. එසේ රාජ පෙළපතක උපත ලබා රුවෙන් අග තැන්පත් වූ චිත්‍රා නැකැත්කරුවන්ගේ බස් නිසාවෙන් ගත කළේ දුක් මුසු ළමා වියක් සහ සිහින සිත්හි සඟවා ගත් යොවුන් කාලයක් නම් සාමාන්‍ය පරපුරකින් පවතින අප ජීවිතයට එන බාධා ගැන කවර කතාදැයි මම ඔබෙන් විමසමි. චිත්‍රාගේ කතාවට ඉතිහාසය සාක්ෂි දරයි. ඉන් මට අවධාරණය කළ යුත්තේම ආදරයට විවාහයට ආ සහ එන බාධක අවම නොවන බවයි.

චිත්‍රා උපන් වෙලාවේ දෛවඥයන් අනාවැකි පළ කර ඇත්තේ අනාගතේදී චිත්‍රා ට පුතෙක් ලැබුනොත් ඔහුගෙන් චිත්‍රාගේ සහෝදරයින් මැරුම් කන බවයි. ඒ ගැන අසා කලබල වූ සහෝදරයෝ චිත්‍රා මරා දැමීමට උපක්‍රම යොදන්නට වූහ. දෙමාපියන් සහ ඇයගේ වැඩිමහල් ම සොහොයුරා වූ "අභය" ඇයව මැරීමට අකමැති විය. චිත්‍රාට කිසිම පිරිමියෙක් මුණ නොගැසෙන විදියට ඇයව එක්ටැම් ගෙයක සිරකර තැබීමට අවසන් තීරණය වූයේ චිත්‍රාව ආරක්ෂා කර ගැනීම සඳහාය. සිය කුඩාවිය සේම තරුණ්‍ය එක්ටැම් විමානෙක සිර කොට තැබූ චිත්‍රා සිටි එම එක්ටැම් විමානය මුර කරන්න සේවයේ යෙදවූ "චිත්ත රාජ" සහ "කාලවේල" නම් යක්ෂ ගෝත්‍රිකයින් දෙදෙනකු ගැනද

ඉතිහාසයේ සඳහන්ය.

භද්දකච්චායනා කුමරියගේ සොයුරකු වූ දීඝායු කුමරුගේ පුත් දීඝගාමිණිට තම ඇවැස්ස නැනණ්ඩිය, උන්මාද චිත්‍රාගේ රූපශෝභාව ගැන අසන්නට ලැබී ඇති අතර ඇයව දැකගැනීමේ ආශාවෙන් පසු වූ දීඝ ගාමිණී කුමරු පඬුවස්දෙව් රජු රාජ්‍ය මෙහෙය වූ පඬුවස් නුවරට පැමිණි ඇත. තමන්ගේ ඥාති පුත්‍රයාව ආදරයෙන් පිළිගත් පඬුවස්දෙව් රජු සහ භද්දකච්චායනා රැජින ඔහුට රජවාසලේ රාජකාරි පවරා ඇත්තේ ඔහුගේම ඉල්ලීම මතයි. ඒ අනුව කෙටි කලකින්ම කාගෙත් සිත දිනාගෙන උප රාජ සහ රාජ උපස්ථායක තනතුරේ කටයුතු කිරීමට දීඝ ගාමිණී කුමරුට හැකිවූයේ චිත්‍රාගේ ප්‍රේමය දිනාගත් වනමය. එක්වෑම්ගෙ යට පිවිසි දීඝ ගාමිණී කුමරු, පළමු දැක්මෙන්ම ඇය හා ප්‍රේමයෙන් වෙළුණු බව ඉතිහාසයේ සඳහන්. එක්වෑම් විමානේ සිරකාර චිත්‍රා අයිති කර ගැනීමේ අරමුණින් සිටි දීඝ ගාමිණී දිවි පරදුවට දී ඈ හිමි කරගත්තේය. ඉතිහාසඥයින්ගේ මතය වන්නේ ඇකිළිය හැකි යාන්ත්‍රික පඩිපෙළක් හරහා ගොස් දීඝගාමිණී චිත්‍රා හමුවූ බවයි. ලොවට හොර රහසේ ලියලා වැඩුණ උන්මාද චිත්‍රාගේ ආදර කතාව සැඟවීමට නොහැකි වූ රහසක් වූයේ ඈ ගැබ් ගැනීමෙනි. කුමරිය ගැබ්ගත් පුවත ඇසූ ඇගේ සොයුරන් යළිත් වරක් ඇයව මරණය පත් කිරීමට තැත් කළ බව ද ඉතිහාසයේ සඳහන්. ඒ කෙසේවුව චිත්‍රා සහ දීඝගාමිණී ආදරය පැරදුනේද නැත. එහෙත්, එතරම් කැපකිරීම් කළ බොහෝ වත්මන් ආදර කතාවල අවසන සුන්දර නොවූයේ මක්නිසාදයත් සිතාගත නොහැකිය. ඇතැම්විට ඉවසීම් නොමැතිබව, එකිනෙකා තේරුම් ගැනීමේ ඇති නොහැකියාව, අවිශ්වාසය වැනි හේතු කාරණා වත්මන් සමාජයේ ආදරය කතා අවසන් වූයේ බිරිඳගේ පෙම්වතියගේ හිස කඳින් වෙන් කොට හඳුනා ගැනීමට පවා නොහැකි වූ කවන්ද සිරුරක් පමණක් ඉතිරිකරය.

චිත්‍රාගේ ජීවිතේට පැමිණි අනේකවිධ බාධක අප්‍රමාණය. ඇය දිවි තොර කරගත්තාද? නැත. ඇය සිය කුසින් බිහි කළ දරුවා මරා දැමුවාද? නැත. මාමාවරුන්ගේ විරෝධය දැන සිටි චිත්‍රා කුමරිය තමන්ට ලැබුණු පිරිමි දරුවා ගැහැනු දරුවකු බව අඟවා එදින ම ඇගේ සේවිකාවකට ලැබුණු දියණියට සිය පුත් කුමරු හුවමාරු කර උපායශීලී ලෙස ආරක්ෂා සහිතව කුමාරයා රහසිගතව ඇති දැඩිකර ගැනීමට කටයුතු සලසා ගත්තාය. ඈ අම්මාය. ඒ අම්මාගේ කතා වෘතාන්තය තුළ කීමට වචන නොමැති පාඩම් රැසක් ගැබ්ව ඇති බැවි සිහි ගන්වාලිය යුත්තේ වත්මන් අම්මාවරුන් ජීවිතයේ උගත් පාඩම්වලට එවැනි පාඩම් ද එක් කර ගැනීම අවස්ථානෝචිත බැවි පසක් කරමිනි. ඒ අම්මාගේ කතාව වත්මන් අම්මා වරුනට කියා දෙන්නේම ජීවිතයේ පාඩම නොවේද?

මෙම ඉතිහාස ආදර කතාව සහ ඒ සමාජ වපසරිය ගැන කතාව මෙතැනින් නිමා කරමි. මට අවශ්‍ය වන්නේ විවාහය නම් නව පියවර එසේත් නැතිනම් අප සමාජයේ පිරිමි හෝ කාන්තා යන දෙපාර්ශ්වයටම දෙමාපියන්ගෙන් වෙන්ව ස්වකීය ස්ථාවරයන් මත ජීවිතේ පටන් ගැනීමට ලැබෙන අවස්ථා ගැන කතා කරන්නටය. ඉතින් අපේ යොවන පරම්පරාවට නම් විවාහය කියන්නේ ස්වකීය ස්ථාවරයන් පෝෂණය වුනා හෝ නැතා ක්ෂණිකව තීරණය කළ හැකි දෙයක් .

අප යම් අවස්ථාවක ගත් තීරණ ජීවිතය දෛවෝපගත ලෙස වෙනස් කළ හැටි එසේත් නැතිනම් සාර්ථක කළ හැටි අසා ඇති අපට නුදෙක් විවාහය බැඳි ජීවිතයේ ඔබගත් තීරණ එලෙස සාර්ථකදැයි මෙය කියවන ඔබගෙන් මම අසමි. විවාහය නම් තෘප්ත විය යුතුය. එසේනම්, අප තෝරාගන්නා අප සහයකයා හෝ සහායිකාව සමග තෘප්තිමත්ව සිය පවුල් ජීවිය ගතකළ යුතුය. ඔබ තවමත් ප්‍රමාද නැත. ඔබ ඔබව අධ්‍යනය කරන්න. ඔබ කැමති අකමැති දේ සොයන්න. ඒ විතරක් නොව ඔබ ඔබගේ සහයකයා හෝ සහයිකාව කැමති අකමැති දෑ ගැන සොයන්න. ඔබ දෙදෙනා අද විවාහ වූ බව සිතන්න. එකිනෙකා හා තේරුම් ගනිමින් ජීවත්වන්නට යත්න දරන්න. ඔබ නිරන්තරව විවාහය කෙරේ කලකිරීමෙන් පසු වන්නේ ද නිරන්තර ඔබට ඔබේ සහායකයා හෝ සහකාරිය මානසික හිරිහැරයක් කර නොගන්න. ඔබ ජීවිතයේ අද පැමිණ සිටින දුර ඒමට ඈ හෝ ඔහු කළ කැපකිරීම් සිහියට ගන්න. ඔබ වෙනත් අඹුවක් හෝ වෙනත් අනියම් ඇසුරක සරණක් සොයන්නේ නම් ඔබ අදම ඔබේ ප්‍රිය බිරිඳට හෝ සැමියා ගැන සිතන්න. ජීවිතය දිගු නැත. කෙටි ගමන් යාමට අප බොහෝ විට යොදා ගන්නේ එක් බස් රථයක් බව සිහියට නගාගන්න. බස් රථ කිහිපයක නැග කෙටි දුරක් යාම කෙතරම් හිරිහැරයක්දැයි එසේත් නැතිනම් තේරුම් නැතිදැයි සිතන්න. ජීවිතයද එසේමය. ඔබ තෝරගත් බස්රථය නවීකරණය කොට ගමන් කරන්න. තිරිංග තද නොවන්නේ නම්. ඔබ නිසි ලෙස ක්‍රියා කරන්න. ඔබේ බස්රියට ගොඩවන නන්නාඳුනන අය ගැන විමසිලිමත් වන්න. මක් නිසාදයත් දෛනිකව බස් රථය නතර කරන්නේ ඔබේ ගෙවත්තේම වීම නිසාය. ජීවිතය නැමැති කෙටි දුර ගෙවා ඔබ සදාකාලික නින්ද යන තෙක් ඔබ එක මගක ගමන් කරන්න. ජීවිතය කෙටි මාවතේ ඔබ ඔබේ ජීවන රිය නිසි සේ ධාවනයේ යොදන්නයැයි මා ඔබට කියන්නේ. සිදුවිය හැකි අනතුරු බාල මහලු භේදයකින් තොරව සැම කරා එමට හැකි බැවිනි. ලස්සන අනාගතයක් ගොඩ නගාගෙන යන පවුල පසුබිම්වල ගෙම්දුල නැඩී නොකරන්න. මම ඔබට කියමි. සතුට රැගෙන ඔබ රැකියා ස්ථානයෙන් පිටව ගෙපිලට ගොඩවන්න. ඔබ හැර ඔබ පවුලේ අයට අන් කිසිවකුත් නොවනා වග සිහියට ගන්න.

ප්‍රේමණීය බලාපොරොත්තු කර පින්නාගත් ගැහැණුන් සහ පිරිමින් දවස් පටන් ගන්නේම සිය පවුලේ අභිවෘද්ධියටමය. අවසන් හුස්ම ගිලිහෙන තුරු එකට ඉමුයැයි කියූ බොහෝ අය ගොස් අහවරය. එනම්, ජීවිතයේ අනපෙක්ෂිතව මුහුණ දෙන්ට සිදුවන සිදුවීම් අප කඩා වට්ටනවා වන්ට පුලුවන. ඒත් ඔබ එතැනින් නැගිටිය යුතු බව සිහි තබා ගන්න. යාම් ඊම් ලෝකයේ ධර්මතාවක් බවත් හමුවන සියල්ල හොඳ හෝ නරක නිසි ලෙස පෙරාගත යුතු බවත් මතක තබා ගන්න. ආදරයෙන් ගෙවූ යුග මතක පමණක් වී හෝ නටඹුන් වන්ට ඇත. ඒ කෙසේ වෙතත්, ඔබ ඔබේ ගමන යන්න. විවාහ වූ දෙදෙනෙක්ගේ විවාහය දික්කසාදයකින් අවසන් කිරීමට නොව මතුවටත් එක්ව සතුටින් ජීවත් වන්නට අදිටන් කරගනිමින් ගෙදර ගිනි, බත ඉදෙනා තුරු පමණක් තබා ගන්නේනම් මැනවියැයි පසක් කරමි. ආදරයක් යනු ගීතයකට සමාන අසා විඳිය හැකි කවියකි. ඔබ ඔබේ කවියට සවන් දෙන්නකු වන්න. ඈ ගයනා ගීතයට තාලය වන්න. ඔහු වාරු දෙන තාලයට ඔබ ඔබේ ගීතය ගයන්න.



සටහන :-
සැ/ඕ103810 කෝප්‍රල් චතුරානි එච්ඩබ්සිල්වීජ්
ශ්‍රීලයුපොදුසේබ
ජනමාධ්‍ය හා මීඩියම් අංශ



# හද උණුසුම් කරන වචන

මම දිනක් එක්තරා ශ්‍රේෂ්ඨ ශල්‍ය වෛද්‍යවරයකු ගෙන් ඔහු දොස්තර වරයකු වූයේ කෙසේදැයි ඇසුවෙමි. මම කුඩා කාලයේ දඟකාර හා නපුරු ළමයකු වූ අතර, හැමගේ දෝෂ දර්ශනයට ලක්වුණා. මට ඇනුම් බැනුම් ගුටිබැට ඉවරයක් නැතිව ලැබුණා. මා විභාගයෙන් අසමත්ව පාසලෙන් අස්වන්නට සිටින්ම, අසමත් වූ විෂය පිළිබඳ ගුරුවරයා මට අමතක නොවන දෙයක් කීවා. ඇනුම් බැනුම්, ගුටිබැට හා පහත් කිරීම් මැද සිටි මට මේ කියමන හොඳ හොරණෑවක් වුණා. ඔහු මට කීවේ "මගේ අත්දෙක ඉතාම දක්ෂ ශ්‍රේෂ්ඨ පුද්ගලයකුට අයත්, ශ්‍රේෂ්ඨ වැඩක් කළ හැකි අත් දෙකක් බවයි" යැයි ඔහු කීවේය. ඊට පසු ඔහුට පාසලේ සිටින්නට පුළුවන් විය. ඔහු උපාධිය ලැබූ විට ශල්‍ය වෛද්‍යවරයකු වන්නට සිතීය. "මට ඔහු කියූ අන්තිම වචන දෙක අමතක වන්නේ නෑ" ඔහු කියයි. මා අමාරුවක වැටුනු විට ඔහුගේ වචන සිහිපත් කරනවා.

අගය කිරීම නොයෙක් පිළිවෙලින් වැඩ කරයි. ළඟදී සෙනඟ පිරුණු බසයකට නැගීමට මම පොර කෑවෙමි. බඩුබාහිරාදිය තිබුණි. අපි එකිනෙකාට ඔරවමින් බැණ ගනිමින් බස්රියට රිංගුවෙමු. එහෙත්, බස් රියදුරා විහිලුකාර කාරුණික පුද්ගලයෙක් වූවේය. ඔහුගේ සුම්හිරි කටහඬින් විහිළු කරන්නටත්, "වන් මෝ රිවර් ටු ක්‍රොස්" යන ගීතය ගයන්නටත් වූ අතර, හයියෙන් හඬවතින් සිනාසෙන්නටත් වූයේය.

මේ නිසා බස් රියේ වාතාවරණය වෙනස් විය. ඔරවගෙන සිටි මිනිසුන් සිනාසෙන්නටත් එකිනෙකා කතා කරන්නටත් විය. මුළු බසය සිනාවෙන් පිරුණු අතර, එහි තුළ උත්සවශ්‍රීයක් පැවතිණි.

හැපිරි සොම්නසින් මම බස් රියදුරාගේ නොම්මරය පාඩම් කර ගතිමි. මම ගෙදර ගියවිට බස් රියදුරා ගැන පහන් සිතින් 3941 දරණ නොම්මරය ගැන වර්ණනා කරමින් බස් කොම්පැනියට ලියුමක් ලිවෙමි. ඔහු මිනිසුන් මනාව හැසිරූ ආකාරය ගැනත්, ඔහුට උසස්කමක් දියයුතු බවත් ලිවෙමි. ඊට පසුව බස් කොම්පැනියේ සභාපතිතුමාගෙ න් රියදුරු සංගමයේ සභාපතිගෙ න් හා නගරයේ බස් සේවා පිළිබඳ ඇටර්නි වරයාගෙන් ධෛර්යයට තුඩුදෙන පිළිතුරු මට ලැබිණ. මගේ ප්‍රසංසනාත්මක ලිපිය රියදුරාට දැක්වූ බවත්, එය ඔහුගේ වාර්තා පොතට ඇතුලත් කළ බවත් ලියා තිබුණි. තවද, ඔවුන්ගේ බස් සේවය පිළිබඳව සැහීමකට පත්වූ මගියකු වීම ගැන මට හද තුළින් නැගෙන කෘතඥතාවය පළකර තිබිණ.

මේ අගය කිරීම පිළිබඳ හොඳම වේදිකාව, හොඳම ස්ථානය නම් පවුලයි. දිනපතා මහන්සි වන පවුල් ජීවිතයේදී කරන වැරදි මහ විශාල කොට සලකා යහගුණයන්ට ප්‍රශංසා කිරීම අමතක කර තිබීම ඥානාන්විත නොවේ. එහෙත් දරුවන්ට මෙවැනි අගය කිරීම් හා ප්‍රශංසා කිරීම් දෙමව්පියන් විසින් කළ යුතුම දෙයක් බවත් එයින් වටිනා ප්‍රතිඵල නෙලාගත හැකි බවත් දැනගත යුතුය. මට එක තරුණ බිරියකගේ කතාවක් මතකය. එක් උදෑසනක් තමන්ගේ ගෙදර රාජකාරී අවුල් විණි. ස්වාමිපුරුෂයාට කමිසයේ බොත්තම සොයා ගන්නට බැරි විය.

ඊට පසු උදේ ආහාරයක් ගැන පැහැදීමක් ඔහුට තිබුණේ නැත. කිරි ජෝගුව බීම ඉහිරිණි. දරුවන්ට පාසල් බසය අතපසු විණි. කොටින්ම කියතොත් මේ ගෙදර එදා මහ කෝලාහලයක සිරි ගති.

ස්වාමිපුරුෂයා දොර තල්ලු කර දැමූ විට එය නැවත විත් ඔහුගේ හිසෙහි වැදිණි. කේන්තියෙන් ඇයට "ඔබ මාව කසාද බැන්දේ කුමටදැයි" ඇසීය. උත්තරය ඉබේම කටට ආවේය. "ඔබ රිවස් බටින් වගේ හින්ද" කියා ඈ කෑ ගැසුවාය. කේන්තියෙන් ඈ දොර වැසූ අතර, ශෝකයේ කලු වලාවන් ඇගේ මුහුනෙහි සටහන් විය. ඈ ඔහු හා විවාහ වී ඇත්තේ ඔහු රිවස් බටින් වගේ පෙනුන නිසයි. ඈ ශෝකයෙන් සිටින විට ටෙලිෆෝනය නාද විය.

"ඔබ දන්නවාද මම ඔබට ආදරය කළේ මොකටද කියා" ඔහු විනෝදජනක මුහුණුවරකින් ඇසීය. "මට හිතන්න බෑ" ඈ පිළිතුරු දුන්නාය. "ඔබගේ නිවැරදි විනිශ්චය හා උසස් රසවින්දනය නිසා" යි ඔහු කීය. "ඔබගේ කලාත්මක ඇස ගැන නොකිව මනාය"

මනෝහර සඟරාව ඇසුරිනි..



# සෙබළ සිතුවිලි

## ආදරණීය වැස්ස...

ගත දවන හිරිකඩ මතින්
ජීවිතේ සුන්දර දසුන් මවන
ආදරණීය වැස්ස...

නුඹ ආවද යළිත්
සිතුවිලි දිගේ ඇවිදන් යන්න
උණුසුම් තේ කෝප්පයක
මිහිරක් එක්ක
නුඹේ සීතල දැනෙනකොට
ඉවසම් මං
කවුළුවෙන් ළඟට වත්...

නුඹ දිහා බලන්
කල්පනාවක වැටුණ සිත
කොතරම් දුරක් ගියාද
මතකයන් මැදින්...

ස්තූතියි රැඳුනාට මොහොතක්
ආදරණීය මතකයන් ළඟින්
ඉතින් ආදරණීය වැස්ස
සමුදෙන්න අවසරයි
අතරමන් හිත් කොනෙන්...

සෙ/288357
සංසෙ (කා) රූපරත්න එච්ඩීඩීවස්

## ඔබ...

ඔබේ ජීවිතය
අඳුරු කළ හැක්කේ
ඔබ වෙන අයකුගෙන් අලෝකය
ලබන විටයි
ඔබේ ජීවිතේ අලෝකය
ඔබම වෙන්න
එවිට කිසිවකුටත්
ඔබේ ජීවිතය අඳුරු කළ
නොහැකියි...

සෙ/කිව100871
ලා/කෝ සමන් කුමාර ජීජී
14 ශ්‍රීලංපාආබමු

## අම්මා...

මට අමතක
ඔබට පමණක් මතක ඒ දින
ඔබ මා දුටු පළමු දිනයි
ඔබ දැනගත් විට දැනුණා සතුට
මහ මෙරක්ලු
මහ හඩියෙන් අඬනා විට
තුරුලට ගෙන පෙර දා මෙන්
අදත් සැනසුවේ නුඹයි

සෙ/එෆ්108338
පාසෙ දිල්ශාන් ඕඩබ්ලිවඩීවස්
3(සෙව්) ගැහේබ

## අපි ආ මඟ...

සුව යහනින් බැස කුමරෙකු
රජ බොජුනකි වලඳන්නේ
රසද බලනවද කුමරුනි
නුඹ ගැන සිත වැළපෙන්නේ
නෙතග කඳුළු කැට තෙරපෙයි
හදින් නැගෙන මැසිවිල්ලේ
මිනිසුනි මේ අපේ ලොවද
මනුස්සකම හිනැහෙන්නේ
පාට පාට හීන ලෝක
හදවත ගැඹුරින්ම ලියා
ගාට ගාට නුඹ යන හැටි
දෙනෙතට කඳුලකුත් උනා
ආදරයට සඳ එළියට
කවි ගී පද ලියුව මෙමා
සියක් වරක් හැරී බැලුවෙ
අපි ආ මඟ හරිද කියා

මේජර් ගිහාන් හේවානායක
ප්‍රමානි 11 මව්මෙ
ආසේමු (වන්නි)

## ජීවිතේ...

සුළඟට පාවෙවී
එක් තැනක තාවකාලිකව නවතිනවා
හරියට දිය බුබුලක් වගේ
ඒ ජීවිතේ එච්ච හැලහැප්පීම් මත
ගෙවිලා යනවා
හරියට හිස් වුණු සාක්කුවක්
කැඩුණු හදවතක් වගේ
දාලා ගිය මිනිස්සුයි
අපහාස කරපු මිනිස්සුයි
හිනාවෙච්ච යාළුවොයි
ජීවිතේට අමුතු පාඩමක් කියාදුන්නා
ඒත් එක්කම මේ ජීවිතේට සමුදීලා
අපි නැවත සුළඟේ පාවෙවී
තවත් හොඳ තැනක් අල්ලා ගන්න
උත්සාහ කරනවා...

සෙ/725781
ලා/කෝ රාජපක්ෂ ආර්එම්අයිවන්
7 ශ්‍රීලයුකාබ

## වරමක් නොලද කුමරිය...

පරයන මනස දැක රුව හින්දා
කතියන වදන් පපුවේ රන්දා
පානා සිනහව නිහඬයි හිත බින්දා
වරමක් නොලද කුමරියකට පෙම් බැන්දා

පාළුව තනිකමින් පන්සලේ සිල් රැක්කා
සුකුමල සිරියාවයි පන්සිල් බින්දා
බුදු බණ පිවිතුරුයි බුදු හිමි වැන්දා
සිලය බිඳිය නොහැකිය රූපය හින්දා

ආකාසේ පිපෙනා ඉරබටු තරුව වගේ
එළියයි විහිදෙනා රන්වන් සිරුර ඇගේ
කළුබයි රුව කෙස් කළඹ නුඹේ
දනිම් නොලැබෙනා බව දොළොස් මහේ

සෙ/පී100537
පුසෙ තරිඳු ලක්මාල් යූ

## පෙම් හීන...

කෝපි මල් සිනාවක් පුරෝගෙන මුව පුරා
නුඹ ඇවිත් ලැගුම්ගත් මගෙ මියුරු හිත පුරා
අල්පෙනෙති තුඩු වැදී රිදුම් දෙන ලේ නහර
කෑ ගසා කියනු ඇත පෙම් කරපු තරම මම
ගියත් නුඹ ඒ හවස මුළු හිතම ගිනිතියා
යලිදු එක වතාවක් බලා ගන්නෙම් කියා
යසිරු වෙරළේ තවත් බලා හිඳිනෙම් කියා
නිල් නුවන් රත් කරන් නෝක්කාඩු බස් කියා...

සෙ/781381
සාසෙ බංඩාර බීඑච්සී
2 සබුබ

## ජීවිතය...

වැටහීමට අසීරු පදැති
නේකවිද රිද්මයට
ගැයෙන කවියකි
ජීවිතය...

සෙ/380001
ලා/කෝ විතාන ඩබ්ලිවඩබ්ලිවබීආර්

## නිවසේ සිටින බිරිඳට කිවයුතුයි මා මෙලෙසේ...

සංසාරේ පුරාවට ආවේ පුන්සඳ ඔබ මා පතාද
භවෙන් භවේ ආවේ දුක් දොම්නස් වඳින්නද
පාරමී පුරා සංසාරේ කෙලවර කොතකින් දකින්ද
හැම භවයකම රැක ගන්නම් ඔබමයි මගෙ බිරිඳ

අප එක්ව පා තැබුවා විසිහතර වන වියට
ඔබගෙන් දුරස් වී විසිතුන් වසරක් වුවා යුද බිමට
ආයෙත් ඔබගේ ළඟ ළදරුවකු මෙන් දැවටෙන්න මට
මාස තුනක් ඉතිරිව ඇත කඳවුර තුළ සැරි සරන්නට

පෙරදා වින්දා වාගේ නොමනා දුක් ගැහැට විඳන්
පුතයි දුවයි රකිනු මැනවි ඔබගේ දෙනෙත් ලෙසින්
සලකයි ඔබට එම දෙපලගෙ දෙනෙත් යොමන්
එන්නම් සරසන්නට ඔබ ළඟ තව තුන් මසක් ගෙවන්

සෙ/14කිුු01361
කෝප්‍රල් බණ්ඩාර අයිබීඑස්ඒ
14(සේවා) ශ්‍රීලංජාආබමු

## සුන්දර මිනිසා...

යුද්දෙටත් නුඹ, ගං වතුරටත් නුඹ,
නායටත් නුඹ, වැස්සටත් නුඹ, සෑම ආපදාවකටම නුඹ
නුඹත් මිනිසෙකි ලේ මස් ඇට නහරින් සෑදී
නුඹේ කියන සියලු බැඳීම් පසෙකලා
රට වෙනුවෙන් වෙහෙසෙන අපූරුව
හතවත දැවෙන දැක්කම සමහර දසුන්
මිලකළ හැකිද පඩි පතට නුඹේ සේවය
නිල අඳුමින් වැසී සිටින
සුන්දර හදවතක් ඇති අපූර්ව මිනිසා නුඹයි
හදවතේ උපහාරය ත්‍රිවිධ රත්නයේ රැකවරණයයි නුඹට

සෙ/530262
ලා/කෝ ඉලංගසිංහ යූපීආර්
22 විපාරෙ

## පෙම් හීන...

වචනවලට පෙරලෙන්නැති
සමහර සිතුවිලි එක්ක
නුඹත් ඉන්නවා දැයි හැඟෙනවා මට නිති
නුහුරු පවන ඇයි මෙතරම්
මා හට වුණේ ගැති
උඩු සුළඟට පවා යන්න
මට අවසර නැති...

සෙ/578992
සැරයන් ජයසූරිය ඩබ්ලිව්පීකේආර්
8 ශ්‍රීලයුසේබ

## අප්පච්චී...

කලා වැවට උඩින් දිනිඳු නැගෙන්නට කලින්
පිණි පලස පුරා දෙපා තබා
කුඹුරට ඇදෙනා අප්පච්චි
හිල්ල පිරුණු කෙත ළඟ හිඳ
බවුන් වඩවන අප්පච්චි...

වැහි ඇල්ලක්වත් නැති
අහසට සාප නොකරනා
දහදියෙන් පුරවනා
අප කුසද පුරවනා අප්පච්චි
මතු බුදු වෙන්නට
පෙරුම් පුරනවද අප්පච්චි

එක තරුවක්වත් නැති
අහසක අඳුරු බිඳිමිනා
උඩ මලුවේ පුන් සඳ විලස දිලී
මගේ ලොව සරසනා අප්පච්චි
ඔබ බුදු වෙනවා මගේ අප්පච්චි

සෙ/369738
කෝප්‍රල් දිල්ශාන්ත ඩබ්ලිව්එම්යූ ආර්එස්පී

## විශ්වාසය...

ඕනෑම දෙයක් අහිමි වන්නට පෙර
රැක ගන්නට උත්සාහ කරන්න
ලැබිය යුතු වටිනාකම
ලෝභ නැතුව දෙන්න
හිමිව සිටින කළ
නොලැබෙන පැසසුම් අහිමි වූ පසුව
ඕනෑවට වඩා ලැබුණත්
වලක් නැත...

සෙ/488786
පාසෙ දිසානායක ඩීඑම්ඩබ්ලිව්පීසී
16 ගරෙ

## පතිවත...

අනෝරා මහ වැස්ස වී නුඹ
වහින්න ඇති යැයි සිතන්නම්
පොළව වී මම දරාගන්නම්
වැස්ස නුඹව ඇති තරමට
සිරිපාදෙ කන්ද මුදුනේ
මා එහි පාවෙන ඔරුවක්
සිරිපතුලේ ගල නුඹ වෙයන්
හිස ගසා වන්දනා කරනා
වන්දනාකරු වෙමිය මං
සඳක් නොව අමාවක වී
ලොවම අඳුරෙ ගිල්වපන්
එකම පහසක් මුව නොදල්වා
කලුවරට ගුලිවෙමිය මං
මටම හිමිනොවී අන් සතුව
සෙනේ දම් පිරුවත් සිහින්
සිල් නොබිඳම් කරම් සිහිපත්
මගේ පෙම් මහමෙර තරම්...

සෙ/526151
කෝප්‍රල් චමින්ද කුමාර ජේ

## කාලය සහ කර්මය...

කුරුල්ලකු ජීවත්ව සිටින විට
උෟ කුහුඹුවන් අනුභව කරයි
කුරුල්ලකු මියගිය විට
කුහුඹුවන් කුරුල්ලාව අනුභව කරයි

එක් ගසකින් ගිණිකූරු
මිලියන ගණනක් සෑදිය හැකිය
නමුත්, එක් ගිනිකූරකින්
ගස් මිලියන ගණනක්
විනාශ කළ හැකිය

කිසිවෙකුව කිසිවටක
අවතක්සේරු නොකරන්න
එක් මොහොතකින්
සියල්ල වෙනස්වී යා හැකිය
ඔබ අද ප්‍රබල විය හැකිය
නමුත්, කාලය
අප හැමට වඩා ප්‍රබලය

සෙ/248594
ලා/කෝ බංඩාර
එච්එම්ටීඑස්
12 කාඉරෙ ශ්‍රීලංඉ


## තනිකඩ සෙවළ හිත...

මඟබලා සිටි දිනය උදාවන්නට
ඇත දින දෙක තුනක්
බලා ඉන්නට
මඟබලා සිටි දිනය
මාව පසුකරන විට
පුළා දින තිහක්
ගෙවා ඇත කඳවුරට
නිවාඩුව යන වචනෙ
හඬ නෑසෙ කිසිම විට
තවම තනිකඩ අපිට
නැතිලූ ප්‍රශ්න කිසිම වට

සෙ/53199
සාසෙ ප්‍රියන්ත ඩබ්ලිව්එස්එම්ඒ
14 විපාරෙ

# කෙළිබිමේ

## පෑ විරු හපන්කම්



# ක්ලිෆර්ඩ් කුසලාන බොක්සිං තරඟාවලියේදී වැඩි දස්කම් යුද්ධ හමුදාවෙන්





ශ්‍රී ලංකා බොක්සිං සංගමය වෙතින් සංවිධානය කරනු ලැබූ 2023 ක්ලිෆර්ඩ් කුසලාන බොක්සිං තරඟාවලිය ඉකුත් නොවැම්බර් මස 13 සිට 17 දින දක්වා රාජකීය විද්‍යාලයීය කායවර්ධන ශාලාවේදී පැවති අතර, එම තරඟාවලිය සඳහා සහභාගී වූ යුද්ධ හමුදා ක්‍රීඩකයින් සුවිශේෂී කුසලතා දක්වමින් රන් පදක්කම් 10 ක්, රිදී පදක්කම් 5 ක් සහ ලෝකඩ පදක්කම් 10 ක් දිනාගැනීමට සමත්වූහ. මෙහිදී, දිවයින පුරා බොක්සිං කණ්ඩායම් 17 ක් නියෝජනය කරමින් මෙම තරඟාවලියේදී ක්‍රීඩකයින් 116 දෙනෙක් සහ ක්‍රීඩිකාවන් 45 දෙනෙක් එක් එක් බර කාණ්ඩ යටතේ තරඟවැදුණි.

තරඟාවලියේදී රන් පදක්කම් 4 ක්, රිදී පදක්කම් 4 ක් සහ ලෝකඩ පදක්කමක් දිනාගැනීමට යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩිකාවෝ සමත්වූහ. ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ ලාන්ස් බොම්බාඩියර් ජයවර්ධන එච්එම්එල්පී "තරඟාවලියේ හොඳම බොක්සිං ක්‍රීඩකයා" වශයෙන් තේරීපත්විය.

# *Eagl's Cup* අත්පන්දු ශූරතාවලියේ' අනුශූරතාවය යුද්ධ හමුදාවට






ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සංවිධානය කරන ලද "*Eagle's Cup* අත්පන්දු ශූරතාවලිය" දිවයින පුරා පිරිමි සහ කාන්තා කණ්ඩායම් 12 ක සහභාගීත්වයෙන් ඉකුත් නොවැම්බර් මස 6 සිට 9 දින දක්වා ජාතික තරුණ සේවා සහා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. ශ්‍රී ලංකා නාවික හමුදා පිරිමි අත්පන්දු කණ්ඩායම සමග පැවති තරගයෙන් යුද හමුදා පිරිමි අත්පන්දු කණ්ඩායම අනුශූරතාව දිනාගනිද්දී, ශ්‍රී ලංකා ගුවන් හමුදා කාන්තා අත්පන්දු කණ්ඩායමට එරෙහිව පැවැති තියුණු තරගයකින් අනතුරුව යුද හමුදා කාන්තා අත්පන්දු කණ්ඩායම එහි අනුශූරතාවද දිනාගැනීමට සමත්විය.

# 553 වන පාබල බලසේනාවට නව බලලත් නිලධාරී හා සැරයන් නිවස්නයක්



553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීඑස්කේ පෙරේරා ආර්එස්පී ගේ මගපෙන්වීම යටතේ එම පාබල බලසේනාවේ භටපිරිස් විසින් බලසේනා මූලස්ථානයේ ඉදිකරන ලද නව බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නය 55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී එන්ඩීසී ගේ සුරතින් ඉකුත් ඔක්තෝබර් 14 වන දින විවෘත කරන ලදී. මෙම අවස්ථාවට සමගාමීව එම බලසේනා මූලස්ථානයේ මෙහෙයුම් හා පරිපාලන අංශයන්හි පුහුණු ක්‍රමවේද වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව නව දේශන ශාලාවක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමද සිදුකෙරිණ.

# එළිමහන් රංගපීඨය විවෘත කෙරේ







2(සේව) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා සෙනින්ගේ කුසලතා එළිදැක්වීම සඳහා එම ඒකක අණදෙන නිලධාරී මේජර් පීඩීඑස්එන් ගුණරත්න ගේ පූර්ණ අධීක්ෂණය යටතේ එළිමහන් රංගපීඨයක් නිර්මාණය කරන ලදී. එහි විවෘත කිරීමේ උත්සවය ඉකුත් නොවැම්බර් 09 වන දින පැවැත්වූ අතර, එහිදී ඒකක සෙබල සෙබළියන්ගේ නර්තන, ගායන සහ රංගන කුසලතාවයන් එළිදැක්වීමක්ද සිදුකෙරිණ.


# රණවිරුවා





**අධීක්ෂණය**

අධ්‍යක්ෂ ජෙනරාල්
අයිඩබ්ලිව්එම්ආරාක් හේරත්
යූඑස්පී එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ටීපීඑන් ද සා
ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහාය සංස්කාරක**

කපිතාන්
එච්ඩබ්ලිව්ලූ ලක්මිණා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 ඔනි II සේනාරත්න ජීසී 3 ඉංජිනේරු
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉංජිනේරු

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

රණවිරුවා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර.

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445/51446

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# ශ්‍රී ලංකා සංඥා බලකා ඉතිහාසය
# එක් සෙවණකට

ශ්‍රී ලංකා සංඥා බලකායෙහි ඉතිහාස තොරතුරු එක්කොට තැනූ කෞතුකාගාරය සහ පුස්තකාල සංකීර්ණය "Lt Col DV Brohier අභිප්‍රේරණ මධ්‍යස්ථානය" නමින් පසුගිය ඔක්තෝබර් 15 වන දින විවෘත කෙරිණ. ශ්‍රී ලංකා සංඥා බලකායේ 80 වන සංවත්සරයට සමගාමීව විවෘත කෙරුණු මෙම කෞතුකාගාරය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති වන මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩියු ගේ අදහසකට අනුව ක්‍රියාවට නැංවිණ. සංඥා බලකායේ ජ්‍යෙෂ්ඨතම විශ්‍රාමික සංඥා නිලධාරී බ්‍රිගේඩියර් එෆ්ජේ ද සිල්වා (විශ්‍රාමික) යූඑස්පී ගේ සුරතින් විවෘත කෙරුණු එහි අතීතයේදී සංඥාකරුවන් විසින් භාවිතා කරන ලද පැරණි තාක්ෂණික උපකරණ සහ තාක්ෂණික පරිණාමය පිලිබඳ අතිශය දුලභ තොරතුරු රැසක් ඇතුලත්ය. එසේම, එය වසර 80 ක අභිමානවත් කාලය තුළ එම බලකාය සිදුකරන ලද කැපකිරීම් සිහිපත් කරනු ලබන විවිධ අවස්ථාවන් හඳුන්වාදීම සහ සංඥා බලකාය පිලිබඳ පුළුල් ඓතිහාසික දර්ශනයක් අධ්‍යයනය කිරීමට හැකි කදිම අවස්ථාවක් ලබාදීමකි.







වර්තමාන කාලයට උචිත ලෙස නවීන කෞතුකාගාරයකට තිබිය යුතු සෑම අංගයකින්ම මෙම අභිප්‍රේරණ මධ්‍යස්ථානය සමන්විත වේ. බිම් මහලේ ස්ථාපිත කර ඇති මැදිරි දෙක අංගසම්පූර්ණ පුස්තකාලයක් සහ නවීන සුහුරු පන්ති කාමරයක් සඳහා වෙන් කර ඇති අතර, පළමු මහල ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් මේ දක්වා භාවිතා කරන ලද සියලුම ආකාරයේ සන්නිවේදන තාක්ෂණයන්හි කිතුසිතුවම්, ආකෘති, ලී නිර්මාණ සහ අනුරූ ප්‍රදර්ශනය සඳහා වන මැදිරි සහ සංඥා බලකායේ සුවිශේෂී අවස්ථාවන් හා සේනාංකයේ අභිමානවත් ජයග්‍රහණ විදහා දැක්වෙන අද්විතීය පැරණි ඡායාරූප එකතුවකින් ද සමන්විත වේ. තවද, මෙහි ස්ථාපිත පුස්තකාලය නවීන තාක්ෂණයට අනුකූලව නිර්මාණය කර ඇති අතර, සංඥා බලකායේ සේවයේ නියුතු සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්/නිලධාරිනියන් සහ සෙසු නිලයින් විසින් පරිත්‍යාග කරන ලද පොත් 2000ක් පමණ මෙහි අඩංගු වේ. එසේම, එය හමුදා සන්නිවේදන ක්ෂේත්‍රයේ උපාධි අපේක්ෂකයින්, අභ්‍යාසලාභීන්, විශ්ව විද්‍යාල සිසුන්, ඉතිහාසඥයින් සහ පර්යේෂකයන් සඳහා වටිනා තොරතුරු රැසක් ඒකරාශි කරගත හැකි මධ්‍යස්ථානයකි.

මෙහි ඉදිකිරීම සාර්ථක කරගැනීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන් සෙසුනිලයින් මෙන්ම විවිධ අයුරින් උපකාර කළ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සංඥා බලකායේ සේවයේ නියුතු සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින්, සංඥා සේවා වනිතා ශාඛාවේ වත්මන් සභාපතිනිය සහ හිටපු සභාපතිනියන් ඇතුළු විශාල පිරිසක් මෙම "Lt Col DV Brohier අභිප්‍රේරණ මධ්‍යස්ථානය" විවෘත කිරීමට එක්ව සිටියහ.

රණබිමේ මතක

# හොඳම තැන් අනුන්ට දී අමාරු තැන් සොයා යාම

බඩු භාණ්ඩ පටවගෙන එහෙමෙහෙ යන එක සිවිල් ජීවිතයේ බොහෝ විට කෙරෙන දෙයක්. අලුත් භූමියකට, අලුත් නිවහනකට එහෙම නැත්නම් විනෝද ගමනක් වන්දනාවක් හරි යනව. සමස්තයක් හැටියට ඒ හැම ගමනකදීම සිද්ධ වෙන්නෙ ඉන්න තැනට වඩා හොඳ තැනකට ලස්සන තැනකට යන එක.

යුද භූමියෙත් එහෙමයි. බඩු භාණ්ඩ පටවගෙන නිතරම තැනින් තැනට යනව. හැබැයි එතන ලොකු වෙනසක් තිබුනා. රණවිරුවෝ ගියේ හොඳම තැන් අනුන්ට දීලා අමාරුම තැන් සොයාගෙනයි. පියවරෙන් පියවර, දවසින් දවස ඔවුන් ගිය ඒ දුෂ්කර ගමන නිමවුනෙ අවසන් විජයග්‍රහණය ලැබුවට පස්සෙයි.

